
# චිත්‍ර කලාව

## 9 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

(2018 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# චිත්‍ර කලාව

## ගුරු මාර්ගෝපදේශය

## 9 ශ්‍රේණිය

**(2018 සිට ක්‍රියාත්මක වේ.)**

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
info@ni.lk

**චිත්‍ර කලාව**

**9 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2017**

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

*මුද්‍රණය* : ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රිය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද, සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව, ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# හැඳින්වීම

ජාතික අධ්‍යාපන ආයතනය දේශයේ සමස්ත දරු කැළ වෙනුවෙන් පාසල් පද්ධතිය වෙත 2015 සිට නිර්දේශ කරන ලද නව විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි සිවුවන පියවර 2018හි ක්‍රියාවට නැංවේ. ඒ අනුව මෙම වසරේ 9 ශ්‍රේණිය සඳහා වූ නව විෂය නිර්දේශ නව්‍යකරණයන් සහිත ව හඳුන්වා දෙමින්, එහි ක්‍රියාත්මක භූමිකාව රඟන ගුරුවරයාට නිසි මඟපෙන්වීම් ලබා දීම පිණිස මෙම ගුරු මාර්ගෝදේශය සකස් කොට ඇත.

විෂයමාලා ප්‍රතිපත්තිය අනුව වසර 8කට වරක් එළැඹෙන මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය විසින් ජාතික අධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා පාසල් පද්ධතියට ඒ ඒ විෂයයන් සඳහා නව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ශිල්ප, සංකල්ප හඳුන්වා දෙනු ලබන අතර, සෞන්දර්ය විෂයයන්හි මෙතෙක් නිර්දේශිත ගී, කවි, කතා, සංස්කෘතිකමය කරුණු, තේමා, සම්ප්‍රදායයන්හි විවිධත්ව, ඈ සම කාලීන අවශ්‍යතා මත නව දේශීය දර්ශනයට අනුකූල ව අනාගතයට ගැළපෙන පරිදි ඉදිරිපත් කර ඇත.

අප විසින් විෂයමාලා සැලසුම්කරණයේ දී පළමුකොට ම හඳුනා ගන්නා ලද 6-13 දක්වා පුළුල් වූ විෂය සන්ධාරය (Curriculum Grid) නිපුණතා හා නිපුණතා මට්ටම් ලෙස දරුවාගේ වර්ධන හා චින්තන අවධීන්ට අනුව ක්‍රමික ව පෙළගස්වා ඇත. ඒ අනුව 6, 7, 8, 10 හා 11 ශ්‍රේණි සඳහා නිර්දේශිත විෂය කරුණු සමඟ අවියෝජනීය සබඳතාවක් මෙන් ම ක්‍රමික වර්ධනයක් සිදු වන පරිදි 9 ශ්‍රේණියවිෂය නිර්දේශ සැලසුම් කොට ඊට අනුකූල ව මෙම ගුරු මාර්ගෝපදේශය රචනා කොට ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය හරහා විෂය නිර්දේශයන්හි නාමික ව දක්වා ඇති විෂය කරුණුවල සීමා නිර්ණයන් නිවැරැදි ව තෝරා බේරා ගැනීම, දරුවා තුළ සංකල්ප සාධනයෙහි ලා විෂය කරුණු ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ හඳුනා ගැනීම, පාඩම දරුවාට පිළිගැන්වීමෙහි ලා යෝජිත සුවිශේෂ ක්‍රම ශිල්ප හඳුනා ගැනීම යන ශක්‍යතා ප්‍රමාණාත්මක ව ගුරු ඔබ වෙත ලැබෙනු ඇත.

අප විෂයමාලා කමිටුව විසින් රචිත මෙම පොත පරිහරණය කරමින් ඔබ, විෂයය කරුණුවල අවශ්‍ය මූලික දැනුම අත්පත් කර ගත්ත ද, යෝජිත විෂය කරුණුවල සමාජ භාවිතාව පිළිබඳ ඔබගේ අවදිමත් භාවය වැදගත් ය. ඒ සඳහා විෂය භේදයකින් තොර ව සංගීත කෘතිවලට සවන්දීම, නර්තන, නාට්‍ය ප්‍රසංග හා චිත්‍රපට නැරඹීම, චිත්‍ර ප්‍රදර්ශන නැරඹීම ආදිය ඉතා හොඳ ප්‍රබෝධමත් බවක් හා පෙළඹවීමක් ඔබ තුළ ජනිත කරනු ඇත.

ඒ අනුව ගුරු මාර්ගෝපදේශය ද, උදව් අත්පොත ද ඒවායේ ඇතුළත් පණිවුඩ, හැඳින්වීම් ඇතුළු සියල්ල සහිත ව පූර්ණ වශයෙන් ම කියවන්න. ඉන් ගුරුවරයකු ලෙස ඔබ සතු විය යුතු අත්‍යවශ්‍ය ගුණයක් වූ ''කියවීමේ පුරුද්ද'' ඔබට ලැබ ගන්නට හැකි වනු ඇත.

මේ සියලු ව්‍යායාමයන්හි, කර්තව්‍යයන්හි අග්‍ර ඵලය අපගේ දරු පරපුර වෙත ලබා දෙන්නට ඔබගේ ගුරු භූමිකාව ශක්තිමත් වේවා! යන්න මාගේ ඒකායන පැතුමයි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය),
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **අධීක්ෂණය** | : | එස්. වර්ණසිංහ මයා -අධ්‍යක්ෂ (වැ.ආ) |
| **විෂය සම්බන්ධීකරණය** | : | එම්.ජී.ඒ.කේ.යූ.බණ්ඩාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| | : | ඥානසිරි බී.ගමගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**විෂය විශේෂඥ උපදෙස්**

| | | |
|---|---|---|
| මහාචාර්ය රම්‍යවර්ධන පොඩිනිලමේ | : | මහාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයය |
| මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ | : | මහාචාර්ය(විශ්‍රාමික), සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයය |
| ආචාර්ය ටී. සනාතනන් | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලයය |

**ලේඛක මණ්ඩලය**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| එම්. ජී. ඒ. කේ. යූ. බණ්ඩාර මයා | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| ඥානසිරි බී. ගමගේ මයා | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| රවීන්ද්‍ර තේනුවර මයා | : | කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| චමරි තපස්වරගේ මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| මනෝරා ප්‍රේමතිලක මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**බාහිර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| ශ්‍රීමති ඒකනායක මිය | : | කථිකාචාර්ය (බාහිර), කැලණිය විශ්වවිද්‍යාලයය |
| එල්. එස්. වේහැල්ල මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලයය, කොළඹ |
| එම්. ඉලමුරුගන් මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලයය, වලිහාමම් |
| එච්. ඒ. සංජීවි මංජරී මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලයය, කොළඹ |
| එම්. ආර්. ජෙබරාජා මිය | : | චිත්‍ර කලා ආචාර්ය, හින්දුකාන්තා විද්‍යාලය, යාපනය |
| එස්. මනෝහරන් මයා | : | චිත්‍ර කලා ආචාර්ය, විපුලානන්ද විද්‍යාලය, වුවුනියාව |
| එච්. එම්. එස්. පි. එච්. බණ්ඩාර මයා | : | චිත්‍ර කලා ආචාර්ය, ශාන්ත සිල්වෙස්තර විද්‍යාලයය, මහනුවර |
| දිප්ත ශ්‍රී උදයංග මයා | : | චිත්‍රකලා ආචාර්ය, මොණරාගල රාජකීය විද්‍යාලයය, මොණරාගල |
| සම්පත් සුරංග කෝරලේගේ මයා | : | චිත්‍ර කලා ආචාර්ය, බප/හෝ/ජල්තර ම.වි, හෝමාගම |

| | | |
|---|---|---|
| **භාෂා සංස්කරණය** | : | ශ්‍රීනාත් ගණේවත්ත මයා, භාෂා සංස්කාරක |
| **පිටකවර නිර්මාණය** | : | රවීන්ද්‍ර තේනුවර මයා, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **පරිගණක යතුරු ලියනය** | : | මනෝරා ප්‍රේමතිලක මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **විවිධ සහාය** | : | දීපා ශිරෝමණි මෙය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා.<br>ප්‍රේමරත්න පෙරේරා මයා සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මෙම ගුරු මාර්ගෝපදේශය, වර්ෂ 2018 සිට ක්‍රියාත්මක කිරීමට නියමිත චිත්‍ර කලාව 9 ශ්‍රේණිය විෂය නිර්දේශය පදනම් කරගෙන සම්පාදනය කර ඇත. පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මෙය ඔබ අතට පත් කෙරේ. මෙම පොත පරිශීලනයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව ඔබගේ විශේෂ අවධානය යොමු කරන්න.

- පාසලේ වාර්ෂික වැඩ සැලසුමට අනුකූල වන සේ කාලය කළමනාකරණය කරගන්න.

- ප්‍රධාන නිපුණතා 07ක් යටතේ පෙළගස්වා ඇති අන්තර්ගතයෙහි 1.0 සිට 5.0 තෙක් වන ප්‍රායෝගික නිපුණතාවන්හි නිපුණතා මට්ටම් සඳහා ආදර්ශ ක්‍රියාකාරකමක් ඇතුළත් කර ඇත. එම නිපුණතා මට්ටම්වලට අදාළ ව යෝජනා කර ඇති මාතෘකා හෝ සුදුසු වෙනත් මාතෘකා හෝ පදනම් කරගෙන අනෙකුත් ක්‍රියාකාරකම් නිර්මාණය කරගන්න.

- 6.0 හා 7.0 නිපුණතා සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ඇතත්, සුදුසු නිර්මාණශීලී ක්‍රමවේද භාවිත කර, අදාළ විෂය කරුණු සාක්ෂාත් වන සේ ක්‍රියාකාරකම් වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත.

- යෝජිත මෙන් ම සම්පාදනය කර ගන්නා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන්න.

    I සෞන්දර්ය හෝ වෙනත් විෂය සමෝධානික හෝ රසවත් ඉදිරිපත් කිරීම් මඟින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාගෙන සිසුන් පාඩමට ඇදබැඳ ගැනීම හා පෙර දැනුම විමසීමට පොලඹවා ගැනීම ඔස්සේ ක්‍රියාකාරකමට පිවිසිය යුතු ය.

    II සිසුන්ගේ ශක්‍යතා හඳුනා ගෙන නිර්මාණශීලී ඉගෙනුම් ක්‍රම භාවිත කර, ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබාදෙමින් ක්‍රියාකාරකම අවසානයක් කරා ගෙනයෑමෙන් අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ළඟා විය හැකි ය.

    III ඉදිරිපත් කිරීම්, ඇගයීම්, සමාලෝචනය, පසු වැඩ පැවරීම, ඇතුළත් ව සමස්ත පාඩම නිමා කිරීම.

- ගුරු මාර්ගෝපදේශය මඟ පෙන්වීමක් පමණි. විෂයබද්ධ ග්‍රන්ථ, අන්තර්ජාලය, වැනි මාධ්‍ය පරිශීලනය කිරීමෙන් ගුරුවරයා මෙන් ම ශිෂ්‍යයා ද දැනුමෙන් හා අවබෝධයෙන් සන්නද්ධ වීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කරගත හැකි වේ.

- හඳුන්වා දී ඇති සියලු ම නිපුණතා පුද්ගල පෞරුෂ සංවර්ධනය පදනම් කරගෙන ගොඩනගා ඇති බැවින්, එම නිපුණතා 07 ම අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක කළ යුතු ය.

  පහත වගුව අනුව ක්‍රියාකාරකම් වාර තුනට බෙදාගත හැකි ය.

| 1 වාරය | 2 වාරය | 3 වාරය |
|---|---|---|
| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම් අංකය |
| 1.1.1 1.1.2 1.2.1 2.1.1<br>2.1.2 3.1.1 3.1.2 4.1.1<br>5.1.1 6.1.1 6.2.1 7.1.1<br>7.1.2 | 1.1.3 1.1.4 1.2.2 1.2.3<br>2.1.3 2.2.1 2.2.2 3.2.1<br>3.2.2 3.3.1 4.1.2 4.2.1<br>5.2.1 6.3.1 6.4.1 7.1.3 | 1.2.4 1.2.5<br>1.2.6 1.3.1<br>2.2.3 2.2.4<br>3.3.2 3.3.3<br>4.3.1 5.3.1<br>6.5.1 6.6.1<br>7.2.1 7.2.2 |

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමිටුව | vi |
| හැඳින්වීම | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශය | ix-xxii |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-86 |

# විෂය නිර්දේශය

# 1.0 හැඳින්වීම

පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක සමස්ත විෂයමාලාවෙන් "චිත්‍ර කලාව" විෂය වනාහි සුවිශේෂ වූවකි. නිර්මාණකරණයට හා වින්දනයට ප්‍රමුඛස්ථානයක් හිමි වන චිත්‍ර කලාව විෂයයෙන් සිදු වන්නා වූ සමාජ මෙහෙවර ඉතා වැදගත් ය. චිත්‍ර කලාවෙන් පුද්ගලයාගේ සුසමාහිත පෞරුෂය සංවර්ධනය වෙයි.

චිත්‍ර කලාව විෂය නිර්දේශයේ, විෂය බද්ධ නිපුණතා හතකින් දරුවා තුළ දැනුම, ආකල්ප, කුසලතා හා යහපත් ජීවන පුරුදු වර්ධනය කර ගැනීමෙහි ලා අවධානය යොමු කර ඇත. විෂය බද්ධ නිපුණතාවල දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා නිපුණතා පහක් ද රසාස්වාදය හා කලා ඉතිහාසය අධ්‍යයනය සඳහා නිපුණතා දෙකක් ද වෙන් කර ඇත. ඒ අනුව එක් එක් ශ්‍රේණියේ වයස් මට්ටමට ගැළපෙන සේ විෂය අන්තර්ගතය, නිපුණතා මට්ටම් ඔස්සේ පෙළ ගස්වා ඇත.

විෂය නිර්දේශ සංස්කරණයේ දී පහත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදි.

- අන්තර්ජාතික චිත්‍ර කලාවේ නව ප්‍රවණතා
- ක්ෂේත්‍රයෙන් ප්‍රකාශිත නවමු අදහස්
- පාසල් පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ කරන ලද නිරීක්ෂණ හා සමීක්ෂණ

පළමු වන නිපුණතාව යටතේ වන මිනිස් රූප හා සත්ත්ව රූප ඇඳීම සඳහා වන මූලික අභ්‍යාස සඳහා නව නිපුණතා මට්ටම් සකස් විය. දෙවන නිපුණතාව යටතේ වන ස්වාභාවික හා නිර්මිත පරිසරයේ මූලික හැඩතල හා හැඩ සඳහා නිපුණතා මට්ටම් ද, නව තාක්ෂණය හා වැඩ ලෝකයට ඇවැසි දැනුම හා කුසලතා සාධනය වන ලෙසින් තුන් වන හා හතර වන නිපුණතාවලට අදාළ නිපුණතා මට්ටම් ද සකස් විය. ආකෘති නිර්මාණයෙන් ත්‍රිමාණ බව පිළිබඳ සංකල්පය තව දුරටත් පසක් කරනු වස්, පස් වන නිපුණතාව යටතේ නිපුණතා මට්ටම් සකසා ඇත. රසාස්වාදය හා කලා ඉතිහාසය පිළිබඳ දැනුම ලැබීම මෙන් ම විවිධ කෘතීන් අධ්‍යයනයෙන් ලත් දැනුම භාවිතයට ගැනීමට අවස්ථාව සැලසීම හවන හා හත් වන නිපුණතාවන්හි නිපුණතා මට්ටම්වලින් සාධනය කිරීමට අපේක්ෂිත ය.

## 2.0 ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර, ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයක් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයෝ
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයෝ අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

**(V) ආගමයට සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

**(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII) ''ඉගෙනීමට ඉගෙනුම'' පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## 4.0 චිත්‍ර කලා කලා විෂය අරමුණු

1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය.

2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුශලතා වර්ධනය.

3. ඵලදායී දිවි පැවැත්මකට අවශ්‍ය කුශලතා හා ආකල්ප වර්ධනය.

4. දේශීය හා විදේශීය සංස්කෘතික අංගයන්ගේ අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම.

5. විචාර ශක්තිය වර්ධනය.

6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ශක්‍යතාවලින් සමන්විත සමබර පෞරුෂ වර්ධනය.

## 5.0 ජාතික පොදු අරමුණු සහ චිත්‍ර කලා විෂය අරමුණු අතර සම්බන්ධතා දැක්වීම

| ජාතික පොදු අරමුණු | චිත්‍ර කලා විෂය අරමුණු |
| --- | --- |
| I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මගින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම | 4. දේශීය හා විදේශීය කලාවල අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම |
| II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම | 4. දේශීය හා විදේශීය කලාවල අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම<br>6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ධාරිතාවලින් සමන්විත සමබර පෞරුෂ වර්ධනය |
| III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුම්වත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම | 1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය<br>2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුශලතා වර්ධනය<br>3. ඵලදායී දිවි පැවැත්මකට අවශ්‍ය කුශලතා හා ආකල්ප වර්ධනය |
| IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම | 1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය<br>3. ඵලදායී දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය |

| ජාතික පොදු අරමුණු | චිත්‍ර කලා විෂය අරමුණු |
|---|---|
| V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම | 1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය<br>2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුශලතා වර්ධනය<br>3. ඵලදායී දිවි පැවැත්මකට අවශ්‍ය කුශලතා හා ආකල්ප වර්ධනය<br>5. විචාර ශක්තිය වර්ධනය<br>6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ශක්‍යතාවලින් සමන්විත සමබර පෞරුෂ වර්ධනය |
| VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම | 3. ඵලදායී දිවි පැවැත්මකට අවශ්‍ය කුශලතා හා ආකල්ප වර්ධනය |
| VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම | 5. විචාර ශක්තිය වර්ධනය<br>6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ශක්‍යතාවලින් සමන්විත සමබර පෞරුෂ වර්ධනය |
| VIII අන්තර්ජාතික ප්‍රජාව අතර ගෞරවාන්විත ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා පෝෂණය කිරීම | 3. ඵලදායී දිවි පැවැත්මකට අවශ්‍ය කුශලතා හා ආකල්ප වර්ධනය<br>4. දේශීය හා විදේශීය කලාවල අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 0.1 පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි. | 1.1 මානව හා සත්ත්ව, රූප රේඛාවෙන් අධ්‍යයනය කරයි.<br><br>1.2 පාරිසරික, සමාජීය, ආගමික හා ඓතිහාසික තේමා ආශ්‍රිත චිත්‍ර නිර්මාණය කරයි.<br><br>1.3 විවිධ සංස්කෘතීන්ට අයත් ආගමික සිද්ධස්ථානවල සිතුවම් අධ්‍යයනය කර ඒවායේ සුවිශේෂ කලා ලක්ෂණ ඇසුරින් චිත්‍ර නිර්මාණය කරයි. | • මානව ඉරියවු අධ්‍යයනය<br>• සත්ත්ව ඉරියවු අධ්‍යයනය<br><br>• චිත්‍ර සංරචනය කිරිමේ සිද්ධාන්ත<br>- සම්පිණ්ඩනය<br>- පරිමාණය<br>- පර්යාලෝකය<br>- ත්‍රිමාන ලක්ෂණ<br>- ශිල්ප ක්‍රම<br><br>• විවිධ සංස්කෘතීන්ට අයත් සිද්ධස්ථාන<br>- පන්සල<br>- කෝවිල<br>- මුස්ලිම් පල්ලිය<br>- කතෝලික දේවස්ථානය | • මානව හා සත්ත්ව ඉරියවු අධ්‍යයනයෙන් විවිධ තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.<br><br>• පෘථුල තේමා ආශ්‍රිත චිත්‍ර නිර්මාණය කරයි.<br><br>• විවිධ සිද්ධස්ථානයන්හි සිතුවම් අධ්‍යයනයෙන් ස්වතන්ත්‍ර චිත්‍ර නිර්මාණය කරයි. | 20 |
| 2.0 පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි. | 2.1 ස්වාභාවික සහ නිර්මිත වස්තු රේඛාවෙන් අධ්‍යයනය කරයි.<br><br>2.2 ස්වාභාවික සහ නිර්මිත වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි. | • රේඛා අධ්‍යයනය<br>-වෘක්ෂලතා<br>-ජ්‍යාමිතික හැඩ ගත් වස්තු<br><br>• ස්වාභාවික සහ නිර්මිත වස්තු<br>- වෘක්ෂලතා<br>- ජ්‍යාමිතික හැඩ සහිත නිර්මිත වස්තු<br>• සම්පිණ්ඩනය කිරීමේ මූලික සිද්ධාන්ත භාවිතය<br>- පරිමාණය<br>- ත්‍රිමාණ ලක්ෂණ<br>- පර්යාලෝකය | • විවිධ ජ්‍යාමිතික හැඩ සහ වෘක්ෂලතා අධ්‍යයනයෙන් එකිනෙකට අනන්‍ය වූ ගති ලක්ෂණ මතු වන සේ රේඛා චිත්‍ර අඳියි.<br><br>• ස්වාභාවික හා නිර්මිත වස්තුන්ගේ ගතිලක්ෂණ මතු වන සේ සම්පිණ්ඩනාත්මක චිත්‍ර නිර්මාණය කරයි.<br>• නිරීක්ෂණයෙන් නිගමනවලට එළැඹෙයි. | 13 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • විවිධ මාධ්‍ය භාවිතය<br>- දියසායම්<br>- පැස්ටල්<br>- ඇක්‍රලික්<br>• තලය භාවිතය | | |
| 3.0 පාරිහාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි. | 3.1 උද්භිද සහ සත්ත්ව ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි ඒකක හා වර්ණ අධ්‍යයනය කරයි.<br><br>3.2 රෙදිපිළි සඳහා ව්‍යාප්ත සැරසිලි නිර්මාණය කරයි.<br><br>3.3 පාරිහාරික අවශ්‍යතා සඳහා නවතාවකින් යුතු සැලසුම් නිර්මාණය කරයි. | • පාරිහාරික භාණ්ඩ අලංකරණය<br>- ද්විමාන සැලසුම<br>- නෙළුම් මල<br>- බිනර මල<br>- අන්නාසි මල<br>- කතිරමල<br>- හංස රූප<br>- භේරුණ්ඩ පක්ෂියා<br>- සිංහ රූප<br>- ඇත් රූප<br><br>• කාන්තා / පිරිමි<br>• ළමා<br><br>• සැලසුම් චිත්‍ර<br>• වර්ණ භාවිතය<br>- වෙස්මුහුණු<br>- බිත්ති සැරසිලි<br>- ඉටිපන්දම් රඳවන | • උද්භිද සහ සත්ත්ව ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි අලංකරනය සඳහා භාවිත කරයි.<br><br>• දෛනික අවශ්‍යතාවල දී භාවිත රෙදිපිළි සඳහා උචිත ව්‍යාප්ත සැරසිලි නිර්මාණය කරයි.<br><br>• පාරිහාරික අවශ්‍යතාවන්ට උචිත නවතාවකින් යුතු නිර්මාණ කරයි. | 19 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **4.0 නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.** | 4.1 විවිධ අවශ්‍යතා සඳහා පෝස්ටර් චිත්‍ර හා ලේබල් නිර්මාණය කරයි. | • අවශ්‍යතා<br>• සැලසුම<br>• මුද්‍රණයට සුදුසු බව<br>• සන්නිවේදනාර්ථ<br>• නිර්මාණාත්මක අක්ෂර<br>• වර්ණ මාධ්‍ය<br>- පෝස්ටර්<br>- ලේබල් | • නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා මුද්‍රණයට යෝග්‍ය වන අයුරින් නිර්මාණාත්මක රේඛා, හැඩතල හා වර්ණ භාවිත කරමින් සන්නිවේදනය තීව්‍ර වන සේ පෝස්ටර් හා ලේබල් නිර්මාණය කරයි. | 12 |
| | 4.2 ළමා කතන්දර පොතකට සුදුසු පිටකවරයක් නිර්මාණය කරයි. | • අවශ්‍යතාව<br>• මුද්‍රණයට සුදුසු බව<br>• සැලසුම<br>• නිර්මාණාත්මක අක්ෂර<br>• රේඛාකරණය<br>• වර්ණ මාධ්‍ය<br>• හැඩතල<br>• ශිල්පීය ක්‍රම<br>• ශිල්ප ක්‍රම<br>• නිර්මාණාත්මක බව<br>• නිමාව | • තෝරාගත් නියැදියට සමීප වන සේ ශිල්පක්‍රම, ශිල්පීය ක්‍රම භාවිත කරමින් නිර්මාණාත්මක ව ළමා කතන්දර පොතකට සුදුසු පිට කවරයක් සැලසුම් කර අඳියි. | |
| | 4.3 ළමා කතන්දරයක තෝරාගත් අවස්ථාවකට සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරයි. | • රේඛාකරණය<br>• හැඩතල<br>• වර්ණ මාධ්‍ය | • අදාළ නියැදියේ රුචි/අරුචිකම් හා සන්නිවේදන ශක්‍යතාව පිළිබඳ ව දැනුම්වත් වෙමින් තෝරාගත් මාතෘකාවකට සන්නිදර්ශන චිත්‍රයක් අඳියි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **5.0 විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.** | 5.1 ඇඹීම ශිල්ප ක්‍රම භාවිතයෙන් විවිධ මූර්ති නිර්මාණය කරයි.<br>5.2 නෙළීම ශිල්ප ක්‍රම භාවිතයෙන් විවිධ මූර්ති නිර්මාණය කරයි.<br>5.3 එකලස් කිරීම ශිල්ප ක්‍රම භාවිතයෙන් විවිධ මූර්ති නිර්මාණය කරයි. | • මානව හා සත්ත්ව රූප සම්පිණ්ඩන (ඇඹීම)<br>• වෙස් මුහුණු (නෙළීම)<br>• ගෘහ අලංකරණ භාණ්ඩ (එකලස් කිරීම)<br>- සරල හැඩ<br>- සම්පිණ්ඩනය<br>- විවිධ මාධ්‍ය<br>- අවශ්‍යතාවට උචිත බව | • ඇඹීම, නෙළීම සහ එකලස් කිරීම ශිල්පක්‍රම භාවිතයෙන් නිර්මාණකරණයේ යෙදෙයි. | 09 |
| **6.0 ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.** | 6.1 ශ්‍රී ලංකාවේ පාරම්පරික වෙස්මුහුණු කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය හා රසාස්වාදය කරයි.<br><br>6.2 දැව කැටයමින් අලංකාර වූ හින්දු කෝවිල් ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය කරයි.<br><br>6.3 ශ්‍රී ලංකාවේ පාරම්පරික ලාක්ෂා කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය හා රසාස්වාදය කරයි.<br><br>6.4 තෝරාගත් ශෛලීගත නාට්‍යයක දක්නට ලැබෙන චිත්‍රමය ගුණාංග රසාස්වාදය කරයි. | • විවිධ වෙස් මුහුණු, මරවාහනම් නිර්මාණ හා ලාක්ෂා නිර්මාණ<br>- ඓතිහාසික පසුබිම<br>-ව්‍යාප්ත ප්‍රදේශ<br>-ශිල්ප ක්‍රම<br>-මාධ්‍ය<br>-උපකරණ<br>- කලාත්මක ලක්ෂණ<br><br>• ශෛලිගත නාට්‍ය<br>- තෝරාගත් නාට්‍ය කිහිපයක්<br>- අංග රචනය<br>- රංග භාණ්ඩ හ වස්ත්‍රාභරණ<br>- රංග වස්ත්‍රාභරණ නිර්මාණය | • පාරම්පරික කලා කර්මාන්ත අධ්‍යයනය කර ඒ ආශ්‍රිත කලා නිර්මාණ රසාස්වාදය කරයි.<br><br>• තෝරාගත් ශෛලීගත නාට්‍යවල දක්නට ලැබෙන චිත්‍රමය ගුණාංග අධ්‍යයනයට ලක් කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5 තෝරාගත් දේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.<br><br>6.6 තෝරාගත් චිත්‍රකතා ශිල්පීන්ගේ නිර්මාණ රසවින්දනය කරයි. | • එස්.පී. චාල්ස්<br>- ජාතික කොඩිය<br>- සෙංකෝලය<br><br>• දයා රාජපක්ෂ<br>• බන්දුල හරිශ්චන්ද්‍ර<br>• ජනක රත්නායක | • ජාතික කොඩිය හා සෙංකෝලය සඳහා භාවිත කර ඇති සංකේත විස්තර කරයි.<br><br>• තෝරාගත් චිත්‍ර කථා ශිල්පීන්ගේ නිර්මාණ අගයයි. | |
| 7.0 දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි. | 7.1 ඓතිහාසික ගෘහ නිර්මාණ ආශ්‍රිත කලා අංග අධ්‍යයනය කරයි.<br><br>7.2 දේශීය සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර අධ්‍යයනය කරයි. | • සඳකඩපහණ<br>• මුරගල<br>• කොරවක් ගල<br>• වාහල්කඩ<br>• වටදාගෙය<br>• පියගැට පෙළ<br><br>• සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ<br>- චතුර් නාරී පල්ලැක්කිය<br>- සප්තනාරී පල්ලැක්කිය<br>- පංචනාරී ඝටය<br>- නවනාරී කුඤ්ජරය<br>- සප්තනාරී රථය<br>- වෘෂභ කුඤ්ජරය<br>- කිහිඹි මුහුණ<br>- මකර රුව<br>- යාලී රුව | • ඓතිහාසික ගෘහ නිර්මාණ ආශ්‍රිත කැටයම් අධ්‍යයනය කරයි.<br><br>• සාම්ප්‍රදායික සැරසිලි ඒකක හඳුනාගෙන නම් කරයි. | 09 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0 : පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.1 : මානව හා සත්ත්ව රූප රේඛාවෙන් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 1.1.1 : ''මිනිස් සිරුරේ රිද්මික හැඩ රේඛාවෙන් අධ්‍යයනය කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- ක්‍රියාකාරි මානව ඉරියවු පිළිබඳ අදහස් දක්වයි.
- විවිධ වයස් කාණ්ඩයනට අයත් මිනිස් ඉරියවු රේඛාවෙන් අධ්‍යයනය කරයි.
- විවිධ ශිල්ප ක්‍රම භාවිතයෙන් වර්ණ කරයි.
- අභ්‍යාසකරණයෙන් ලත් හුරුව වෙනත් නිර්මාණ සඳහා භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 1.1.1.1ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා
- විවිධ තේමා යටතේ සම්පිණ්ඩනය වූ නිදර්ශන චිත්‍ර මානව රූප දළ සටහන්
- චිත්‍ර අඳින කඩදාසි, වර්ණ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

**පියවර 1.1.1.1** :
- දළ සටහන් හා නිදර්ශන චිත්‍ර සිසුන් වෙත ප්‍රදර්ශනය කරන්න.
- මානව ඉරියවුවල විවිධතා පිළිබඳ ව සාකච්ඡා කරන්න.
  - කාන්තා, පිරිමි - ළමා, වැඩිහිටි
  - හැඟීම් ප්‍රකාශනය
- සිද්ධාන්ත භාවිතය පිළිබඳ ව පැහැදිලි කරන්න.
  - පරිමාව හා පරිමාණය
  - පර්යාලෝකය
  - එළිය අඳුර හා ත්‍රිමාන ලක්ෂණ
- වර්ණ මාධ්‍ය සහ ශිල්පක්‍රම භාවිතය පිළිබඳ ව අවබෝධ කරදෙන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 1.1.12** :
- ඇමුණුම 1.1.1.1ට අදාළ ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාවට අනුව සිසුන් ක්‍රියාකාරකමේ නිරත කරවන්න.
- ක්‍රියාකාරකමෙහි නිරත සිසුන්ට අවශ්‍ය උපදෙස් සහ මඟ පෙන්වීම් ලබාදෙන්න.
- සිසු නිර්මාණ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 55 යි)

**පියවර 1.1.13** :
- ප්‍රදර්ශිත නිර්මාණ පිළිබඳ ව ස්වයං ඇගයීමකට අවස්ථාව ලබාදෙන්න.
- සංවර්ධනාත්මක අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට අනෙක් සිසුන් යොමු කරවන්න.
- සාර්ථක මානව රූප සම්පිණ්ඩනයක් සඳහා මානව ඉරියවු අධ්‍යයනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම සහ තක්සේරුකරණයේ යෙදෙන්න.

- මානව රූපවල ක්‍රියාකාරිත්වය සහ විවිධත්වය පිළිබඳ අදහස් දැක්වීම
- විවිධ මානව ඉරියවු රේඛාවෙන් ඇඳීම
- වර්ණ මාධ්‍ය භාවිතය හා ශිල්ප ක්‍රම අනුගමනය කිරිම
- නිවැරදි සිද්ධාන්ත භාවිත කිරීම

**ඇමුණුම 1.1.1.1**

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- විවිධ තේමාවන් යටතේ සම්පින්ඩණය වූ නිදර්ශන චිත්‍ර සහ මානව රූප දළ සටහන් හොඳින් නිරීක්ෂණය කරන්න. ඔබට අභිමත මානව ඉරියවු රේඛාවෙන් අඳින්න.
- මානව රූවේ පරිමාව හා පරිමාණ ලක්ෂණ රිද්මය පිළිබඳ ව අවධානය යොමු කරන්න.
- ස්ත්‍රී - පුරුෂ, ළමා - වැඩිහිටි වශයෙන් විවිධ මානව රූප ඇඳීම පිළිබඳ ව සැලිකිලිමත් වන්න.
- මානව රූපවල විවිධ හැඟීම් මතු කර දක්වන්න.
- එළිය අඳුර ත්‍රිමාන ලක්ෂණ මතු වන සේ වර්ණ මාධ්‍ය භාවිත කරන්න.
- නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කරන්න.
- ක්‍රියාකාරකමේ නිරත වීමේ දී අවශ්‍ය තැන්හි දී ගුරු උපදෙස් ලබාගන්න.
- ඔබගේ නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සූදානම් වන්න.

**පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.**

1.1.2 සත්ත්ව රූප රේඛාවෙන් අධ්‍යයනය කරමු. - කාලච්ඡේද 01

1.1.3 නාගරික පරිසරයට අදාළ මානව රූප රේඛාවෙන් අධ්‍යයනය කරමු. - කාලච්ඡේද 01

1.1.4 ගැමි පරිසරයට අදාළ මානව හා සත්ත්ව රූප රේඛාවෙන් අධ්‍යයනය කරමු.-කාලච්ඡේද01

**නිපුණතාව 1.0 : පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.2** : පාරිසරික, සමාජීය, ආගමික හා ඓතිහාසික තේමා ආශ්‍රිත චිත්‍ර නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 1.2.1** : ''වැසි දිනයක් චිත්‍රණය කරමු.''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- වැසි දිනයක ස්වභාවය විස්තර කරයි.
- මිනිස් හා සත්ත්ව හැසිරීම් පැහැදිලි කරයි.
- වැසි දිනයක ස්වභාවය මතුවන සේ චිත්‍රයක් නිර්මාණය කරයි.
- සුදුසු වර්ණ හා ශිල්ප ක්‍රම භාවිත කරයි.
- සංයමයෙන් කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- වැසි දිනයක අවස්ථා දැක්වෙන නිදර්ශන චිත්‍ර
- විවිධ මානව සත්ත්ව ඉරියවු දැක්වෙන චිත්‍ර
- පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය දෘශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරිම සඳහා උපදෙස්** :

**පියවර 1.2.1.1** :
- ගුණාත්මක යෙදවුම් භාවිත කර මනා ඇද බැඳ ගැනීම් ඇතිවන සේ පාඩමට පිවිසෙන්න.
- නිදර්ශන චිත්‍ර සිසු නිරීක්ෂණයට යොමු කරන්න.
- එම නිර්මාණ ඇසුරෙන් පහත සඳහන් කරුණු අවධාරණය වන පරිදි වැසි දිනයක ස්වභාවය හා සිදුවීම් පිළිබඳ සාකච්ඡාවක නිරතවන්න.
  - පරිසර ස්වභාවය (අඳුරු, මීදුම, සීතල බව)
  - විවිධ පරිසර තත්ත්ව (ග්‍රාමීය, නාගරික, කඳුකර, පහත්බිම් ආදි)
  - මිනිස් හා සත්ත්ව හැසිරීම් හා විවිධ ඉරියවු
  - සංරචන සිද්ධාන්ත භාවිතය
  - අර්ථවත්ව වර්ණ හා ශිල්ප ක්‍රම භාවිතය

(මිනිත්තු 10 යි)

**පියවර 1.2.12** :
- මාතෘකාව අභිමත පරිදි චිත්‍රයට නැගීමට සිසුන් යොමු කරන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණ ලබාදෙමින් නිර්මාණය අවසානය දක්වා සිසුන් මෙහෙයවන්න.
- නිම කෘති පන්තියේ ප්‍රදර්ශනයට සූදානම් කරවන්න.

(මිනිත්තු 55 යි)

**පියවර 1.2.1.3** :
- සිය නිර්මාණ පිළිබඳ ව විවරණය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇගයීම හා විචාරයට අනෙක් සිසුන් මෙහෙයවන්න.
- සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම සහ තක්සේරුකරණයේ යෙදෙන්න.

- වැසි දිනයක ස්වභාවය හා සුවිශේෂතා ඉදිරිපත් කිරීම
- සංරචන සිද්ධාන්ත සාර්ථකව භාවිත කිරීම
- මිනිස් හා සත්ත්ව ඉරියවු සාර්ථකව ප්‍රකාශ කිරීම
- වැසි දිනක ස්වභාවය වර්ණ හා ශිල්ප ක්‍රම භාවිතයෙන් අර්ථවත් කිරීම

**පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.**

1.2.2 සති පොළ - කාලච්ඡේද 2
1.2.3 පාසලේ ක්‍රීඩා උළෙලක අවස්ථාවක් - කාලච්ඡේද 2
1.2.4 බස් නැවතුමක සිදුවීමක් ( Bus Holt) - කාලච්ඡේද 2
1.2.5 වන අසිරිය - කාලච්ඡේද 2
1.2.6 අභය භූමියක් නරඹන්නෝ - කාලච්ඡේද 2

**නිපුණතාව 1.0** : **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.3** : **විවිධ ආගමික සිද්ධස්ථානවල සිතුවම් අධ්‍යයනය කර ඒවායේ සුවිශේෂ කලා ලක්ෂණ ඇසුරින් චිත්‍ර නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 1.3.1** : **''ආගමික සිතුවම් ඇසුරින් චිත්‍ර අඳිමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි

**ඉගෙනුම් පල** :
- විවිධ ආගමික සිද්ධස්ථානවල ඇති බිතුසිතුවම් පිළිබඳ විස්තර කරයි.
- එක් එක් ආගමික ස්ථානවල ඇති සිතුවම්වල අනන්‍ය වූ චිත්‍රමය ලක්ෂණ පැහැදිලි කරයි.
- අධ්‍යයනය කළ සිතුවම් ආශ්‍රිත ව ස්වතන්ත්‍ර චිත්‍ර නිර්මාණය කරයි.
- නිර්මාණ රස විඳිමින් අගයයි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ ආගමික සිද්ධස්ථාන ආශ්‍රිත අනන්‍යතාවන් පිළිබිඹු කරන සිතුවම් /ඡායාරූප/ සංයුක්ත තැටි
- ඇමුණුම 1.3.1.1ට ඇතුළත් ගවේෂණ කාර්ය පත්‍රිකා
- විවිධ ක්‍රියාකාරී ඉරියවු සහිත දළ රේඛා සටහන් පත්‍රිකා

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 1.3.1.1** :
- පාසලට ආසන්න ආගමික සිද්ධස්ථානය නැරඹීමට කෙටි චාරිකාවක් සංවිධානය කරගන්න.
- අදාළ ආගමික ස්ථානයේ චිත්‍ර පිළිබඳ ව අවධානය යොමු කරන්න.
- එම නිර්මාණ ඇසුරෙන් පහත සඳහන් කරුණු අවධාරණය වන පරිදි සාකච්ඡා කරන්න.
  - මානව රූප ඇඳීම හා හැඩතල සංරචනය
  - සැරසිලි මෝස්තර භාවිතය
  - පසුබිම යෙදීම
  - වර්ණ භාවිතය (මිනිත්තු 40 යි)

**පියවර 1.3.1.2** :
- නැරඹූ ආගමික සිද්ධස්ථානයේ සිතුවම් ශෛලිය ඇසුරින් ස්වතන්ත්‍ර නිර්මාණයක් කිරීම සඳහා සිසුන්ට උපදෙස් දෙන්න.
- ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාවේ උපදේශනවලට අනුව සංරචනයක් කිරීමට සිසුන් මෙහෙයවන්න.
- නිර්මාණකරණයේ දී සිසුන්ට අවශ්‍ය මඟ පෙන්වීම හා උපදෙස් ලබාදෙන්න.
- තෝරාගත් ශෛලියකට උචිත ශිල්පක්‍රම භාවිතයෙන් වර්ණ ගන්වා නිම කිරීමට මඟ පෙන්වන්න.
- නිම කළ කෘති පන්ති කාමරයේ ප්‍රදර්ශනය සඳහා සූදානම් කරවන්න.

(මිනිත්තු 70 යි)

**පියවර 1.3.1.3** :
- සිසු නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- නිර්මාණ පිළිබඳ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීම සඳහා සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.
- තෝරාගත් චිත්‍ර ශෛලිය හා එහි චිත්‍රමය ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරමින් සිසු නිර්මාණ සඳහා සංවර්ධනාත්මක අදහස් ලබාදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම් හා තකසේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ආගමික සිද්ධස්ථානවල ඇති බිතු සිතුවම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- එම සිතුවම්වලට අනන්‍ය සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීම
- අධ්‍යයනය කළ ශෛලියකට අනුව චිත්‍රයක් නිර්මාණය කිරීම
- ශෛලියට උචිත පරිදි වර්ණ මාධ්‍ය හා ශිල්පක්‍රම භාවිත කිරීම

**ඇමුණුම 1.3.1.1**

## ගවේෂණ / කාර්ය උපදෙස් පත්‍රිකාව

- පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන චිත්‍ර නිදර්ශන/ ඡායාරූප/ සංයුක්ත තැටි දර්ශන හොඳින් නිරීක්ෂණය කරන්න.
- විවිධ ක්‍රියාකාරි අවස්ථා සහිත මානව ඉරියවුවල දළ සටහන්වලින් ආදර්ශ සපයා ගනිමින් ඔබේ නිර්මාණය කිරීම සඳහා යොමු වන්න.
- නිර්මාණය වර්ණ කිරීමේ දී තෝරා ගත් ශෛලියට ගැළපෙන ශිල්පක්‍රම අනුගමනය කරන්න.
- ගුරුතුමාගේ / ගුරුතුමියගේ සහාය/ උපදෙස් අවශ්‍ය පරිදි ලබාගන්න.
- නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

**නිපුණතාව 2.0** : **පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.1** : **ස්වාභාවික සහ නිර්මිත වස්තු රේඛාවෙන් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 2.1.1** : **''එළිමහනට ගොස් ගසක හැඩතල රේඛාවෙන් අඳිමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- ශාකවල විවිධත්වය හා ස්වභාවය සාකච්ඡා කරයි.
- ශාකවල මූලික හැඩ රේඛාවෙන් අඳියි.
- රේඛා භාවිතයේ විවිධත්වයෙන් ශාක කොටස්වල ගතිලක්ෂණ මතු කර දක්වයි.
- විවිධ පැන්සල් සුදුසු ශිල්පක්‍රම අනුව භාවිත කරයි.
- ද්‍රව්‍ය බලා ඇඳීමට අදාළ සිද්ධාන්ත අනුගමනය කරයි.
- අනෙක් සිසුන්ගේ නිර්මාණ අගයයි.

**ගුණාත්මක යෙදවුම්** :
- චිත්‍ර අඳින කඩදාසි
- 2B, 4B පැන්සල්
- චිත්‍ර ඇඳීමේ පුවරු
- චිත්‍ර පුවරු රඳවන
- කඩදාසි රඳවන කටු හෝ ක්ලිෆ්
- නිදර්ශන චිත්‍ර

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්**

**පියවර 2.1.1.1** :
- චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ රැගෙන පාසල් පරිසරයේ සුදුසු ස්ථානයකට සිසුන් කැඳවාගෙන යන්න.
- පරිසරයේ තුරුලිය නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරමින් ඒ පිළිබඳ සාකච්ඡා කරන්න.
  - විවිධ ශාකවල ස්වභාවය
  - කොළවල හැඩ හා වර්ණවල විවිධත්වය
  - ශාක කඳෙහි හැඩතල හා පොත්තේ ස්වභාවය
- වෘක්ෂලතා හැඩතල රේඛාවෙන් ඇඳීමේ දී ඒවාට අනන්‍ය ලක්ෂණ මතු කරන ආකාරය නිදර්ශන චිත්‍ර ඇසුරෙන් පෙන්වා දෙන්න.
- ද්‍රව්‍ය බලා ඇඳීමේ චිත්‍රවල දී අනුගමනය කළ යුතු සිද්ධාන්ත පිළිබඳ ව පැහැදිලි කරන්න.
  - පරිමාණය
  - එළිය අඳුර ත්‍රිමාන ලක්ෂණ
  - වයනය

(මිනිත්තු 10 යි)

**පියවර 2.1.1.2** :
- බලා ඇඳීමට සුදුසු ලෙසින් ස්ථානගත කර උපකරණ හා ද්‍රව්‍ය නිසි පරිදි සකසා ගැනීමට සහාය වන්න.
- ශාකයක මූලික හැඩය සහ අතුවල කොටස් මෙන් ම පත්‍රවල හා කඳෙහි පොත්තේ පවතින ස්වභාවය පැන්සලෙන් ඇඳීමට සිසුන් යොමු කරන්න.
- රේඛාවේ විවිධතා හා පැන්සල භාවිත කිරීමේ විවිධ ක්‍රමවේද යොදා ගනිමින් ක්‍රියාකාරකමෙහි නිරත වන සිසුන්ට අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදෙන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 2.1.1.3** : • සියලු දෙනාට නිර්මාණ නැරඹීමට අවස්ථාව ලබාදී ස්වයං ඇගයීමකට යොමු කරන්න.
• නිර්මාණවල ගුණාත්මක හා දුර්වල ලක්ෂණ පෙන්වමින් සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
• සමස්තයක් ලෙස නිර්මාණවල සිද්ධාන්ත හා ශිල්පක්‍රම භාවිතය ක්‍රියාකාරකමෙහි නිරතවීම පිළිබඳ කෙටි සමාලෝචනයක් කරන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- වෘක්ෂලතාවල විවිධත්වය හා ගතිලක්ෂණ සාකච්ඡා කිරීම
- ශාකවල සරල මූලික හැඩ පැන්සලෙන් ඇඳීම
- ශාක කොටස්වල ගතිලක්ෂණ රේඛාවේ විවිධත්වයෙන් මතු කිරීම
- අදාළ පරිදි සිද්ධාන්ත හා ශිල්පක්‍රම භාවිත කිරීම

**නිපුණතාව 2.0** : **පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.1** : **ස්වාභාවික හා නිර්මිත වස්තු රේඛාවෙන් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම් 2.1.2** : **''සනක හැඩැති වස්තුවක්, වතුර බොන ලොකු ප්‍රමාණයේ වීදුරුවක්, ගෝලාකාර හැඩැති පලතුරු ගෙඩියක් රේඛාවෙන් අධ්‍යයනය කරමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි

**ඉගෙනුම් පල** :
- ද්‍රව්‍යවල පරිමාව, හැඩය හා ගති ස්වභාවයේ පවතින විවිධත්වය විස්තර කරයි.
- තලයට ගැළපෙන සේ ද්‍රව්‍ය සමූහය පරිමාණානුකූල ව ඇඳ දක්වයි.
- චිත්‍ර ඇඳීමේ සිද්ධාන්ත නිසි ලෙස භාවිත කර ද්‍රව්‍ය සමූහය සම්පිණ්ඩනය කරයි.
- විවිධ පැන්සල් භාවිතයෙන් රේඛාවේ ශක්තීන් මතු කිරීමට සුදුසු ශිල්පක්‍රම අනුගමනය කරයි.
- නිර්මාණ අගයමින් රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- සනක හැඩැති වස්තුවක්
- වතුර බොන විශාල ප්‍රමාණයේ වීදුරුවක්
- භාණ්ඩ තැබීම සඳහා ධාරකයක්
- චිත්‍ර අඳින කඩදාසි
- 2B,4B පැන්සල්
- නිදර්ශන චිත්‍ර
- ඇමුණුම් අංක 2.1.2.1ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා පිටපත්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 2.1.2.1** :
- ද්‍රව්‍ය සිසුන් අතින් අත යවමින් ඒවාහි පරිමාව, හැඩය, ගති ස්වභාවය පිළිබඳ විමසන්න.
- ද්‍රව්‍ය සමූහය ගැළපෙන සේ, හොඳින් පෙනෙන පරිදි ධාරකය මත ඇස් මට්ටමට පහතින් තබන්න.
- (සියලු සිසුන්ට ද්‍රව්‍ය සමූහය පෙනෙන පරිදි (ඩෙස්ක්, පුටු අර්ධ කවාකාර ව සකසා තැබීම වැදගත් වේ.)
- ද්‍රව්‍යවල පරිමාව හා පරිමාණ ලක්ෂණ, පර්යාලෝකය, එළිය අඳුර හා ත්‍රිමාන ලක්ෂණ තලය භාවිතය පිළිබඳ සාකච්ඡා කරන්න.
- අදාළ සිද්ධාන්ත රේඛා භාවිතයෙන් දැක්වීමේ දී රේඛාවේ ශක්තීන් මතු කරන ආකාරය හා විවිධ පැන්සල් භාවිත කරනාකාරය නිදර්ශන චිත්‍ර මගින් පෙන්වා දෙන්න.

(මිනිත්තු 05 යි)

**පියවර 2.1.2.2** :
- ඇමුණුම 2.1.2.1ට අදාළ ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන්ට ලබාදෙන්න.
- චිත්‍ර අඳින ද්‍රව්‍ය හා උපකරණ ලබාදෙන්න.
- ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාවට අනුව සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ක්‍රියාකාරකමෙහි දී සිසුන්ට අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදෙන්න.
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.

(මිනිත්තු 25 යි)

පියවර 2.1.2.3 : • ප්‍රදර්ශනය කරන සිසු නිර්මාණ පිළිබඳ ස්වයං ඇගයීමකට අවස්ථාව ලබදෙන්න.
• නිර්මාණවල ප්‍රබලතා හා දුබලතා පෙන්වා දෙමින් සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.
• පහත කරුණු පිළිබඳ අවධාරණය කරමින් සමලෝචනයක යෙදෙන්න.
  - තලයට ගැළපෙන පරිදි ද්‍රව්‍ය සම්පිණ්ඩනය කිරීම
  - පරිමාව හා පරිමාණ ලක්ෂණ
  - පර්යාලෝක ලක්ෂණ
  - එළිය අඳුර හා ත්‍රිමාන ලක්ෂණ
  - රේඛාවේ විවිධත්වය

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තකසේරුකරණය සඳහා උපදෙස්:**
පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.
- ද්‍රව්‍යවල පරිමාවේ හා හැඩයේ විවිධත්වය, ගතිස්වභාවය පිළිබඳ ව විස්තර කිරීම
- තලයට ගැළපෙන සේ ද්‍රව්‍ය සමූහය පරිමාණානුකූල ව රේඛාවෙන් ඇඳීම
- පර්යාලෝක ලක්ෂණ නිසි පරිදි මතු කිරීම
- රේඛාවේ ශක්තීන් සුදුසු පරිදි යොදාගෙන එළිය අඳුර හා ත්‍රිමාන ලක්ෂණ මතු කර දැක්වීම
- නිර්මාණ ඇගයීම

ඇමුණුම 2.1.2.1

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
- ද්‍රව්‍ය එකිනෙක අතර පරිමාවේ වෙනස, විවිධ හැඩ සහ ස්වභාවයන් හඳුනාගන්න.
- ද්‍රව්‍ය සමූහයේ සමස්ත පරිමාව පිළිබඳ අවබෝධයෙන්, තලයට ගැළපෙන සේ පරිමාණානුකූල ව ද්‍රව්‍ය සමූහය රේඛාවෙන් අඳින්න.
- නිවැරදි ලෙස පර්යාලෝක ලක්ෂණ භාවිතය පිළිබඳ සැලකිලිමත් වන්න.
- ත්‍රිමාන ලක්ෂණ මතුවන සේ එළිය අඳුර දක්වන්න.
- සුදුසු පරිදි විවිධ පැන්සල් භාවිතයෙන් රේඛාවේ ශක්තීන් පෙන්වමින් ද්‍රව්‍ය අධ්‍යයනය කරන්න.
- ඔබගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

**පහත සඳහන් මාතෘකාව යටතේ තවත් ක්‍රියකාරකමක් සැලසුම් කරගන්න.**

2.1.3 ඝනකාභ හැඩැති වස්තුවක්, ගස්ලබු ගෙඩියක්, අඩක් ජලය පිරවූ වීදුරු බෝතලයක දැමූ ක්‍රෝටන් අත්තක් රේඛාවෙන් අධ්‍යයනය කරමු. - කාලච්ඡේද 02

**නිපුණතාව 2.0** : **පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.2** : **ස්වාභාවික හා නිර්මිත වස්තූන් සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**ක්‍රියාකාරකම 2.2.1** : **''ඝනකාභ හැඩැති වස්තුවක්, සිලිණ්ඩරාකාර බඳුනක දමූ ක්‍රෝටන් අත්තක්, දොඩම් ගෙඩියක් සම්පිණ්ඩනය කර වර්ණ කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- ද්‍රව්‍යවල දක්නට ලැබෙන විවිධත්වය විස්තර කරයි.
- තලය හා අවකාශය නිසි ලෙස භාවිත කර ද්‍රව්‍ය සමූහය පරිමාණානුකූල ව අඳියි.
- ද්‍රව්‍ය බලා ඇඳීමට අදාළ සිද්ධාන්ත නිසි ලෙස අනුගමනය කරයි.
- වර්ණ මාධ්‍යයට උචිත ශිල්පක්‍රම නිවැරදි ව භාවිත කරමින් ද්‍රව්‍ය සමූහය සම්පිණ්ඩනය කරයි.
- නිර්මාණ අගයයි,රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඝනකාභ හැඩැති වස්තුවක්
- සිලිණ්ඩරාකාර බඳුනක්
- පළල් පත්‍ර 5ක් පමණ ඇති ක්‍රෝටන් අත්තක්
- දොඩම් ගෙඩියක්
- භාණ්ඩ තැබීම සඳහා ධාරකයක්
- චිත්‍ර අඳින කඩදාසි
- පැන්සල්, වර්ණ මාධ්‍ය (පැස්ටල්/දිය සායම් හා පින්සල්)
- ද්‍රව්‍ය සම්පිණ්ඩන චිත්‍ර නිදර්ශන
- ඇමුණුම් අංක 2.2.1.1 ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 2.2.1.1** :
- ද්‍රව්‍ය වෙන් වෙන් ව ප්‍රදර්ශනය කරමින් ඒවායේ විවිධත්වය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
  (හැඩය, පරිමාව, ගතිස්වභාවය, වර්ණ)
- ද්‍රව්‍ය සමූහය ගැළපෙන පරිදි ධාරකය මත ඇස් මට්ටමට පහතින් සිටින සේ තබා හොඳින් නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- එක් එක් ද්‍රව්‍යවල පරිමාව, පරිමාණ ලක්ෂණ, ගති ලක්ෂණ, පර්යාලෝකය ත්‍රිමාන ලක්ෂණ, ඇස් මට්ටම දිස්වන ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- අදාළ සිද්ධාන්ත රේඛා සහ වර්ණ භාවිතයෙන් දක්වන ආකාරය නිදර්ශන චිත්‍ර ඇසුරෙන් පැහැදිලි කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 2.2.1.2** :
- ඇමුණුම 2.1.2.1 ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන්ට ලබාදෙන්න.
- චිත්‍ර අඳින ද්‍රව්‍ය හා උපකරණ බෙදා දෙන්න.
- ගවේෂණ කාර්ය උපදෙස් පත්‍රිකාවට අනුව සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන සිසුන්ට අවශ්‍ය මඟපෙන්වීම හා සහාය ලබාදෙන්න.

• සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.
(මිනිත්තු 60 යි)

**පියවර 2.2.1.3.** : • ප්‍රදර්ශන කරන සිසු නිර්මාණ පිළිබඳ ස්වයං ඇගයීමකට අවස්ථාව දෙන්න.
• නිර්මාණවල ප්‍රබලතා හා දුබලතා පෙන්වා දෙමින් සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට අනෙක් සිසුන්ට අවස්ථාව සලසන්න.
• පහත කරුණු පිළිබඳ ව අවධාරණය කරමින් සමාලෝචනයක යෙදෙන්න.
- මනා නිරීක්ෂණයෙන් ද්‍රව්‍යවල විවිධතා හඳුනා ගැනීම
- තලය හා අවකාශය නිසි ලෙස භාවිතය
- පරිමාව, පරිමාණය, පර්යාලෝකය දැක්වීම, එළිය අඳුර හා ත්‍රිමාන ලක්ෂණ මතු කිරීම
- වර්ණ මාධ්‍ය භාවිතය හා නිවැරදි ශිල්පක්‍රම අනුගමනය
(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**
පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.
- ද්‍රව්‍යවල විවිධත්වය විස්තර කිරීම
- තලය හා අවකාශය නිසි ලෙස භාවිත කර ද්‍රව්‍ය සමූහය පරිමාණානුකූල ව ඇඳීම
- අදාළ සිද්ධාන්ත නිසි පරිදි භාවිත කිරීම
- වර්ණ මාධ්‍යයට උචිත ශිල්පක්‍රම අනුගමනය කිරීම

**ඇමුණුම 2.2.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
- ද්‍රව්‍ය එකිනෙක අතර පරිමාවෙහි වෙනස, හැඩයේ, ගති ස්වභාවයේ විවිධත්වය හඳුනාගන්න.
- ද්‍රව්‍ය සමූහයේ සමස්ත පරිමාව පිළිබඳ ව අවබෝධයෙන් තලයට ගැළපෙන සේ අවකාශය නිසි පරිදි භාවිත කර ද්‍රව්‍ය සමූහය පරිමාණානුකූල ව අඳින්න.
- නිවැරදි ව පර්යාලෝක ලක්ෂණ අනුගමනය කර ඝනකාභ හැඩය අඳින්න.
- එළිය අඳුර නිසි ලෙස භාවිත කර ත්‍රිමාන ලක්ෂණ මතු කරන්න.
- යොදා ගන්නා වර්ණ මාධ්‍යයට උචිත ශිල්පක්‍රම හා උපකරණ නිවැරදි ව භාවිත කරන්න.
- ඔබගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

**පහත සඳහන් මාතෘකා යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.**

2.2.2 පෙට්ටියක්, කුඩා මැටි කළයක්, විනිවිද පෙනෙන බෝතලයක දමූ අරලිය මල් සහ කොළ සහිත අත්තක් සම්පිණ්ඩනය කර වර්ණ කරමු. (කාලච්ඡේද 02)

2.2.3 විශාල ප්‍රමාණයේ පොතක්, ඇන්තූරියන් මල් පැළයක් සහිත පෝච්චියක්, රෙදිකඩක් සම්පිණ්ඩනය කර වර්ණ කරමු. (කාලච්ඡේද 02)

**2.2.4** ඝනක හැඩති වස්තුවක්, ගස්ලබු ගෙඩියක්, පළල් පත්‍ර සහිත අත්තක් (කොට්ටම්බා වැනි), රෙදි කඩක් සම්පිණ්ඩනය කර වර්ණ ගන්වමු. (කාලච්ඡේද 02)

**නිපුණතාව 3.0 :** **පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.1 :** **උද්භිද සහ සත්ත්ව ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි ඒකක හා වර්ණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 3.1.1 :** **''කුඩරෙද්දක් සඳහා සැරසිල්ලක් නිර්මාණය කරමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03 යි

**ඉගෙනුම් පල :**
- උද්භිද ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි ඒකක නම් කරයි.
- විසිතුරු කරන ලද සාම්ප්‍රදායික පුෂ්ප හැඩ පාරිභාරික නිර්මාණ සඳහා යොදා ගන්නා අයුරු විස්තර කරයි.
- සැරසිලි ඒකකයේ හැඩයට ගැළපෙන පරිදි සැරසිලි මෝස්තර නිර්මාණය කරයි.
- ගැළපෙන පරිදි වර්ණ ගන්වයි.
- නිම වූ සැරසිලි මෝස්තරය රස විඳියි. අගය කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම් :**
- ඇමුණුම 3.1.1.1ට ඇතුළත් ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකා
- සාම්ප්‍රදායික මල් සැරසිලි මෝස්තර ඒකක භාවිත කර සැරසිලි කළ කුඩයක්
- පතොරම ලෙස බ්‍රිස්ටල් බෝඩ්වලින් වෘතයක 1/8 ප්‍රමාණයේ හැඩයට කපන ලද වෘත අවශ්‍ය පමණ (කණ්ඩායමට එක බැගින්)
- ජ්‍යාමිතික උපකරණ, කතුරු, ඇලවුම් ද්‍රව්‍ය
- බ්‍රිස්ටල් බෝඩ්, පිටපත් කිරීමේ කඩදාසි, ඩිමයි කඩදාසි
- වර්ණ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 3.1.1.1 :
- සැරසිලි කරන ලද කුඩය සිසුන් ඉදිරියේ ක්ෂණික ව දිග හරින්න.
- එහි සැරසිලි පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු අවධාරණය වන පරිදි සාකච්ඡාවක නිරත වන්න.
  - බොහෝ විට කුඩ රෙද්දක් සමාන කොටස් 8කින් යුක්ත වන බව
  - කුඩ රෙද්දක් සැරසිලි කිරීමේදී සාම්ප්‍රදායික චිත්‍රවල යෙදෙන පුෂ්ප හැඩ නිර්මාණාත්මක ව භාවිත කළ හැකි බව
  - භාණ්ඩයට හා මාධ්‍යයට ගැළපෙන අයුරින් වර්ණ භාවිත කිරීමේ දී සැලැකිලිමත් විය යුතු බව

(මිනිත්තු 10 යි)

**පියවර 3.1.1.2 :**
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න. (කණ්ඩායමකට සිසුන් සංඛ්‍යාව 8ක් වන පරිදි )
- ඇමුණුම 3.1.1.1ට ඇතුළත් ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකා කණ්ඩායමකට එක බැගින් බෙදා දෙන්න.
- සකස් කර ගත් පතොරම් කණ්ඩායමට එක බැගින් ලබා දෙන්න.
- ද්‍රව්‍ය හා උපකරණ අවශ්‍ය වූ විට බෙදා දෙන්න.
- නිම කළ නිර්මාණ ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

(මිනිත්තු 90 යි)

**පියවර 3.1.1.3 :**
- කණ්ඩායම් නිර්මාණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- අදහස් ප්‍රකාශ කිරීමට හා විචාරයට අවස්ථාව ලබාදෙන්න.

• ලබා ඇති ශක්‍යතා මට්ටම අවබෝධ කර ගනිමින් ඉදිරි සංවර්ධනය සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 20 යි)

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- සාම්ප්‍රදායික මල් මෝස්තර නම් කිරීම
- සාම්ප්‍රදායික පුෂ්ප හැඩ ඇසුරින් සැරසිලි නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කිරීම
- සාම්ප්‍රදායික මල් මෝස්තර ඇසුරින් කුඩ රෙද්දකට සුදුසු සැරසිල්ලක් නිර්මාණය කිරීම
- වඩාත් උචිත සැරසිල්ල කණ්ඩායමේ නිර්මාණ අතරින් තේරීම
- සාධනීය ඉලක්කයක් සඳහා සාමූහික ව ක්‍රියා කිරීම

**ඇමුණුම 3.1.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබ ඉදිරියේ ඇති ආදර්ශය හොඳින් නිරීක්ෂණය කරන්න.
- කණ්ඩායමේ සෑම සිසුවකු ම ලබා දී ඇති පතරොමේ හැඩයට ගැළපෙන සේ, ප්‍රදර්ශනය කර ඇති සාම්ප්‍රදායික මල් ඇසුරින් මෝස්තරයක් නිර්මාණය කරන්න.
- ඔබට රිසි පරිදි සාම්ප්‍රදායික පුෂ්ප හැඩ නිර්මාණාත්මක ව සකස් කළ හැකි ය.
- අවශ්‍යතාවට අනුව ජ්‍යාමිතික උපකරණ භාවිත කරන්න.
- කණ්ඩායමේ සෑම සිසුවකු ම නිර්මාණය කරන ලද සැරසිලි මෝස්තරවලින් සුදුසු ම ඒකකය තෝරා ගන්න.
- තෝරාගත් සැරසිලි ඒකකය කණ්ඩායමේ සියලු දෙනා ම පිටපත් කිරීමේ කඩදාසි ආධාරයෙන් පිටපත් කර ගන්න.
- කණ්ඩායමේ සියලු ම නිර්මාණ එක සේ වර්ණ ගන්වන්න.
- බාහිර රේඛා යොදමින් සැරසිලි ඒකකය මතු කරන්න.
- එක් එක් කණ්ඩායමේ නිම වූ සැරසිලි ඒකක සපයන ලද බ්‍රිස්ටල් බෝඩ් එක මත දිග හරින ලද කුඩයක හැඩය මතුවන සේ ක්‍රමවත් ව අලවන්න.
- කණ්ඩායමේ නිර්මාණය පන්තියට ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරන්න.

**පහත මාතෘකාව යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.**

3.1.2 සත්ත්ව ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර නිර්මාණාත්මක ව භාවිත කරමින් ලීයෙන් තැනූ දොරකට සුදුසු නිර්මාණයක් සැලසුම් කරමු. -කාලච්ඡේද 03

**නිපුණතාව 3.0 : පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.2 : රෙදිපිළි සඳහා ව්‍යාප්ත සැරසිලි නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 3.2.1 : ''කාන්තා / පිරිමි භාවිතයට සුදුසු රෙදිපිළි සඳහා ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි

**ඉගෙනුම් පල** :
- ස්වාභාවික හා නිර්මිත හැඩ ව්‍යාප්ත සැරසිලි සඳහා යොදාගත හැකි බව ප්‍රකාශ කරයි.
- එම හැඩ නිර්මාණාත්මක ව භාවිත කළ හැකි බව ප්‍රකාශ කරයි.
- නිර්මාණය කරන ලද සැරසිලි ඒකකය විධිමත් රටාවකට ව්‍යාප්ත කරමින් මෝස්තරය සැලසුම් කරයි.
- උචිත පරිදි ජ්‍යාමිතික උපකරණ භාවිත කරයි.
- උචිත ශිල්ප ක්‍රම භාවිත කරමින් වර්ණ ගන්වයි.
- අනුපිළිවෙළින් කාර්යයක නිරත වෙයි.
- රසවිඳියි, අගයයි.
- සංයමයෙන් යුතු ව කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- මෝස්තර නිර්මාණකරණයට යොදා ගත හැකි විවිධ ද්‍රව්‍ය
  - ස්වාභාවික හැඩ (මල්, කොළ, ගෙඩි, ශාක සහ සත්ත්ව රූප)
  - නිර්මිත හැඩ (අක්ෂර, ජ්‍යාමිතික හැඩ සහ වියුක්ත හැඩ)
  - ව්‍යාප්ත සැරසිලි සහිත පාරිභාරික ද්‍රව්‍ය (රෙදිපිළි, තෑගි දවටන, ඉටිරෙදි, බඳුන්)
- ව්‍යාප්ත සැරසිලි සහිත නිදර්ශන චිත්‍ර
- පිටපත් කිරීමේ කඩදාසි, චිත්‍ර අඳින කඩදාසි, ජ්‍යාමිතික උපකරණ, වර්ණ මාධ්‍ය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 3.2.1.1** :
- සපයාගත් ඉගෙනුම් ආධාරක සුදුසු ක්‍රමවේදයක් භාවිත කර පන්තියේ ප්‍රදර්ශනය කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරවන්න.
  - අවශ්‍යතාව
  - හැඩය, වර්ණ
  - ඒකකයක් නිර්මාණය කිරීම
  - ව්‍යාප්තිය
  - ජ්‍යාමිතික උපකරණ භාවිතය

(මිනිත්තු 15 යි)

**පියවර 3.2.1.2** :
- ඇමුණුම 3.2.1.1ට අදාළ ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන්ට බෙදාදෙන්න.
- නිර්මාණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සිසුන්ට බෙදාදෙන්න.
- ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාවට අනුව සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- අවශ්‍ය තැන්හි දී ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ දෙමින් සහාය වන්න.
- සිසු නිර්මාණ පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි)

**පියවර 3.2.1.3** : 
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ස්වයං ඇගයීමට ඉඩ ලබාදෙන්න.
- අන් අයගේ නිර්මාණ ඇගයීමට සිසුන් මෙහෙයවන්න.
- නිර්මාණයේ නිමාව, හැඩ, සංගත විසංගත වර්ණ භාවිතය, නිවැරදි උපකරණ භාවිතය හා නිර්මාණශීලීත්වය ආදි මූලික කරුණු මතු කරමින්
- සමස්ත ක්‍රියාවලිය පිළිබඳ කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ස්වාභාවික හා නිර්මිත හැඩ ඇසුරින් සැරසිලි ඒකකයක් නිර්මාණය කිරීම
- ව්‍යාප්ත සැරසිල්ල නිර්මාණයේ දී සැරසිලි ඒකක සමබර ව භාවිත කිරීම
- සැරසිලි මෝස්තර සඳහා නිවැරදි ව ජ්‍යාමිතික උපකරණ භාවිත කිරීම
- නිර්මාණයේ පිරිසිදු බව, සියුම් බව සහ ගුණාත්මක නිමාව

**ඇමුණුම 3.2.1.1**

## ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබ වෙත ඉදිරිපත් කරන ලද ඉගෙනුම් ආධාරක හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබ අභිමත පරිදි ස්වාභාවික හෝ නිර්මිත සැරසිලි හැඩ හෝ ඇසුරින් මෝස්තර ඒකකයන් හෝ කිහිපයක් හෝ නිර්මාණය කරන්න.
- ඔබ නිර්මාණය කරගත් මෝස්තර ඒකක අතුරින් සුදුසු ඒකකයක් තෝරාගන්න.
- තෝරාගත් සැරසිලි ඒකකය, පිටපත් කිරීමේ කඩදාසිය භාවිතයෙන් විධිමත් රටාවකට අනුව, චිත්‍ර අඳින කඩදාසිය මත පිටපත් කරගන්න.
- එහි දී පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන්න.
  - තලයට උචිත පරිදි ව්‍යාප්තිය සැලසුම් කිරීම
  - නිවැරදි මිනුම් ක්‍රම භාවිතය (ජ්‍යාමිතික උපකරණ භාවිතය)
  - ඒකකය නැවත නැවත යෙදීම
  - ව්‍යාප්තිය සඳහා තලය භාවිතයේ දී එකපසෙක සැරසිලි ඒකකයක කොටසක් යෙදෙන විට, එහි ඉතිරි කොටස ඒකකය සම්පූර්ණ වන පරිදි අනෙක් පස යෙදීම
  - වර්ණ කිරීමේ දී සංගත හෝ විසංගත වර්ණ භාවිත කරන්න.
  - මාධ්‍යයට උචිත ශිල්පක්‍රම අනුගමනය කරන්න.
  - පිරිසිදු බව, සියුම් බව සහ ගුණාත්මක නිමාව පිළිබඳ ව සැලකිලිමත් වන්න.
  - අවශ්‍ය තැන්හි දී ගුරු උපදෙස් හා සහය ලබාගන්න.

**පහත සඳහන් මාතෘකාව යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න.**

3.2.2. ළමයින්ට සුදුසු ඇතිරිල්ලක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක් - කාලච්ඡේද 03

**නිපුණතාව 3.0 : පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.3 : පාරිභාරික අවශ්‍යතා සඳහා නවතාවකින් යුතු සැලසුම් චිත්‍රණය කරයි.**

**ක්‍රියාකාරකම 3.3.1 : ''නවතාවකින් යුතු වෙස් මුහුණක් චිත්‍රණය කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- විවිධ වෙස් මුහුණු වර්ග පිළිබඳ ව විස්තර කරයි.
- වෙස් මුහුණු සඳහා භාවිත හැඩ, සැරසිලි සහ වර්ණ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- නිර්මාණාත්මක වෙස් මුහුණක් සඳහා දළ සටහන් අඳියි.
- උචිත ශිල්පක්‍රම භාවිත කර වර්ණ ගන්වයි.
- සංයමයෙන් යුතු ව කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නිදර්ශන වෙස් මුහුණු, ඡායාරූප, රූප සටහන්
- චිත්‍ර අඳින කඩදාසි, වර්ණ සහ පින්සල්, පැස්ටල්
- ඇමුණුම 3.3.1.1ට අදාළ රූපසටහන් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම්කිරීම සඳහා උපදෙස්**

**පියවර 3.3.1.1.** :
- දෙස් විදෙස් වෙස් මුහුණු/ ඡායාරූප/ චිත්‍ර අභිමත ක්‍රමවේදයකට අනුව සිසුන් වෙත ඉදිරිපත් කරන්න. (ඒ සඳහා ඇමුණුම 3.3.1.1 රූපසටහන් පත්‍රිකාව හා 6.1.1.1ට අදාළ කියවීම් පත්‍රිකාවේ ශ්‍රී ලාංකේය වෙස් මුහුණු ද අවධානයට ලක් කළ හැකි ය.)
- පහත දැක්වෙන කරුණු අවධාරණය වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.
  – විවිධ සම්ප්‍රදායයන්ට හා සංස්කෘතීන්ට අයත් වෙස් මුහුණු ලක්ෂණ
  –භාවිත හැඩ සැරසිලි සහ වර්ණ අමුද්‍රව්‍යවල විවිධත්වය

(මිනිත්තු 20 යි)

**පියවර 3.3.1.2** :
- දෙස් විදෙස් විවිධ වෙස් මුහුණු ඇසුරින් නවතම වෙස් මුහුණක් චිත්‍රණයට මඟ පෙන්වන්න.
- සරල හැඩ හා සංකේතාත්මකව වර්ණ භාවිතයට උපදෙස් දෙන්න.
- අවශ්‍ය තැන්හි දී ජ්‍යාමිතික උපකරණ භාවිතයට මඟපෙන්වන්න.
- අවශ්‍ය තැන්හි ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය දෙමින් සහායවන්න.
- සිසු නිර්මාණ පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 3.3.1.3** :
- සිසු නිර්මාණ ප්‍රදර්ශනයට අවස්ථාව ලබාදෙන්න.
- ස්වයං ඇගයීමට ඉඩ ප්‍රස්ථාව ලබාදෙන්න.
- අන් අයගේ නිර්මාණ ඇගයීමට හා රසවිඳීමට සිසුන් මෙහෙයවන්න.
- සැරසිලි රටා විචිත්‍ර ව භාවිත කර නව්‍යතාවකින් යුතු නිර්මාණයක් කළ හැකි බව අවධාරණය කරන්න.
- සමස්ත ක්‍රියාවලිය පිළිබඳ ව සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.
- විවිධ වෙස් මුහුණු පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කිරීම
- වෙස් මුහුණු සඳහා දළ සටහන් ඇඳීම

• සුදුසු සැරසිලි මෝස්තර සහ වර්ණ භාවිත කිරීම
• නිවැරදි ශිල්පක්‍රම අනුගමනය කිරීම

ඇමුණුම 3.3.1.1

**රූපසටහන් පත්‍රිකාව**











**පහත සඳහන් මාතෘකා යටතේ තවත්ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

3.3.2 ලියුම් රඳවනයක් ලෙස භාවිත කළ හැකි බිත්ති සැරසිල්ලක් අඳිමු (කාලච්ඡේද 03)

3.3.3 වියුක්ත සත්ත්ව හැඩයක් ඇසුරෙන් ඉටිපන්දම් රඳවනයක් අඳිමු. (කාලච්ඡේද 02)

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.1** : **විවිධ අවශතා සඳහා පෝස්ටර් චිත්‍ර හා ලේබල් නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 4.1.1** : **''වන සම්පත සුරකිමු'' තේමාව සඳහා පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි

**ඉගෙනුම් පල** :
- පෝස්ටර් චිත්‍ර ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙස භාවිත වන බව විස්තර කරයි.
- පෝස්ටර් චිත්‍රයක ඇති මූලික අංග විස්තර කරයි.
- යෝජිත මාතෘකාවක් යටතේ පෝස්ටර් චිත්‍ර අඳියි.
- තෝරා ගත් මාතෘකාවට උචිත සංකේත අක්ෂර හා වර්ණ භාවිත කරයි.
- නිර්මාණකරණයේ දී සංයමයෙන් යුතු ව කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 4.1.1.1ට අදාළ ගවේෂණ//කාර්ය උපදෙස් පත්‍රිකා
- පිටපත් කරන කඩදාසි, ජ්‍යාමිතික උපකරණ, ඩ්‍රෝවින් කඩදාසි, පැන්සල්
- පෝස්ටර් සායම්, දියසායම්, පින්සල්
- A4 ප්‍රමාණයේ කඩදාසි තුනක නිර්මාණය කළ විවිධ නිර්මාණ තුනක්

  උදා-
  – පාසලේ නිවාසාන්තර තරගය පිළිබඳ ව දැන්වීමක් (24 ප්‍රමාණයේ අකුරු)
  – සරල සංකේත යොදා සකස් කළ පෝස්ටර් චිත්‍රයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 4.1.1.1** :
- විදුහල්පතිතුමාගේ අවසරය අනුව විද්‍යාලයයේ ප්‍රධාන දැන්වීම් පුවරුවේ පෝස්ටර් චිත්‍රය අලවන්න.
- කාලච්ඡේදය ආරම්භයේ දී පන්තියේ සිසුන් සියලු දෙනා දැන්වීම් පුවරුව වෙත කැඳවන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සිසුන් සමඟ සංවාදයක යෙදෙන්න.
  - දැන්වීම් හා පොස්ටර් යන අංග ග්‍රැෆික් චිත්‍රවලට අයත් බව
  - දැන්වීම හා පොස්ටර් චිත්‍රය අතර වෙනසක් ඇති බව
  - පෝස්ටර් චිත්‍ර මඟින් පණිවුඩය වඩා වේගවත් ව හා නිර්මාණශීලි ව සන්නිවේදනය කළ හැකි බව
  - සිරස් අතට පෝස්ටර් නිර්මාණය කිරීම වඩාත් සුදුසු බව
  - තේමාවට අදාළ සංකේත හා සරල හැඩතල භාවිතයෙන් පණිවුඩය වඩාත් හොඳින් සන්නිවේදනය වන බව
  - සුදුසු වර්ණ හා අක්ෂර භාවිතයෙන් පණිවුඩය තව දුරටත් තීව්‍ර වන බව
  - ආකර්ෂණීය බව හා මනා නිමාවකින් යුක්ත වීම

(මිනිත්තු 10 යි)

**පියවර 4.1.1.2** :
- ඇමුණුම 4.1.1.1ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව

වෙත සිසු අවධානය යොමු කරන්න.
- ලබා දී ඇති මාතෘකාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- ක්‍රියාකාරකම අතරතුර අවශ්‍ය මග පෙන්වීම සිසුන් වෙත ලබාදෙන්න.
- නිම කළ කෘති පන්ති කාමරයේ ප්‍රදර්ශනය සඳහා ඉඩ ප්‍රස්තාව ලබාදෙන්න.

(මිනිත්තු 90 යි)

පියවර 4.1.1.3

- වන සම්පත සුරකිමු තේමාව සඳහා නිර්මාණය කළ විවිධ පෝස්ටර් චිත්‍ර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- නිර්මාණ පිළිබඳ ව සිසු අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ප්‍රස්තාව ලබාදෙන්න.
- පහත සඳහන් කරුණු මූලික කර ගනිමින් තවදුරටත් සංවර්ධනය විය යුතු අංග පිළිබඳ ව සමාලෝචනයක යෙදෙන්න.
  - පෝස්ටර් චිත්‍රය ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් බව
  - තේමාව අදාළ වන පාඨක සමාජයට පහසුවෙන් ග්‍රහණය කළ හැකි ලෙස රූප, සංකේත, අක්ෂර, හා වර්ණ භාවිත කළ යුතු බව
  - හොඳ නිමාවක් සහිත වීම
  - සරල ගැළපෙන හා තේමාව වඩාත් තීව්‍ර වන වගන්ති භාවිත කළ යුතු බව

(මිනිත්තු 10 යි)

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- පෝස්ටර් චිත්‍ර ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් බව අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- පෝස්ටර් චිත්‍රයක තිබිය යුතු මූලික කරුණු විස්තර කිරීම
- තේමාවට ගැළපෙන සරල හැඩ හා සංකේත භාවිතයෙන් පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කිරීම
- මාතෘකාවට උචිත වර්ණ ගළපා ගැනීම
- නිර්මාණශීලී ව හා කලාත්මක ව ඉදිරිපත් කිරීම

**ඇමුණුම 4.1.1.1**

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය වූ දැන්වීම හා පෝස්ටර් චිත්‍රය වෙත අවධානය යොමු කරන්න.
- දැන්වීම හා පෝස්ටර් චිත්‍ර අතර වෙනස නිරීක්ෂණය කරන්න.
- දැන්වීම් පුවරුවේ හා පන්ති කාමරයේ පෙන්වන විවිධ පෝස්ටර් චිත්‍රවල වර්ණ භාවිතය, සංකේත භාවිතය අධ්‍යයනය කරන්න.
- සරල බව, ප්‍රකාශනයේ තීව්‍ර භාවය හොඳින් නිරීක්ෂණය කරන්න.
- 'වන සම්පත සුරකිමු' තේමාවට සුදුසු සරල සංකේත රූප හා හැඩතල යොදමින් දළ සැලසුම සකස් කරන්න.
- පිටපත් කිරීමේ කඩදාසි මඟින් චිත්‍ර අඳින කඩදාසියට දළ සැලසුම පිටපත් කරන්න.
- පණිවුඩය තීව්‍ර කිරීම සඳහා සුදුසු පරිදි අක්ෂර යොදන්න.
- මාතෘකාවට ගැළපෙන වර්ණ භාවිත කරන්න.
- නිම කළ කෘතිය ප්‍රදර්ශනය සඳහා සූදානම් කරන්න

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.1** : **විවිධ අවශ්‍යතා සඳහා පෝස්ටර් චිත්‍ර හා ලේබල් නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 4.1.2** : **''විවිධ අවශ්‍යතා සඳහා ලේබල් නිර්මාණය කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි

**ඉගෙනුම් පල** :
- ලේබලයක තිබිය යුතු මූලික අංග හඳුනා ගනිමින් විස්තර කරයි.
- අසුරනයේ හැඩය, යොදා ගත් මාධ්‍ය, භාවිත වන ස්ථානය අනුව ලේබලය නිර්මාණය කළ යුතු බව පැහැදිලි කරයි.
- තෝරා ගත් භාණ්ඩයේ ගති ලක්ෂණ අවබෝධ කර ගනිමින් උචිත ලේබලයක් නිර්මාණය කරයි.
- පාරිභෝගික ආකර්ෂණය සඳහා ලේබලයේ නිමාව වැදගත් වන බව ප්‍රකාශ කරයි.
- අන් අයගේ නිර්මාණ අවබෝධයෙන් යුතු විචාරයට ලක් කරයි.
- නිර්මාණ රස විඳියි.

**ගුණාත්මක යෙදුම්** :
- ඇමුණුම 4.1.2.1ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා
- පිටපත් කරන කඩදාසි, ජ්‍යාමිතික උපකරණ, ඩ්‍රෝවින් කඩදාසි, පැන්සල්
- පෝස්ටර් සායම්, දියසායම්, පින්සල්
- විවිධ මාධ්‍යයෙන්, හැඩයෙන් හා ප්‍රමාණයෙන් නිෂ්පාදනය කළ බහාලුම් හා ඇසුරුම්
- විවිධ හැඩති ලේබල්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 4.1.2.1** :
- පෙර දිනයේ සූදානම් කර ගත් පරිදි විවිධ මාධ්‍යයෙන්, හැඩයෙන් හා ප්‍රමාණයෙන් නිෂ්පාදනය කළ බහාලුම් හා ඇසුරුම් සහිත විශාල ප්‍රමාණයේ භාජනයක් ගුරු මේසය මත තබන්න.
- තෝරා ගත් සිසුන් කිහිප දෙනෙකු ගුරු මේසය වෙත කැඳවා එක් භාණ්ඩයක් (ඇසුරුමක් හෝ බහාලුමක් හෝ) අහඹු ලෙස තෝරා ගැනීමට උපදෙස් දෙන්න.
- ඔවුන් සියලු දෙනා ගුරු මේසය දෙපස රඳවා ගන්න.
- සිසුන් අත ඇති නිෂ්පාදනයේ මුද්‍රිත තොරතුරු පන්තියේ අනෙක් සිසුන් වෙත ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සිසුන් සමඟ සාකච්ඡාවක නිරත වන්න.
  - ලේබල් නිර්මාණය ග්‍රැෆික් සැලසුම් ගණයට අයත් වන බව
  - භාණ්ඩ ප්‍රචාරණය සඳහා ලේබලය වැදගත් වන බව
  - ඇසුරුමේ හෝ බහාලුමේ හෝ ප්‍රමාණය මාධ්‍යය හා හැඩයට අනුරූපී ව, ලේබලයේ ස්වභාවය නිර්මාණශීලී ව වෙනස් කළ හැකි බව
  - ලේබලයේ විස්තරාත්මක බව, සරල බව හා ආකර්ෂණීය බව පාරිභෝගික අවධානය කෙරෙහි වැදගත් බව
  - නිෂ්පාදනය සඳහා යෙදෙන නම් අක්ෂර, වර්ණ වැනි දේ මුද්‍රණය සඳහා උචිත විය යුතු බව

(මිනිත්තු 15 යි)

පියවර 4.1.2.2. :
- එක් කණ්ඩායමකට සිසුන් 3-4ක් පමණ වන සේ සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 4.1.2.1ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාවේ පිටපත් සිසුන් අතර බෙදාදෙන්න.
- එක් එක් කණ්ඩායමට ගවේෂණ/කාර්ය පත්‍රිකාවේ සඳහන් අයුරින් මාතෘකා වෙන් කර බෙදා දෙන්න.
- සඳහන් උපදෙස් පරිදි තෝරා ගත් නිර්මාණයට උචිත ලේබලය සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.
- වෙළඳ නාමය, සරල හා සිත්ගන්නා සුලුවීම භාවිත වන වර්ණ හා අක්ෂර පිළිබඳ අවබෝධය අවශ්‍ය තැන්හි දී ලබාදෙන්න.
- නිම වූ කෘති පන්තියේ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 55 යි)

පියවර 4.1.2.3 :
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- සංවර්ධනාත්මක අදහස් සහිත ඇගයීම් අවස්ථාවකට සිසුන් යොමු කරවන්න.
- තව දුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා පිළිබඳ පැහැදිලි කරදෙන්න.
- ග්‍රැෆික් නිර්මාණකරණයේ දී සැලකිලිමත් විය යුතු පිරිසිදු බව, සියුම් නිමාව, මුද්‍රණයට සුදුසු බව යන කරුණු පිළිබඳ අවබෝධය ලබාදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය පිළිබඳ උපදෙස්:**
පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.
- ලේබලයක තිබිය යුතු මූලික අංග විස්තර කිරීම
- පාරිභෝගික අවධානය සඳහා ලේබලයේ ආකර්ෂණීය ලෙස සැලසුම් කිරීම
- දෙන ලද ආදර්ශයක් අධ්‍යයනය කරමින් භාණ්ඩයට උචිත ලේබලයක් නිර්මාණය කිරීම
- උචිත ලෙස අක්ෂරකරණය හා වර්ණ භාවිත කිරිම
- පිරිසිදු බව, සියුම් නිමාව, මුද්‍රණයට සුදුසු නිම කිරීම

**ඇමුණුම 4.1.2.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- කණ්ඩායම් සඳහා එක් එක් මාතෘකාව බෙදා ගන්න.
  1. **කණ්ඩායම** - පානීය ජලය ඇසුරුමක් සඳහා ලේබලයක්.
  2. **කණ්ඩායම** - ළදරු සුවඳ කොලෝන් ඇසුරුමක පිටත ඇලවීම සඳහා සුදුසු ලේබලයක්
  3. **කණ්ඩායම** - පැණි බීම වර්ගයක් ඇසුරු බෝතලයක ඇලවීම සඳහා සුදුසු ලේබලයක්
  4. **කන්ඩායම** - කුළුබඩු ඇසුරුමක මූණතෙහි ඇලවීම සඳහා සුදුසු ලේබලයක්
- ගුරු භවතා විසින් තම කණ්ඩායම වෙත ලබා දුන් මාතෘකාව අධ්‍යයනය කරන්න.
- ඒ සමඟ ගැළපෙන ආදර්ශ ආකෘතියක් ගුරු මේසය මත ඇති බඳුනෙන් තෝරා ගන්න.
- ආදර්ශය හොඳින් නිරීක්ෂණය කරන්න.
- රළු කඩදසියේ උචිත ආකාරයට ලේබලය ඇඳ ගන්න.
- අවශ්‍ය තැන්හි දී ජ්‍යාමිතික උපකරණ භාවිත කරන්න.
- ගුරු භවතාගේ උපදෙස් විමසමින් අඳින ලද රේඛා සටහන තව දුරටත් නිවැරදි කර ගන්න.
- ට්‍රේසින් කඩදාසිය භාවිත කරමින් ඩ්‍රෝවින් කඩදාසියට රේඛා සටහන පිටපත් කරන්න.
- පළමු ව පසුබිම හා නිර්මාණය කළ හැඩතල හෝ රූප හෝ වර්ණ කරන්න.
- සුදුසු පින්සලෙන් ගැළපෙන වර්ණ යොදා අක්ෂර හා රේඛා සැරසිලි වර්ණ කරන්න.
- නිම කළ කෘතිය ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 4.2** : **ළමා කතන්දර පොතකට සුදුසු පිටකවරයක් නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 4.2.1** : **''ළමා පොත් පිටකවරයක් නිර්මාණය කරමු.''**

**කාලච්ඡේදසංඛ්‍යාව** : 03යි

**ඉගෙනුම් පල** :
- ළමා පොතක පිට කවරයෙහි තිබිය යුතු සුවිශේෂ අංග විස්තර කරයි.
- පාඨක අවධානය සඳහා පිටකවරය ආකර්ෂණීය ව තිබිය යුතු බව ප්‍රකාශ කරයි.
- අක්ෂරකරණයේ දී තිබිය යුතු සරල බව හා සියුම් නිමාව පිළිබඳ ව සැලකිල්ලෙන් කටයුතු කරයි.
- උපකරණ භාවිතය පිළිබඳ හුරුව ප්‍රදර්ශනය කරයි.
- අදාළ නියැදිය හා ගැළපෙන අයුරින් පොත් පිට කවරයක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 4.2.1.1ට අදාළ ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකා
- ඩ්‍රෝවින් කඩදාසි
- ජ්‍යාමිතික උපකරණ, පින්සල්, දියසායම්,පෝස්ටර් සායම්
- සපයාගත් මුද්‍රිත ළමා පොත් පිටකවර ආදර්ශ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 4.2.1.1** :
- පෙර දිනයක දැනුම් දීමෙන් අනතුරු ව සිසුන් විසින් සපයා ගැනුණු ළමා කතන්දර පොත් සියල්ල එක්රැස් කර පන්ති කාමරය පොත් ප්‍රදර්ශන කුටියක් ලෙස පිළියෙළ කිරීමට උපදෙස් ලබාදෙන්න.
- 'වාර්ෂික පොත් ප්‍රදර්ශනය' 'ළමා පොත් අංශය' වැනි වැකි සහිත පුවරු සුදුසු ස්ථානවල සවි කරන්න.
- පොත් ප්‍රදර්ශනය නැරඹීම සඳහා සියලු ම සිසුන් වෙත ඉඩ ප්‍රස්තාව ලබාදෙන්න.
- සිසුන්ගේ නිරීක්ෂණයට ලක් වූ ළමා පොත් ඇසුරු කර ගනිමින් පොතක පිට කවරය, සැලසුම, රූප, වර්ණ හා අක්ෂර පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසමින් සංවාදයක යෙදෙන්න.
- පොත් පිටකවර නිර්මාණය ග්‍රැෆික් සැලසුම් ගණයට අයත් වන බව ප්‍රකාශ කරන්න.
- ළමා පොත් පිටකවරය නිර්මාණය කිරීමේ දී අදාළ නියැදිය හා ගැළපෙන අයුරින් නම, රූප රචනය, වර්ණ හා ප්‍රමාණය භාවිත කළ යුතු බව අවධාරණය කරන්න.
- නිර්මාණකරණයේ දී මුල් හා පසුකවරය මෙන් ම පොතේ සනකම පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු බව සිහිපත් කරන්න.

(මිනිත්තු 12 යි)

පියවර 4.2.1.2 :
- ගැළපෙන පරිදි අවම සංඛ්‍යාව සිසුන් 4-5 පමණ වන සේ කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 4.2.1.1ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාවේ පිටපත් සිසුන් අතර බෙදා දෙන්න.
- පොත් පිටකවරයේ මුල් පිටුව, පසු පිටුව, ගනකම හා ප්‍රමාණය සැලසුම් කරන අයුරු ගුරු ආදර්ශ මඟින් පැහැදිලි කරන්න.
- ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව අනුව ළමා පොත් පිට කවරය නිම කර පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50 යි)

පියවර 4.2.1.3 :
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- එම නිර්මාණ පිළිබඳ ව සිසු අදහස් විමසමින් ගුරු අදහස් ප්‍රකාශ කරන්න.
- ලබා ඇති ශක්‍යතා මට්ටම අවබෝධ කර ගනිමින් තව දුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා පැහැදිලි කර දෙන්න.
- ග්‍රැෆික් නිර්මාණකරණයේ දී සැලකිලිමත් විය යුතු පිරිසිදු බව, සියුම් බව, නිමාව හා පාරිභෝගික ආකර්ෂණය පිළිබඳ විස්තර කරන්න.

(මිනිත්තු 18 යි)

**ඇගයීම තක්සේරුකරණය පිළිබඳ උපදෙස්:**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- පොත් පිට කවරයක තිබිය යුතු මූලික අංග පිළිබඳ විස්තර කිරීම
- නිර්මාණකරණයේ දී යෝජිත පොතෙහි නම්. අනෙකුත් නාම, අක්ෂර අදාළ නියැදිය හා හොඳින් ගැළපෙන බව පිළිගැනීම හා ප්‍රකාශ කිරීම
- සරල සිත් ගන්නා සුලු රූප හැඩතල හා වර්ණ භාවිත කරමින් පොත් පිට කවරය නිර්මාණය කිරීම
- අන් අයගේ නිර්මාණ අගය කිරීම

**ඇමුණුම 4.2.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- පන්ති කාමරයේ ප්‍රදර්ශනය කර ඇති ආදර්ශ මඟින් පොත් පිට කවරයේ සැලකිලිමත් විය යුතු මූලික අංග පිළිබඳ ව අවබෝධය ලබා ගන්න.
- සපයාගත් ඩ්‍රෝවින් කඩදාසිය මත ජ්‍යාමිතික උපකරණ භාවිතයෙන් අවශ්‍ය පරිදි පොත් පිට කවරයේ මුල් පිටුව, ගනකම, පසු පිටුව හා ප්‍රමාණය සලකුණු කරගන්න.
- පොත් කවරය සඳහා තෝරා ගත් ප්‍රමාණයේ වෙනත් රළු කඩදාසියක මුල් හා පසු පිට සඳහා රේඛා සටහන් යෝජිත නම, කර්තෘ නාමය හා වෙනත් හැඩතල සැලසුම් කරන්න.
- නැවත ඩ්‍රෝවින් කඩදාසිය මත, යොදා ගත් රූප හා හැඩතල ට්‍රේසින් කඩදාසියක් උපකාරයෙන් පිටපත් කරන්න.
- උචිත වර්ණ යොදා චිත්‍රණය කරන්න.
- අක්ෂර පසුබිමෙන් වඩා මතුවන සේ ගැළපෙන වර්ණ යොදන්න. මෙහි දී සියුම් නිමාව හා රේඛාකරණයට සුදුසු පින්සල් භාවිත කරන්න.
- පොත් පිට කවරයේ කැපෙන හා නැමෙන මායිම් කඩ ඉරිවලින් සලකුණු කරන්න.
- අවශ්‍ය තැන්හි දී ගුරු උපදෙස් ලබමින් නිර්මාණය අවසන් කර ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.3** : **සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 4.3.1** : **''ළමා කතාවක තෝරාගත් අවස්ථාවක් චිත්‍රණය කරමු.'**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි

**ඉගෙනුම් පල** :
- සන්නිදර්ශන චිත්‍ර යන්න පැහැදිලි කරයි.
- ළමා නිර්මාණයක අඩංගු විය යුතු ගුණාංග පැහැදිලි කරයි.
- සුවිශේෂ වූ කණ්ඩායමක් සඳහා ඉදිරිපත් කරන නිර්මාණයක් බව පැහැදිලි කරයි.
- ළමා මනසට ගෝචර වන රේඛා, වර්ණ, හැඩතල භාවිත කළ යුතු බව ප්‍රකාශ කරයි.
- මුද්‍රිත පිටුවකට උචිත ආකාරයට සිතුවම් පිටපත් කරයි.
- මනා නිමාවකින් යුතු සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 4. 3.1.1ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා පිටපත් අවශ්‍ය පමණ
- මහදනමුත්තාගේ කථාන්තර සහිත සන්නිදර්ශන චිත්‍ර පිටපත් කිහිපයක්
- දියසායම්, පෝස්ටර් සායම්, පැන්සල, පින්සල්
- ඩ්‍රෝවින් කඩදාසි, ට්‍රේසින් කඩදාසි, ට්වයින් නූල්, ක්ලිප් කටු

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 4.3.1.1 :
- නාට්‍ය හා රංගකලාව ගුරු භවතාගේ උපදෙස් පරිදි මහදනමුත්තා මෙන් වෙස් ගැන්වූ සිසුවකු ගායනයක් සමඟ පන්ති කාමරයට ප්‍රවේශ වීමට ඉඩ සලස්වන්න.
- මිනිත්තු කිහිපයක් ඔහුගේ රංගනයට ඉඩ ලබාදෙන්න.
- එම අවස්ථාවට අවධානය යොමු කරමින් සපයා ගත් මහදනමුත්තා පිළිබඳ කථාන්තර සහිත වර්ණයෙන් මුද්‍රිත සන්නිදර්ශන චිත්‍ර කිහිපයක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- පහත සඳහන් කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු වන සේ සිසුන් සමඟ සාකච්ඡාවකට එළඹෙන්න.
  - සන්නිදර්ශන චිත්‍ර ග්‍රැෆික් චිත්‍ර ගණයට අයත් බව
  - කථාන්තරයක, පද්‍ය පන්තියක හෝ විශේෂාංග ලිපියක හෝ අන්තර්ගතය (අදහස) තීව්‍ර කිරීම සන්නිදර්ශන චිත්‍ර නිසා සිදුවන බව
  - සිතුවම්කරණයේ දී ළමා මනසට ගෝචර වන අයුරින් නිර්මාණ කළ යුතු බව
  - මුද්‍රණයට සුදුසු පරිදි පිටුවේ කැමති ආකාරයට චිත්‍රය නිර්මාණය කිරීමට නිදහස ඇති බව

(මිනිත්තු 20 යි)

පියවර 4.3.1.2 :
- ඇමුණුම් 4.3.1.1ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- පත්‍රිකාවේ සඳහන් පරිදි සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කිරීම සඳහා සිසුන් යොමු කරවන්න.
- අවශ්‍ය වූ විට සංවර්ධනය සඳහා උපදෙස් ලබාදෙන්න.

- නිම කරන ලද සන්නිදර්ශන චිත්‍ර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවස්ථාව ලබාදෙන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 4.3.1.3** :
- සිසු නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- එම නිර්මාණ පිළිබඳ ව සිසුන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- යොදාගත් ළමා කතන්දරය හා එම සන්නිදර්ශන චිත්‍රවල ඇති උචිත අනුචිත භාවය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- තව දුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.
- සන්නිදර්ශන චිත්‍ර හඳුනාගෙන විස්තර කිරීම
- ළමා කතන්දරයක සංවේදී අවස්ථා සන්නිදර්ශන චිත්‍රයකින් තීව්‍ර කළ හැකි බව ප්‍රකාශ කිරීම
- ළමා කතන්දරයකට සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කිරීම
- චිත්‍රයක් පිටපත් කිරීමෙන් ලබා ගත් පුහුණුව තවත් නිර්මාණයක දී භාවිත කිරීම

**ඇමුණුම 4.3.1.1**

## ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව

- පන්ති කාමරයේ ප්‍රදර්ශනය කර ඇති මහදනමුත්තාගේ කතන්දරය සහිත සන්නිදර්ශන චිත්‍ර හොඳින් නිරීක්ෂණය කරන්න.
- එම කතන්දරය හෝ ඔබ කැමති වෙනත් ගැමි කතන්දරයක් හෝ තෝරා ගන්න.
- සන්නිදර්ශන චිත්‍රය සඳහා තෝරා ගත් අවස්ථාව හා ගැළපෙන රූප, හැඩතල, වටපිටාව පිළිබඳ පහත කරුණු ඔස්සේ තොරතුරු ගොනු කරන්න.
    - ළමා මනසට ගෝචර වීම (උචිත වීම)
    - මුද්‍රණයට සුදුසු වන සේ වගන්ති සහ සිතුවම් පිටු සමඟ ගැළපීම
    - ආකර්ෂණීය නිමාව යන කරුණු කෙරෙහි සැලකිලිමත් වන්න.
- රළු කඩදාසියේ අඳින ලද සිතුවම ට්‍රේසින් කඩදාසියක උපකාරයෙන් ඩ්‍රෝවින් කඩදාසියට පිටපත් කරන්න.
- රූප පැහැදිලි ව දිස්වන සේ නැවත පැන්සලෙන් අඳින්න.
- සිත්ගන්නා සුලු වර්ණ යොදන්න.
- අවශ්‍ය තැන්හි දී මායිම් රේඛා තද පැහැයෙන් යොදන්න.
- නිම වූ චිත්‍රය පන්ති කාමරයේ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන්න.

නිපුණතාව 5.0 : විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම 5.1 : ඇඹීමේ ශිල්පක්‍රම භාවිත කර මූර්ති නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 5.1.1 : ''මැටි මාධ්‍යයෙන් සත්ත්ව රූප සම්පිණ්ඩනයක් කරමු.''

කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි

ඉගෙනුම් පල :
- ඇඹීම සඳහා භාවිත වන මැටි මාධ්‍යයේ ස්වාභාවය විස්තර කරයි.
- විවිධ උපකරණ හැසිරවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- නිර්මාණ නිමහම් කරයි.
- සෙසු අයගේ නිර්මාණ අගයයි. රස විඳියි.

ගුණාත්මක යෙදවුම් :
- ආදර්ශ සත්ත්ව මූර්ති, සත්ත්ව රූප සහිත ඡායාරූප, පින්තූර
- ප්‍රමාණය 15 cm x12cm පමණ ලී ආධාරකයක්
- ලී පතුරු, කියත් පටිවලින් සකස් කර ගත් උපකරණ (Tools)
- පදම් කළ මැටි
- කඩදාසි, පැන්සල්, ඇමුණුම 5.1.1.1ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:

පියවර 5.1.1.1 :
- ආදර්ශ මූර්ති, ඡායාරූප, පින්තූර සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- යොදා ගත හැකි හැඩතල සම්පිණ්ඩනය කළ යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

පියවර 5.1.1.2 :
- ඇමුණුම 5.1.1.1ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන්ට ලබාදෙන්න.
- දළ සටහන් ඇඳීමට කඩදාසි ලබාදෙන්න.
- අවශ්‍ය උපදෙස් ලබාදෙමින් සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

(මිනිත්තු 90 යි)

පියවර 5.1.1.3 :
- සිසුන්ගේ නිර්මාණ පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.
- ස්වයං ඇගයීමට සහ සාකච්ඡාවට අවස්ථාව ලබාදෙන්න.
- සංවර්ධනාත්මක අදහස් සහිත ඇගයීම් අවස්ථාවකට අනෙකුත් සිසුන් යොමු කරවන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - නිර්මාණය කිරීමට පෙර එහි පැති පෙනුමෙහි දළ සටහන් ඇඳ ගැනීම නිර්මාණය කිරීමට පහසු වන බව
    - නිර්මාණ ක්‍රියාවලිය පහසු කර ගැනීමට මැටි මාධ්‍ය හොඳින් පදම් කළ යුතු බව සහ මූර්තියේ සියුම් කොටස් මතු කිරීම සඳහා උචිත උපකරණ භාවිත කළ යුතු බව

(මිනිත්තු 20 යි)

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ඇඹීම සඳහා භාවිත මැටි මාධ්‍යයේ ස්වභාවය විස්තර කිරීම
- විවිධ උපකරණ හැසිරවීමේ කුශලතාව ප්‍රදර්ශනය කිරීම
- නිර්මාණය නිමහම් කිරීම
- සෙසු අයගේ නිර්මාණ රස විඳීම හා ඇගයීම

**ඇමුණුම 5.1.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- ගුරුතුමා /ගුරුතුමිය පන්තියට ඉදිරිපත් කරන සත්ත්ව රූප සහිත මූර්ති/ පින්තූර/ඡායාරූප හොඳින් නිරීක්ෂණය කරන්න.
- සරල සත්ත්ව ඉරියව්වක් තෝරාගන්න.
- ඔබ කැමති සත්ත්ව රූප 2ක් සම්පිණ්ඩනය කර විවිධ පැතිවලින් පෙනෙන ආකාරයේ දළ සටහන් අඳින්න. (ඉදිරි පෙනුම, පැති පෙනුම, පසුපස පෙනුම)
- දළ සටහන ඇඳීමේ දී පිටතට විහිද යන කුඩා හැඩ හැකි පමණ අඩුවෙන් භාවිත කරන්න.
- ලී ආධාරකය මත පදම් කළ මැටි කොටස් තබමින් දළ සටහනේ දැක්වෙන සත්ත්ව රූප ගොඩ නඟන්න.
- සුදුසු පරිදි උපකරණ භාවිත කර අවශ්‍ය සියුම් හැඩ මතු කරගන්න.
- විවිධ මතුපිට ස්වභාවයන් ඇති වන පරිදි මූර්තිය නිමහම් කරන්න.
- ඔබගේ නිර්මාණය පන්තියේ ප්‍රදර්ශනය සඳහා සූදානම් කරන්න.

නිපුණතාව 5.0 : විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම 5.2 : නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිත කර උන්නත කැටයමක් නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 5.2.1 : ''වෙස් මුහුණක් නිමවමු.''

කාලච්ඡේද : 03 යි.

ඉගෙනුම් පල :
- අල්ප උන්නත කැටයම් යනු කුමක්දැයි විස්තර කරයි.
- පහත රට ශාන්ති කර්ම හා කෝලම් වෙස් මුහුණුවල දැකිය හැකි කලා ලක්ෂණ භාවිත කරමින් වෙස් මුහුණු නිර්මාණයකළහැකි බව පිළිගනියි.
- රිජිෆෝම් මාධ්‍ය භාවිත කරමින් උන්නත කැටයමක් නිර්මාණය කරයි.
- අවශ්‍යතාවට ගැළපෙන උපකරණ තෝරා ගනියි.
- පූර්ව අත්දැකීම් නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.
- සෙසු නිර්මාණ රස විඳිමින් අගයයි.

ගුණාත්මක යෙදවුම් :
- ශාන්ති කර්ම සඳහා උපයෝගී කර ගන්නා විවිධ වර්ගයේ වෙස් මුහුණු නිර්මාණ ඇතුළත් ඡායාරූප, වෙස් මුහුණු නිර්මාණ
- රිජිෆෝම්
- නෙළීම සඳහා භාවිත උපකරණ, කියත් පටිවලින් සකස් කරගත් උපකරණ (Tools)
- දළ සටහන සකස් කර ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ
- වර්ණ සහ පින්සල්
- ඇමුණුම 5.2.1.1ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 5.2.1.1 :
- වෙස් මුහුණු නිර්මාණ සහිත පින්තූර සහ වෙස් මුහුණු පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එවා නැරඹීමට අවස්ථාව සිසුන්ට ලබාදී ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ශාන්ති කර්මවල දී වෙස් මුහුණු භාවිත කිරීම පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. ඒ පිළිබඳ ව කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
- රිජිෆෝම් මාධ්‍ය භාවිතයෙන් වෙස් මුහුණක කැටයමක් පහසුවෙන් නිර්මාණය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.
- උපකරණ භාවිතය පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න.

(මිනිත්තු 15 යි)

පියවර 5.2.1.2 :
- ඇමුණුම 5.2.1.1ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන්ට ලබාදෙන්න. (සුදුසු ක්‍රමවේදයක් භාවිත කරන්න.)
- දළ සටහන් ඇඳීම සඳහා උපදෙස් ලබා දෙන්න.
- රිජිෆෝම් සහ අවශ්‍ය උපකරණ කණ්ඩායම්වලට ලබා දෙන්න.
- අඳින ලද දළ සැලසුමට අනුව කැටයම නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- එක් එක් සිසුන් සඳහා අවශ්‍ය සහය ලබා දෙන්න.
- වර්ණ මාධ්‍ය සහ පින්සල් සිසුන්ට ලබා දෙන්න.
- කැටයම් කිරීමෙන් පසු අවශ්‍ය උපදෙස් ලබා දෙමින් නිර්මාණය වර්ණ කිරීමට මඟ පෙන්වන්න.

(මිනිත්තු 90 යි)

පියවර 5.2.1.3 :
- නිම කළ කෘතිය පන්තියට ඉදිරිපත් කිරිමට ඉඩ සලසන්න.
- නිර්මාණ පිළිබඳ ස්වයං ඇගයීමට සහ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.
- රිජිෆෝම් උන්නත කැටයමක් නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර සිසු නිර්මාණ ඇසුරෙන් පැහැදිලි කර දෙන්න.
- උපකරණ සහ මාධ්‍ය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම අවබෝධ කර දෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- උන්නත කැටයම යනු කුමක් දැයි විස්තර කිරීම.
- නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිත කරමින් වෙස්මුහුණක් නිර්මාණය කිරීම සඳහා දළ සටහන් ඇඳීම.
- නිවැරදි පියවර අනුගමනය කරමින් රිජිෆෝම් භාවිතයෙන් උන්නත කැටයමක් නිර්මාණය කිරීම.
- උපදෙස්වලට අනුව වර්ණ ගැන්වීම.
- සෙසු නිර්මාණ ඇගයීම සහ රස විඳීම.

ඇමුණුම 5.2.2.1

## ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති ආදර්ශ උන්නත කැටයම්/ පින්තූර දළ සටහන් ආදිය හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දක්නට ලැබෙන හැඩ, වර්ණ, නිමාව, මාධ්‍ය භාවිතය, ත්‍රිමාණ බව හොඳින් නිරීක්ෂණය කරන්න.
- දේශීය ශාන්තිකර්මවල භාවිත වන වෙස් මුහුණු නිර්මාණ ඇසුරෙන් නිර්මාණාත්මක වෙස් මුහුණක කැටයමක් සඳහා උචිත පරිදි දළ සටහන් අඳින්න.
- අඳිනු ලද දළ සටහන ඇසුරෙන් රිජිෆෝර්ම් තලය මත රේඛා සටහන ඇඳ ගන්න.
- සපයාගත් උපකරණ (Tools) යොදා ගෙන අවශ්‍ය තැන් මතු කරමින් අනවශ්‍ය කොටස් කපා ඉවත් කරමින් කැටයම නිර්මාණය කරන්න.
- කැටයම් කරගත් නිර්මාණය සාම්ප්‍රදායික වෙස් මුහුණු සඳහා භාවිත වන වර්ණමාලා යොදා ගනිමින් වර්ණ ගන්වන්න.
- නිර්මාණය කරන ලද එක් එක් කැටයම් ගුරු උපදෙස් අනුව පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 5.0** : **විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 5.3** : **එකලස් කිරීමේ ශිල්පක්‍රම භාවිතයෙන් මූර්ති නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 5.3.1** : **''ඉවත ලන දෑ ඇසුරින් ගෘහ අලංකරණය සඳහා නව නිර්මාණයක් කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි

**ඉගෙනුම් පල** :
- එකලස් කිරීමේ ශිල්පක්‍රමය පිළිබඳ ව සාකච්ඡා කරයි.
- ඉවත ලන විවිධ ද්‍රව්‍ය එකලස් කරමින් නිර්මාණකාර්යය සිදු කරයි.
- එකලස් කිරීමේ දී භාවිත කළ හැකි විවිධ ක්‍රමවේද අත්හදා බලයි.
- විවිධ මාධ්‍යවල අනන්‍යතා ලක්ෂණ සොයා බලයි.
- විවිධ හැඩතල නිර්මාණාත්මක ව සම්පිණ්ඩනය කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ආදර්ශ නිර්මාණයක්/ආදර්ශ පින්තූර
- ඉවත ලන විවිධ ද්‍රව්‍ය (ප්ලාස්ටික්, තහඩු, ටින්, යකඩ, ලෑලි කැබලි, ලී පටි, කම්බි, ඇණ, බොත්තම්, වෙනත් ද්‍රව්‍ය)
- ගම් වර්ග, ගිනිපෙට්ටි, ඉටිපන්දම්
- පින්සල්, වර්ණ
- අඬුව, තහඩු කපන කතුරක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 5.3.1.1** :
- ආදර්ශ නිර්මාණය සිසුන්ට ප්‍රදර්ශනය කරමින් ඒ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- නිදර්ශන, පින්තූර, ඡායාරූප ඉදිරිපත් කරන්න.
- සපයා ගත් විවිධ ද්‍රව්‍ය සහ එහි විවිධතා සම්බන්ධ ව සිසුන් සමඟ අදහස් හුවමාරු කරගන්න.
- එක් එක් ද්‍රව්‍ය නිර්මාණාත්මක ව ගැළපීමට හා සම්බන්ධ කිරීමට හැකි ක්‍රමවේද පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 5.3.1.2** :
- ඇමුණුම අංක 5.3.1.1ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන් අතර බෙදාදෙන්න.
- ගුණාත්මක යෙදවුම් සඳහා සපයා ගත් ද්‍රව්‍ය සිසුන් අතර බෙදාදෙන්න.
- ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාවට අනුව ගෘහ අලංකරණය සඳහා එකලස් කිරීමේ ශිල්පක්‍රමය භාවිතයෙන් නිර්මාණයක් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සිසුන්ට අවශ්‍ය මඟ පෙන්වීම් ලබාදෙන්න.
- සිසු නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි)

පියවර 5.3.1.3

- සිසු නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කරවන්න.
- එම නිර්මාණ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- තව දුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරමින් අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.
- මෙවන් නිර්මාණයක් කිරීමේ දී ඇතිවන තාක්ෂණික ගැටලු සම්බන්ධ ව අදහස් හුවමාරු කරගන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- එකලස් කිරීමේ ශිල්පක්‍රමය පිළිබඳ ව සාකච්ඡා කිරීම
- එකලස් කිරීමට යොදා ගත හැකි ඉවතලන විවිධ ද්‍රව්‍ය නිර්මාණ කාර්යය සඳහා භාවිත කිරීම
- එකලස් කිරීම සඳහා සුදුසු ක්‍රමවේද භාවිත කිරීම
- ගෘහ අලංකරණය සඳහා ඉවතලන විවිධ ද්‍රව්‍යවල විවිධ හැඩතල සම්පින්ඩණය මඟින් නිමැවුමක් නිර්මාණය කිරීම
- වර්ණ කිරීමේ විවිධ ක්‍රමශිල්ප භාවිත කිරීම

**ඇමුණුම 5.3.3.1**

## ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබට සපයා ඇති ආදර්ශ නිර්මාණය සහ පින්තූර හොඳින් නිරීක්ෂණය කරන්න.
- සපයා ඇති ද්‍රව්‍ය අවශ්‍ය පරිදි බෙදාගන්න.
- ඔබ ළඟ ඇති විවිධ ද්‍රව්‍ය ආශ්‍රයයෙන් නිවසක අලංකාරයට තැබිය හැකි විසිතුරු නිර්මාණයක් සඳහා ගැළපෙන දළ සටහනක් ඇඳගන්න.
- අවශ්‍ය උපකරණ තෝරාගන්න.
- ඇඳගත් දළ සටහනට අනුව සුදුසු ක්‍රමවේද භාවිතයෙන් ද්‍රව්‍ය එකලස් කරන්න. (බැඳගන්න/අලවාගන්න/පුළුස්සා රත්කර අලවාගන්න)
- උචිත පරිදි වර්ණ යොදා අලංකාර කරගන්න.
- වැඩ අවසන් වූ පසු නිර්මාණ පන්තියේ ප්‍රදර්ශන කිරීමට සූදානම් කරන්න.

**නිපුණතාව 6. 0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනා ගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **ශ්‍රී ලංකාවේ පාරම්පරික වෙස්මුහුණු කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය හා රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.1** : ''වෙස් මුහුණේ වතගොත''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි

**ඉගෙනුම් පල** :
- වෙස් මුහුණු කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ නම් කරයි.
- වෙස් මුහුණු නිර්මාණය සඳහා භාවිතයට ගනු ලබන ද්‍රව වර්ග නම් කරයි.
- පාරම්පරික වෙස් මුහුණක් නිර්මාණය කිරීමේ දී භාවිත වන තාක්ෂණ සහ ශිල්ප ක්‍රම පිළිබඳ ව විස්තර කරයි.
- වෙස් මුහුණු නිර්මාණ සඳහා පාදක වූ වස්තු විෂයයන් විස්තර කරමින් වෙස් මුහුණු වර්ග කරයි.
- පාරම්පරික වෙස් මුහුණුවල කලාත්මක ලක්ෂණ අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- පාරම්පරික වෙස් මුහුණු කර්මාන්තයට අදාළ රූප සටහන් /ඡායාරූප,
- එම නිර්මාණ ඇතුළත් වීඩියෝ පට, සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර
- ඇමුණුම 6.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා
- ඇමුණුම 6.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 6.1.1.1** :
- පාරම්පරික වෙස් මුහුණු කර්මාන්තයට අදාළ රූප සටහන් / ඡායාරූප පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම කර්මාන්තයට අදාළ නිර්මාණ ක්‍රියාවලිය දැක්වෙන වීඩියෝ පට, සංයුක්ත තැටි, පරිගණකය ඇසුරින් ප්‍රදර්ශනය කරන්න.
- පාරම්පරික වෙස් මුහුණු කර්මාන්තයට අදාළ සුවිශේෂ තාක්ෂණ ක්‍රම, ශිල්ප ක්‍රම සහ උපකරණ පවතින බව පැහැදිලි කර දෙන්න.
- විවිධ අවශ්‍යතා මත වෙස් මුහුණු නිර්මාණය වී ඇති බව නිදසුන් මඟින් පෙන්වා දෙමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.1.1.2** :
- ඇමුණුම 6.1.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව පන්තියේ කියවීමට සලස්වන්න
- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා ක්‍රියාකාරම්හි යොදවන්න.
- අදහස් හුවමාරු කරගැනීමට අවස්ථාව ලබාදෙන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.1.3** :
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ඒවායේ නිවැරදි භාවය සාකච්ඡා කරන්න.
- එම සාකච්ඡාව අතරතුර අනෙක් සිසුන්ට තම අනාවරණ නිවැරදි කර ගැනීමට උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 10 යි )

**ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :**
පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.1.1 සහ ඇමුණුම 6.1.1.2 පදනම් කරගෙන ඇගයීම් සහ තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- වෙස් මුහුණු කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ සහ ඒ සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය නම් කිරීම
- පාරම්පරික වෙස් මුහුණු කර්මාන්තය සඳහා යොදාගන්නා තාක්ෂණ ක්‍රම ශිල්ප ක්‍රම, සහ උපකරණ පිළිබඳ ව විස්තර කිරීම
- වෙස් මුහුණු නිර්මාණ සඳහා පාදක වන වස්තු විෂයය විස්තර කිරීම සහ වෙස් මුහුණු වර්ග හඳුනා ගැනීම

ඇමුණුම **6.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඇමුණුම 6.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාවේ රූප සටහන් අධ්‍යයනය කරන්න.
- ඔබ කණ්ඩායමට අදාළ තේමාව යටතේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

  **1. කණ්ඩායම** - වෙස්මුහුණු කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ සහ ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍යය නම් කරන්න.
  **11. කණ්ඩායම** - පාරම්පරික වෙස්මුහුණු කර්මාන්තය සඳහා යොදාගන්නා තාක්ෂණ ක්‍රම ශිල්ප ක්‍රම, සහ උපකරණ පිළිබඳව විස්තර කරන්න.
  **111. කණ්ඩායම** - වෙස් මුහුණු නිර්මාණ සඳහා පාදක වන වස්තු විෂයන් විස්තර කර වෙස් මුහුණු වර්ග නම් කරන්න.

- අනාවරණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- ගුරුතුමාගේ / ගුරුතුමියගේ සහාය ලබාගන්න.

ඇමුණුම **6.1.1.2**

## කියවීම් පත්‍රිකාව

**ඓතිහාසික පසුබිම**

ලෝකයේ බොහෝ රටවල ප්‍රාග් ඓතිහාසික හා ප්‍රාග් කෘෂිකාර්මික යුගවල වෙස් මුහුණු භාවිත කිරීම සිදු කර ඇත. වර්ෂාව, ආහාර (දඩයම් හා බව භෝග) හා ලෙඩදුක් (ආරක්ෂාව) වැනි එදිනෙදා විවිධ කටයුතු සඳහා යාතුකර්ම පැවත්වීමත් එම විවිධ අවස්ථාවල වෙස් මුහුණු භාවිත කිරීමත් සිදු වී ඇත. විශේෂයෙන් දඩයක්කාර දිවි පෙවතක් ගෙවූ ගෝත්‍රික ජනතාව සතුන් බියවැද්දීම, සතුන්ගෙන් ආරක්ෂා ව ලබා ගැනීම වැනි කරුණු පදනම් කරගෙන වෙස් මුහුණු පැළඳ ඇත.

**ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ප්‍රදේශ**

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික පාරම්පරික වෙස් මුහුණු කලාව කර්මාන්තයක් ලෙස වඩාත් ප්‍රචලිත පවතින ප්‍රදේශය වන්නේ දකුණු පළාතේ අම්බලන්ගොඩ ප්‍රදේශය යි. එමෙන් ම බෙන්තර, මිරිස්ස, රයිගම් කෝරළය, මතුගම යන ප්‍රදේශවල ද මෙම කර්මාන්තය පැවත තිබේ.

**අමුද්‍රව්‍ය**

- වෙස් මුහුණු නිර්මාණය සඳහා දිය කදුරු සහ රුක් අත්තන යන දැව වර්ග පැරණි ශිල්පීන් විසින් භාවිත කරනු ලැබ තිබේ.

**වෙස් මුහුණු නිර්මාණය කිරීම**

- වෙස් මුහුණක් නිර්මාණය කිරීමේ පළමු පියවර වන්නේ ලී කඳන් කපා පොතු ගසා කැබලිවලට කපා ගැනීම යි. මෙය **ගණ කැපීම** ලෙස හැඳින්වේ. ඉන් පසුව එම ලී

කොටයේ ඇති ගැට සහිත තැන් කපා පැතලි හැඩයක් සකස් කර ගනියි. මෙය **පායම් පෑහීම** නම් වේ. මෙසේ සකස් කොට ගත් ලීය මත වෙස් මුහුණේ දළ හැඩය සළකුනු කොට ලීයේ ප්‍රමාණය මුහුණේ ප්‍රමාණය තෙක් අඩු කර ගැනේ.

- ඉන් පසු ව කැටයම් කිරීමට සහ වර්ණ කිරීමට පහසු වන සේ ලීයේ ඇති අධික කිරි ගතිය ඉවත් කොට කදුරු ලීය පදම් කර ගැනීම සඳහා දුමේ දමා හෝ මඳ අව්වේ දමා හෝ වේළා ගත යුතු ය. මෙය **කිරි හිඳවීම** යනුවෙන් හැඳින්වේ.

- ඉන් පසු මුහුණේ අවශ්‍ය හැඩය මතු කොට ගනී. මුහුණේ ඇස් නාසය වැනි සියුම් අංග මතුකිරීම **ලකුණු කැපීම** ලෙස හඳුන්වයි. එමෙන් ම මිනිසකුගේ මුහුණේ ප්‍රමාණයට ගැළපෙන පරිදි වෙස් මුහුණේ ඇතුළු පැත්ත හාරා ඉවත් කර ගැනීම මේ අවස්ථාවේ දී සිදු කෙරේ. මෙහි කල් පැවැත්ම උදෙසා අතීතයේ දී යළිත් මාස තුනක් පමණ දුම්මැස්සේ දමා වේලා ගනු ලැබේ.

- ඉන් පසු ව වෙස් මුහුණට අවශ්‍ය අනෙකුත් අංග වන හිසකෙස්, දෑළි රැවුළු සහ උඩ රැවුළු, දත්, ඔටුනු ආදිය වෙන ම සාදා වද්දනු ලැබේ.

**වෙස් මුහුණු වර්ණ ගැන්වීම**

- වෙස් මුහුණු වර්ණ කිරීමට ප්‍රථම එහි සුදු පැහැති මූලික ආලේපනයක් තවරා ගනු ලැබේ. අතීතයේ දී මෙම සුදු පැහැති වර්ණය සඳහා කිරිමැටි හෝ මකුළු මැටි හෝ දිය කර පෙරා ගැනීමෙන් සකස් කර ගනියි. මේවා **අල්ලියාදු** නමින් හැඳින්වේ.

- ඉන් පසු මෙම සුදු පැහැති පසුබිමේ ඒ ඒ වෙස් මුහුණට උචිත ආකාරයට වර්ණ ආලේපනය සිදු කර යි.

- වෙස් මුහුණු නිර්මාණය කළ සාම්ප්‍රදායික ශිල්පීන් අතීතයේ දී කහ වර්ණය සඳහා හිරියල් ද, රතු වර්ණය සඳහා සාදිලිංගම් ද, සුදු සඳහා මකුළු මැටි ද යොදා ගෙන ඇත. එමෙන් ම බෝවිටියා, කී කිරිඳිය, රණවරා, මෑ ආදී පැළෑටිවලින් දම් සහ කොළ වර්ණ සාදා ගෙන ඇත. (වර්තමානයේ දී මෙම වෙස් මුහුණු වර්ණගැන්වීම සඳහා බොහෝ විට කෘතිම වර්ණ මේ සඳහා භාවිතයට ගැනේ.)

- අතීතයේ දී, වර්ණ ආලේපනයෙන් පසු කල් පැවැත්ම, තෙතමනයට ඔරොත්තු දීම මෙන් ම මතුපිට දිස්නයක් ලබා දීම සඳහා වෙස් මුහුණු මත දොරණ තෙල් තැවරීම සිදු කරනු ලැබ ඇත.

**වෙස් මුහුණු වර්ග**

සාම්ප්‍රදායික යාතු කර්ම සහ ජන නාට්‍ය උදෙසා ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෙස් මුහුණු නිර්මාණය කොට තිබේ. මේ සඳහා නිර්මාණය කරන ලද වෙස් මුහුණු වර්ග කිහිපයක් වේ.

- රජ මුහුණු
- රාක්ෂස මුහුණු
- යක්ෂ මුහුණු
- නාග කන්‍යා මුහුණු
- සන්නි මුහුණු
- කෝලම් මුහුණු


- මූලාශ්‍රය - - කෝලම් මුහුණු සහ ලංකාවේ වෙස් මුහුණු - ආචාර්ය එම්. එච්. ගුණතිලක

  - සිංහල කෝලම් සම්ප්‍රදාය - ගාමිණී දැල බණ්ඩාර



වෙස් මුහුණක නිර්මාණ අවස්ථා









වෙස් මුහුණක් නිර්මාණය කිරීමේ අවස්ථා



රජ සහ බිසව



නාග රාක්ෂ



ගුරුළු රාක්ෂ



ගරා යකා




සුරඹාවල්ලි මුහුණක්



කොර සන්නිය



දේව සන්නිය



නාග සන්නිය



ගමේ විදාන ආරච්චි



හේවා කෝලම



පරංගි කෝලම

ඡායාරූප උපුටා ගැනීම - වෙස් මුහුණු කලාව, ජේ. ඩබ්. හද්‍රානන්ද

**නිපුණතාව 6. 0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනා ගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.2 : දැව කැටයමින් අලංකාර වූ හින්දු කෝවිල් ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම් 6.2.1. : "පූජෝත්සව සඳහා භාවිත කැටයම් කළ මරවාහනම් (දැව වාහන) අගයමු."**

**කාලච්ඡේද : 02 යි**

**ඉගෙනුම් ඵල** :
- මරවාහනම් හින්දු ආගමික නිර්මාණ බව ප්‍රකාශ කරයි.
- මරවාහනම් පිළිබඳ ඓතිහාසික තත්ත්වය විස්තර කරයි.
- මරවාහනම් වර්ග නම් කරයි.
- කැටයම් සහිත සුවිශේෂ මරවාහනම් ඇති ස්ථාන නම් කරයි.
- මඤ්ජම්, තේර්, සිම්ම(සිංහ) වාහනම්, කුදිරෙයි(අශ්ව) වාහනම් යන දේව රථවල ස්වාභාවයන් විස්තර කරයි.
- මරවාහනම් කැටයම් සඳහා භාවිත සැරසිලි නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- මඤ්ජම්, තේර්, සිංහවාහනම්, කුදිරෙයි වාහනම් දක්වෙන ඡායාරූප, සංයුක්ත තැටි
- පරිඝනක, බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර
- ඇමුණුම 6.2.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.2.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 6.2.1.1 :
- ඡායාරූප, සංයුක්ත තැටි භාවිත කර මනා ප්‍රවේශයක් ලබා ගන්න.
- මෙම නිර්මාණ පිළිබඳ සිසු දැනුවත්භාවය විමසන්න.
- ආගම හා බැඳුණු නිර්මාණ වුව ද මේවා සෞන්දර්යාත්මක අගයෙන් අනූන බව පහත සඳහන් කරුණු ඔස්සේ සාකච්ඡා කරන්න.
  - ඓතිහාසික පසුබිම
  - ඒ ඒ මරවාහනම්වල ලක්ෂණ
  - භාවිත සැරසිලි

(මිනිත්තු 10 යි)

පියවර 6.2.1.2 :
- ඇමුණුම 6.2.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකා පිටපත් සිසුන්ට බෙදා දෙන්න.
- ඇමුණුම 6.2.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකා පිටපත් සිසුන්ට බෙදා දෙන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට බෙදා ක්‍රියාකාරකමේ යොදවන්න.
- අදහස් හුවමාරු කරගැනීමට අවස්ථාව ලබාදෙන්න.

(මිනිත්තු 50 යි)

පියවර 6.2.1.3 :
- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ඒවායේ නිවැරදි භාවය සාකච්ඡා කරන්න.

- එම සාකච්ඡාව අතරතුර අනෙක් සිසුන්ට සියලු ම අනාවරණ නිවැරදි ව සටහන් කර ගැනීමට උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 10 යි )

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- මරවාහනම් පිළිබඳ ඓතිහාසික තත්ත්වය විස්තර කිරීම
- මරවාහනම් වර්ග කර ඒවා නම් කිරීම
- කැටයම් සහිත සුවිශේෂ මරවාහනම් ඇති ස්ථාන නම් කිරීම
- මඤ්ජම්, තේර් සිම්ම (සිංහ) වාහනම්, කුදිරෙයි (අශ්වා) වාහනම් යන රථවල ස්වභාවයන් විස්තර කිරීම
- මරවාහනම් කැටයම් සඳහා භාවිත සැරසිලි හා කලාත්මක ලක්ෂණ විස්තර කිරීම

**ඇමුණුම 6.2.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඇමුණුම 6.2.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාවේ තොරතුරු හා රූප සටහන් අධ්‍යයනය කරන්න.
- ඔබ කණ්ඩායමට අදාළ තේමාව යටතේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
  - **1. කණ්ඩායම** - මරවාහනම්වල ඓතිහාසික පසුබිම හා ඒවායේ භාවිතය පිළිබඳ විස්තරකරන්න.
  - **11. කණ්ඩායම** - සිම්ම වාහනම් (සිංහ රථය) හා කුදිරෙයි වාහනම් (අශ්ව රථය) පිළිබඳ කලාත්මක ලක්ෂණ විස්තර කරන්න.
  - **111. කණ්ඩායම** - මඤ්ජම් හා තේර් රථය පිළිබඳ කලාත්මක ලක්ෂණ විස්තර කරන්න.
- අනාවරණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- ගුරුතුමාගේ / ගුරුතුමියගේ සහාය ලබාගන්න.

# කියවීම් පත්‍රිකාව

## හින්දු ආගමික සංස්කෘතිය හා බැඳුණු දැව කැටයම්

**ඓතිහාසික පසුබිම:**

හින්දු ඉතිහාසයේ සංගකාලම් (සංග යුගයේ) සිට දැව කැටයම් තිබූ බවට මනිමේබලෙයි නම් ඉන්දීය ඉතිහාස ග්‍රන්ථය සාක්ෂි දරයි. එහි එක් ගීතයක සඳහන් වන්නේ දැව, ඇත්දල, මැටි ආදියෙන් කළ ප්‍රතිමා තිබුණ බවයි. ඒ අනුව දැවයෙන් කළ නිර්මාණ ඈත අතීතයේ සිට හින්දු ආගමික සංස්කෘතිය තුළ පැවති බව ඉන් අනාවරණය වේ.

හින්දු ආගම හා සම්බන්ධ දැව කැටයම් පිළිබඳ ඓතිහාසික තොරතුරු රැසක් විවිධ සාහිත්‍ය මුලාශ්‍රවල සඳහන් වේ. කැටයම් කිරීම, රූප ඇඳීම, වාර්ණ කිරීම සැරසිලි සංකේත භාවිතය ආදී තොරතුරු ඒවායේ සඳහන් වේ. මරවාහනම් නිර්මාණය දියුණු තත්ත්වයට පත් වූයේ පල්ලව හා චෝල කාලයන්හි දී බව විද්වත් මතය යි.

**මරවාහනම් නිර්මාණ හා භාවිතය :**

හින්දු කෝවිල් ආශ්‍රිත ව විවිධ උත්සව පවතී. ඒ ඒ උත්සව වලට විශේෂිත වූ වාහන නිර්මාණය කර ඇත. මේවා දෙවිවරුන් වෙනුවෙන් නිර්මාණය කළ රථ/ වාහන වේ. දේව රූප තැන්පත් කර පෙරහරේ ගෙනයාමට භාවිත කෙරේ. මෙම වාහන දැවයෙන් නිර්මාණ වන බැවින් දැව යන්නට මරම් ලෙස වන ද්‍රවිඩ හැඳින්වීම අනුව මේවා මරවාහන යනුවෙන් නම් වේ. මෙවා විසිතුරු කැටයමින් අලංකාර කර ඇත. හින්දු ආගමේ ව්‍යාප්තියත් සමඟ ශ්‍රී ලංකාවේ ද කෝවිල් ආශ්‍රිත ව මරවාහනම් නිර්මාණය වී ඇත.

**ප්‍රධාන වශයෙන් වාහන වර්ග දෙකකි :**

1. 'වඩම්' නම් කඹ යොදා ඇඳගෙන යන වාහන
   උදා: i. තේරු ii. මඤ්ජම් iii. කෛලාස වාහනම් iv. සප්පරම්

2. මිනිසුන් විසින් ඔසවාගෙන යන වාහන
   උදා: i. සිම්ම (සිංහ) වාහනම් ii. නාග වාහනම් iii. අන්න (හංස) වාහනම් iv. එළි (මූසික) වාහනම් v. මයිල් (මොණර) වාහනම් vi. කුදිරෙයි (අශ්ව) වාහනම්

**සැරසිලි කැටයම්**

දැවයෙන් කැටයම් කළ නිර්මාණ වර්ණ ගන්වා මනාව සැරසිලි කර ඇත. විවිධ සත්ව රූප මෙන් ම පක්ෂි රූප භාවිත කර ඇත. අලියා, සිංහයා, අශ්වයා වැනි රූපත්, වාමන රූප (භූත රූප) හා මිනිස් රූපත්, යාලි, කාම ධේනු (කාන්තා හිසක් හා ගව ශරීරයක් ඇති) වැනි කල්පිත රූපත් විශේෂයෙන් භාවිත කර ඇත. මල් සැරසිලි වර්ණවත් ව යෙදීමෙන් අලංකාරය ගෙන දී ඇත.

**වර්තමාන ශ්‍රී ලංකාවේ දැකිය හැකි කැටයම් සහිත විශේෂ මර වාහන**

සිම්ම වාහනම් **(සිංහ රථය)**





යාපනයේ මූලායිහි සිත්ති විනයාගර් කෝවිලෙහි දැකිය හැකි ය. 20 වැනි සියවසේ සින්නඩ්ඩියාර් ශිල්පියා විසින් නිර්මාණය කරන ලදි.

**කලාත්මක ලක්ෂණ**

ශෛලීගත රූපයකි. ඉතා සියුම් ව කැටයම් කර ඇත. ඉදිරියට නෙරා ඇති වටකුරු ඇස්, විවෘත මුඛය, තියුණු දත්, ඔසවා නමාගත් වලිගය මනා වූ ගාම්භීර පෙනුමක් මතු කරයි. මාල පදක්කම් සහිත ගෙල පළඳනා, මල් සැරසිලි යොදා ඇත. සැරසිලි සඳහා විදුරු කැබලි භාවිත කර ඇත. මෙයින් ආලෝකය පරාවර්තනය වීමෙන් දිව්‍යමය ස්වභාවයක් ගෙන දෙයි.

කුදිරෙයි වාහනම් **(අශ්ව රථය)**





යාපනයේ නල්ලූර් කන්දස්වාමි කෝවිලෙහි දක්නට ඇත. මෙය තිරුම්බෙයි මරුදූර් ගෝවින්දසාමි නම් ශිල්පියා විසින් 1963 - 1964 කාලයේ නිර්මාණය කරන ලද්දකි.

කලා ලක්ෂණ

සෘජු පෙනුම, කෝපය වේගයෙන් පතිත ආකාරය, පෙන්වා ඇත. යුධමය ස්වභාවයක් පෙන්වයි. ශරීරයේ බර පසු පාද දෙකට එන ලෙස සමබරතාව මනාව රැකගෙන ඇත. සමස්ත නිර්මාණය අලංකාරය මෙන් ම ගාම්භීර බවක් මතුකර දීමට සමත් වී ඇත. මෙය හැඟීම් ප්‍රකාශිත නිර්මාණයකි.

මඤ්ජම්







මෙය මඤ්ජම් උත්සවය සඳහා විශේෂයෙන් භාවිත කරන රථයකි. සුවිශේෂ මඤ්ජම් වාහනයක්, යාපනය ඉනුවිල් හි කන්දස්වාමි කෝවිලෙහි දැකිය හැකි ය. එය 1909 - 1910 අතර කාලයට අයත් වේ. මෙය කඹ යොදා ඇදගෙන යාමට පහසු ආකාරයෙන් රෝද සහිත ව නිර්මාණය කර ඇත.

**මූලික ස්වභාවය හා කලා ලක්ෂණ**

සම්පූර්ණ රථය ලී කැටයම් වලින් යුක්ත ය. ප්‍රධාන වශයෙන් කොටස් තුනකින් යුක්ත ය. පහළ කොටස මැද කොටස හා ඉහළ කොටස වශයෙනි.

රෝදවලට ඉහළින් වූ තට්ටු සහිත කොටස පහළ කොටස වේ. ඒවා දේව රූප, සත්ත්ව රූප, පක්ෂි රූප, වාමන රූප වැනි රූප හා නෙලුම් මල්, පළාපෙති ආදියෙන් අලංකාර කර ඇත.

මෙම රථයේ ප්‍රධාන අංගය වන්නේ මැද කොටස යි. මෙය දේව රූප තැන්පත් කරන පීඨිකාවකින් යුතු වේ. එය දේව ආසන නම් වේ. මෙම පීඨිකාව කණුවලින් සමන්විත වේ. ඒවා ඉහළ කොටස හා සම්බන්ධ වේ. මෙම කණු **පවලක්කාල්** ලෙස හැඳින්වේ. මෙම කණුවලට පිටින් පැතලි දිගු යාලි රූප සම්බන්ධ කර ඇත.

මඤ්ජම්හි ඉහළ කොටස කෝවිලෙහි ඉදිරි පස ඇති ගෝපුරවල විමාන ලක්ෂණ දැකිය හැකි ය. තට්ටු කීපයකින් යුක්ත වූ මෙම විමාන තුළ දේව රූප හා පිටත සත්ත්ව රූප හා මල් ලියකම් වලින් බහුල ය. මෙහි පෙනුම කෝවිලේ ඉදිරිපස ඇති ගෝපුරම් සිහිපත් කරවයි.

## තේර් රථය









සුවිශේෂ තේර් රථයක් මඩකලපුව කොක් කට්ටිච්චෝලෙයි ශිවම් කෝවිලෙහි දක්නට ඇත. මෙය සියවසකට වඩා පැරණි බව සඳහන් ය.

### රථයේ මූලික ස්වභාවය හා කලා ලක්ෂණ

මෙහි ඇති දැව කැටයම් ශ්‍රී ලංකාවේ ඇති පැරණි කැටයම් සම්ප්‍රදායයක් නියෝජනය කරයි. ශිවම් (ශිව දෙවි) සඳහා වූ තේර් රථය පැරණි ම රථය ලෙස සැලකේ.

තේර් රථ වර්ග දෙකකි. මේවායේ මූලික හැඩය පහළ සිට ඉහළට යත් ම ක්‍රමයෙන් විෂ්කම්භය අඩු වන සේ දක්වේ. එසේම සමස්ථයක් ලෙස මෙම තේර් රථ ද මඤ්ජම් මෙන් කොටස් තුනකින් යුක්ත වේ. ඒ අනුව පළමු වර්ගයට අයත් තේර් රථවල සියලු ම කොටස් ස්ථිර ව දැව මාධ්‍යයෙන් පමණක් සකස් කර ඇත.

දෙවන වර්ගයට අයත් තේර් රථවල පහළ කොටස ස්ථිර ව නිමවා ඇති අතර ඉහළ කොටස් භාවිතයට ගැනිමේ දි /ධාවනයේ දී පමණක් තාවකාලික ව සම්බන්ධ කෙරේ. මෙහි දී ඉහළ කොටස රෙදිවලින් වෙලා සම්බන්ධ කර සරසා ගනු ලැබේ. ඒ සඳහා විවිධ වර්ණ රෙදි, මල් වැල් හා කොඩි ආදිය භාවිත කරනු ලැබේ.

ඒ අනුව මෙම තේර් රථ දෙකෙහි ම කැටයම් දක්නට ලැබෙන්නේ පහළ කොටසේ ය. මෙම කැටයම් අතර පුරාණ දේව කථා, දේව පිළිම, යාලි රූප, හංස, භූත (වාමන) පේළි සහ ශෘංගාරාත්මක සැරසිලි මෝස්තර වලින් අලංකාර කර ඇත.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික වශයෙන් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.3** : **ශ්‍රී ලංකාවේ ලාක්ෂා කර්මාන්තය අධ්‍යයනය හා රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 63.1** : **''ලාක්ෂා නිර්මාණ අගයමු.''**

**කාලච්ඡේද** : 01 යි

**ඉගෙනුම් පල** :
- ලාක්ෂා කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ නම් කරයි.
- ලාක්ෂා කර්මාන්තය සඳහා අවශ්‍ය ලාක්ෂා සාදා ගන්නා ක්‍රමය අනුපිළිවෙළින් විස්තර කරයි.
- ලාක්ෂා සැරසිලි සඳහා භාවිත කරනු ලබන ප්‍රධාන ශිල්ප ක්‍රම දෙක විස්තර කරයි.
- ලාක්ෂා භාවිත කොට භාණ්ඩ සැරසිලි කරනු ලබන ආකාරය පැහැදිලි කරයි.
- ලාක්ෂා භාවිත කොට අලංකරණය කරනු ලබන භාණ්ඩ වර්ග සහ මෝස්තර නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ලාක්ෂා කර්මාන්තයට අදාළ රූප සටහන් / ඡායාරූප
- එම නිර්මාණ ඇතුළත් වීඩියෝ පට, සංයුක්ත තැටි, පරිගණක
- ඇමුණුම 6.3.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකා
- ඇමුණුම 6.3.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.3.1.1** :
- ලාක්ෂා කර්මාන්තයට අදාළ රූප සටහන් / ඡායාරූප පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම කර්මාන්තයට අදාළ නිර්මාණ ක්‍රියාවලිය දැක්වෙන වීඩියෝ පට, සංයුක්ත තැටි, පරිගණකය ඇසුරින් ප්‍රදර්ශනය කරන්න.
- ලාක්ෂා කර්මාන්තයට අදාළ සුවිශේෂ තාක්ෂණ ක්‍රම, ශිල්ප ක්‍රම සහ උපකරණ පවතින බව පැහැදිලි කර දෙන්න.
- ලාක්ෂා භාවිත කොට විවිධ භාණ්ඩ අලංකරණය කර ඇති බව නිදසුන් මඟින් පෙන්වා දෙන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.3.1.2** :
- ඇමුණුම 6.3.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකා පිටපත් සිසුන්ට බෙදා දෙන්න.
- ඇමුණුම 6.3.1.2ට ඇතුළත් කියවීමේ පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට බෙදා ක්‍රියාකාරකමේ යොදවන්න.
- අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.3.1.3** :
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ඒවායේ නිවැරදි භාවය සාකච්ඡා කරන්න.
- එම සාකච්ඡාව අතරතුර අනෙක් සිසුන්ට තම අනාවරණ නිවැරදි කර ගැනීමට උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 10 යි )

**ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස්:**
පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් ඇමුණුම 6.3.1.1 සහ ඇමුණුම 6.3.1.2 පදනම් කරගෙන ඇගයීම් සහ තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ලාක්ෂා කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ සහ ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍යය හඳුනා ගැනීම
- ලාක්ෂා කර්මාන්තය සඳහා යොදා ගන්නා තාක්ෂණ ක්‍රම, ශිල්ප ක්‍රම සහ උපකරණ පිළිබඳ ව විස්තර කිරීම
- ලාක්ෂා භාවිත කොට අලංකාර කරනු ලබන භාණ්ඩ වර්ග සහ මෝස්තර නම් කිරීම

**ඇමුණුම 6.3.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඇමුණුම 6.3.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාවේ රූප සටහන් අධ්‍යයනය කරන්න
- ඔබ කණ්ඩායමට අදාළ තේමාව යටතේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

**1. කණ්ඩායම** - ලාක්ෂා කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ සහ ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍යය නම් කරන්න.
**11. කණ්ඩායම** - ලාක්ෂා කර්මාන්තය සඳහා යොදා ගන්නා තාක්ෂණ ක්‍රම, ශිල්ප ක්‍රම සහ උපකරණ පිළිබඳ ව විස්තර කරන්න.
**111. කණ්ඩායම** - ලාක්ෂා භාවිත කොට අලංකරණය කරනු ලබන පාරිභාරික භාණ්ඩ වර්ග සහ යොදා ගනු ලබන මෝස්තර නම් කරන්න.

- අනාවරණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- ගුරුතුමාගේ / ගුරුතුමියගේ සහාය ලබාගන්න.

**ඇමුණුම 6.3.1.2**

## කියවීම් පත්‍රිකාව

**ඓතිහාසික පසුබිම**

මහනුවර යුගයේ දී ලාක්ෂා කලා කර්මාන්තය වඩාත් ප්‍රචලිත ව පැවති බවට සාධක පවතී. " කොට්ටල් බද්ද" නමැති රාජකීය කාර්මික කාර්යාංශයේ පවා ඔවුන් සේවය කොට ඇත. එහි දී ඔවුන් හඳුන්වා ඇත්තේ "හංගිඩි වසම" යනුවෙනි. එම ශිල්පීන් "හංගිඩියන්" යනුවෙන් මෙම යුගයේ දී හඳුන්වා තිබේ.

**ප්‍රචලිත ප්‍රදේශ**

මාතලේ- හපුවිද
තංගල්ල - අඟුල් මඩුව
මහනුවර - හුරීකඩුව
බලංගොඩ - පල්ලේකන්ද

මේ අතරින් වර්තමානය වන විටත් මෙම කලා කර්මාන්තය වඩාත් සක්‍රිය ව පවතින්නේ මාතලේ හපුවිද ප්‍රදේශයේ ය.

**අමුද්‍රව්‍ය**

ලාක්ෂා කලා කර්මාන්තය සඳහා වන ප්‍රධාන අමුද්‍රව්‍යය ලාක්ෂා ය. මේවා ලාක්ෂා නමැති කෘමියාගෙන් ලබා ගනී.

**අමුද්‍රව්‍ය සකස් කරගන්නා ආකාරය**

ලාක්ෂා කෘමියාගේ ශරීරයෙන් පිට වන ලාටු වැනි ද්‍රව්‍යය සුළං වැදී ඝන වී ලාක්ෂා බවට පත් වේ. එම ද්‍රව්‍යය අඩංගු අතු රිකිලි කපාගෙන පවනේ වේළා ඒවායේ ඇති ලාක්ෂා පිහියක් වැනි ආයුධයකින් සූරා ගත යුතු ය. ඉන් පසු කපු රෙදි කඩක ඔතා තදින් ගැට ගසා ළිපට ඉහළින් අල්ලා රත් කොට උණුවෙන පිරිසිදු ලාක්ෂා මිරිකා ඉවතට ගත යුතු ය. එසේ ලබා ගත් ලාක්ෂා නැවත රත් කොට කැබලිවලට වෙන් කොට ගනී.

**සායම් පිළියෙළ කර ගන්නා ආකාරය**

රතු - සාදිලිංගම්
කුඩුකළු - පහන් දැලි හෝ කැකුණ දැලි
කහ - හිරියල්
කොළ - කහ හිරියල් සහ නිල් පාට එකතු කොට සාදා ගත් ලාක්ෂා කෝටු දෙකක සවි කොට ගෙන රත් කර, සායම් කුඩු මිශ්‍ර කර හොඳින් පදම ලැබෙන තුරු අදිමින් සකස් කර ගත යුතු ය.

**ලාක්ෂා භාවිතය**

දැවමය භාණ්ඩවල මතුපිට අලංකාර කිරීම සඳහා පමණක් ලාක්ෂා භාවිත කෙරේ.

**ශිල්ප ක්‍රම**

ලාක්ෂා මගින් සැරසිලි යොදන ප්‍රධාන ශිල්ප ක්‍රම දෙකකි. (දැවමය භාණ්ඩවල පමණක් ලාක්ෂා මෝස්තර යෙදීම සිදු කරනු ලැබේ.)

**නියපොතු වැඩ** -

මෙහි දී ලාක්ෂා කෙඳි භාවිත කොට සැරසිලි යොදයි. රත් කළ ලාක්ෂා කැබැල්ල ඇඟිලිවලින් අල්ලා ඇදීමෙන් මෙම දික් කෙඳි සකස් කරගත හැකි ය. එක් පැහැයක කෙඳි භාණ්ඩය මත ඇලවීමෙන් පසු අනෙකුත් වර්ණවල කෙඳිවලින් මෝස්තර යොදනු ලැබේ. මේ සඳහා නියපොත්ත භාවිත කරන බැවින් මෙම ක්‍රමය "නියපොතු වැඩ" යනුවෙන් හැඳින්වේ.

**පට්ටල් වැඩ -**

පට්ටලයට අල්ලන ලද භාණ්ඩය කැරකැවෙන විට රත් කර ගත් ලාක්ෂා කැබැල්ල එයට අල්ලනු ලැබේ. එහි දී භාණ්ඩයේ ලාක්ෂා ඒකාකාර ව හොඳින් තැවරේ. විශාල භාණ්ඩ නිර්මාණයේ දී මෙම ක්‍රමය බහුල ව භාවිත වේ. එසේ එක් වර්ණයක් සම්පූර්ණ භාණ්ඩය මත තවරා පසු ව මෝස්තර යොදනු ලැබේ.

**ලාක්ෂාවලින් මෝස්තර යෙදීම සඳහා භාවිත වන සැරසිලි ඒකක**


| | | | |
|---|---|---|---|
| වැල්පොත | ලණු දඟය | ගල්බින්දු | බෝකොළ |
| පළාපෙති | තනි බින්දුව | කුන්දිරක්කන් | තනිපට ලණුව |
| දෙපට ලණුව | | | |

**ලාක්ෂා ආධාරයෙන් අලංකාර කරනු ලබන භාණ්ඩ**

බුලත් තට්ටු, සේසත් මිටි, කොඩි මිටි, හෙල්ල මිටි, බීරළු, බුලත් තට්ටු, සැරයටි, වටාපත් මිටි, උඩැක්කි කඳන්




නියපොතු වැඩ




පට්ටල් වැඩ



ලාක්ෂා භාණ්ඩ අලංකාර කිරීම







ලාක්ෂාවලින් අලංකාර කරන ලද භාණ්ඩ

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් වශයෙන් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනා ගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.4** : **තෝරාගත් ශෛලිගත වේදිකා නාට්‍යයක දක්නට ලැබෙන චිත්‍රමය ගුණාංග රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.4.1** : **''ශෛලිගත නාට්‍ය රස විඳිමු.''**

**කාලච්ඡේද** : 01 යි

**ඉගෙනුම් පල** :
- ශෛලිගත වේදිකා නාට්‍යයක විශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ශෛලිගත වේදිකා නාට්‍ය කිහිපයක් නම් කරයි.
- ශෛලිගත වේදිකා නාට්‍යවල දී අංග රචනය භාවිත කරනු ලබන ආකාරය තෝරාගත් වේදිකා නාට්‍යක් ඇසුරින් පැහැදිලි කරයි.
- ශෛලිගත වේදිකා නාට්‍යවල චරිතවලට උචිත ආකාරයට රංග භාණ්ඩ සහ රංග වස්ත්‍රාභරණ යොදා ගනු ලබන ආකාරය විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ශෛලිගත නාට්‍යවලට අදාළ රූප සටහන් / ඡායාරූප
- ශෛලිගත නාට්‍යය ඇතුළත් වීඩියෝ පට, සංයුක්ත තැටි
- පරිගණක යන්ත්‍ර
- ඇමුණුම 6.4.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකා
- ඇමුණුම 6.4.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකා

(මිනිත්තු 10 යි)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.4.1.1** :
- ශෛලිගත නාට්‍යවලට අදාළ රූප සටහන් / ඡායාරූප පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ශෛලිගත නාට්‍යකට අදාළ වීඩියෝ පට/ සංයුක්ත තැටියක් පරිගණකය ඇසුරින් ප්‍රදර්ශනය කරන්න.
- ශෛලිගත නාට්‍යවල පසුතල නිර්මාණය, අංග රචනය, රංග වස්ත්‍රාභරණ රංග භාණ්ඩ ආදිය භාවිතයේ ඇති විශේෂ ලක්ෂණ පිළිබඳ ව එම වීඩියෝ පට/ සංයුක්ත තැටිය අනුසාරයෙන් සාකච්ඡා කරන්න.

(මිනිත්තු 20 යි)

පියවර 6.4.1.2 :
- ඇමුණුම 6.4.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකා පිටපත් සිසුන්ට බෙදා දෙන්න.
- ඇමුණුම 6.4.1.2ට ඇතුළත් කියවීමේ පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට බෙදා ක්‍රියාකාරකමේ යොදවන්න.
- අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒවායේ නිවැරදි භාවය සාකච්ඡා කරන්න.

- එම සාකච්ඡාව අතරතුර අනෙක් සිසුන්ට තම අනාවරණ නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස්:**

පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් ඇමුණුම 6.4.1.1 සහ ඇමුණුම 6.4.1.2 පදනම් කරගෙන ඇගයීම් සහ තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ශෛලිගත වේදිකා නාට්‍යක විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම සහ එවැනි නාට්‍ය කිහිපයක් නම් කිරීම
- ශෛලිගත වේදිකා නාට්‍යවල දී අංග රචනය භාවිත කරනු ලබන ආකාරය තෝරාගත් වේදිකා නාට්‍යයක් ඇසුරින් පැහැදිලි කිරීම (වර්ණ සංකලනය, උචිත වර්ණ භාවිතය පිළිබඳ අවධානය යොමු කරමින්) ශෛලිගත වේදිකා නාට්‍යයවල චරිතවලට උචිත ආකාරයට රංග භාණ්ඩ නිර්මාණය කර ඇති ආකාරය හඳුනා ගැනීම
- ශෛලිගත වේදිකා නාට්‍ය සඳහා නිර්මාණය කරනු ලබන රංග වස්ත්‍රාභරණවල චිත්‍රමය ලක්ෂණ විස්තර කිරීම

**ඇමුණුම 6.4.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඇමුණුම 6.4.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාවේ රූප සටහන් අධ්‍යයනය කරන්න.
- ඔබ කණ්ඩායමට අදාළ මාතෘකාව යටතේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

**1. කණ්ඩායම** - ශෛලිගත වේදිකා නාට්‍යයක විශේෂ ලක්ෂණ විස්තර කර එවැනි නාට්‍ය කිහිපයක් නම් කරන්න.

**11.කණ්ඩායම** - ශෛලිගත වේදිකා නාට්‍යවල දී අංග රචනය භාවිත කරනු ලබන ආකාරය තෝරා ගත් වේදිකා නාට්‍යක් ඇසුරින් පැහැදිලි කරන්න.

**111. කණ්ඩායම** - ශෛලීගත වේදිකා නාට්‍යවල චරිතවලට උචිත ආකාරයට රංග භාණ්ඩ සහ රංග වස්ත්‍රාභරණ යොදාගනු ලබන ආකාරය විස්තර කරන්න.

- අනාවරණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- ගුරුතුමාගේ / ගුරුතුමියගේ සහාය ලබාගන්න.

**ඇමුණුම 6.4.1.2**

## කියවීම් පත්‍රිකාව

**ශෛලිගත නාට්‍යය හැඳින්වීම**

නාට්‍ය ධර්මී සහ ලෝක ධර්මී යනුවෙන් ප්‍රධාන නාට්‍ය වර්ග දෙකක් වේ. මේ අතරින් ශෛලිගත නාට්‍යය අයත් වන්නේ නාට්‍ය ධර්මී අතරට ය. එම ශෛලිගත නාට්‍යයක විශේෂ ලක්ෂණ වන්නේ නාට්‍යයට අදාළ සියලු දෙබස්, ගීත සහ රිද්මානුකූල දෙබස් අනුසාරයෙන් යුක්ත වීම සහ නාට්‍යයේ සියලු ම අංග චලනයන් සහ ඇවිදයාම ආදිය සංගීත නාදයට සහ ගීතවලට අනුකූල ව රිද්මානුකූල ව සිදුවීම යි. මනමේ, සිංහබාහු සහ බෙරහඬ වැනි නාට්‍ය නිදසුන් ලෙස හැඳින්විය හැකි ය.

**පසුතල නිර්මාණය**

ශෛලිගත නාට්‍යවල දී වේදිකා පසුතලය චාම් සහ සරල බවකින් යුක්ත වේ. විශේෂයෙන් ම මෙහි දී ඒ ඒ අවස්ථාවට උචිත පසුබිම, ගීත ආදියෙන් ප්‍රේක්ෂකයාගේ මනසෙහි මවා දක්වීමක් සිදු කරයි.

## අංග රචනය

ශෛලිගත නාට්‍යක අංග රචනය (වේෂ නිරූපණය ) බහුල ව ම යොදා ගැනේ. ඒ ඒ චරිතයට අදාළ භූමිකාව සහ ගති ලක්ෂණ ඉස්මතු කර ගැනීම සඳහා අවශ්‍ය ආකාරයට මුහුණ පාට කිරීම සහ වෙනත් සලකුණු ඇඳීම මෙන් ම රැවුළු, කොණ්ඩා ආදිය ඇලවීම ආදිය මෙම නාට්‍යවල බහුල ව ම සිදු වේ. සිංහබාහු නාට්‍යයේ සිංහයාගේ චරිතය සහ මනමේ නාට්‍යයේ වැදි රජුගේ චරිතය නිදසුන් ලෙස දැක්විය හැකි ය.

## රංග භාණ්ඩ

ශෛලිගත නාට්‍යවල එන විවිධ චරිතවලට අදාළ භූමිකාව ඉස්මතු කරලීම සඳහා රංග භාණ්ඩ අත්‍යවශ්‍ය වේ. එමෙන් ම එයින් නාට්‍යට යම්කිසි අලංකාරයක් ද ගෙන දේ. කඩු, හෙල්ල, තෝමර වැනි දේවල් මෙයට අයත් වේ.

## රංග වස්ත්‍රාභරණ

නාට්‍යට අදාළ චරිතවල භූමිකාව සාර්ථක ව ප්‍රකාශ වීම සඳහාත් නාට්‍යයේ අලංකාරය උදෙසාත් රංග වස්ත්‍රාභරණවලින් මහත් පිටුවහලක් ලැබේ. ඇඳුම්, ඔටුනු, නළල්පට, කර මාල, උර මාල, වළලු, තෝඩු, මුදු, පාද ජාලා, පාද සලං සහ සපත්තු රංග වස්ත්‍රාභරණ ලෙස නම් කළ හැකි ය.



මනමේ වේදිකා නාට්‍යයේ අවස්ථාවක්



සිංහබාහු වේදිකා නාට්‍යයේ අවස්ථාවක්



බෙරහඬ
වේදිකා නාට්‍යයේ
අවස්ථාවක්

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක්කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.5** : **තෝරාගත් දේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.5.1** : **''එස්.පී චාර්ල්ස් ශිල්පියාගේ නිර්මාණ අගයමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි

**ඉගෙනුම් පල** :
- එස්.පී. චාර්ල්ස් ශිල්පියාගේ කලා නිර්මාණ නම් කරයි.
- ජාතික කොඩිය හා සෙංකෝලය සඳහා භාවිත කර ඇති සංකේත විස්තර කරයි.
- ජාතික කොඩියෙහි හා සෙංකෝලයෙහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ජාතික කොඩිය හා සෙංකෝලයෙහි කලාත්මක ලක්ෂණ රසවිඳියි.
- එම නිර්මාණ ආරක්ෂා කිරීමේ වැදගත්කම පවසයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 6.5.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.5.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- එස්.පී චාර්ලස් ශිල්පියාගේ නිර්මාණවල පින්තූර ඇතුළත් ඉගෙනුම් ආධාරක (පරිගණක, සී.ඩී. පට, පිටු පෙරළනය)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.5.1.1** :
- ජාතික කොඩියේ හා සෙංකෝලයේ ඡායාරූප සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ පිළිබඳ සිසු අදහස් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.5.1.2** :
- ඇමුණුම 6.5.1.1.ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.
- ඇමුණුම 6.5.1.2.ට ඇතුළත් කියවීම් පත්‍රිකාව පන්තියේ කියවීමට සලස්වන්න.
- පින්තූර මඟින් විෂය කරුණු තහවුරු කරන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සිසුන් යොමුකරන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.5.1.3** :
- සුදුසු ක්‍රමවේද භාවිත කර පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සදොස් පිළිතුරු නිදොස් කර සමස්ත ප්‍රශ්නාවලියට පිළිතුරු සපයාගැනීමට සලස්වන්න.

(මිනිත්තු 10 යි )

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.5.1.1 හා ඇමුණුම 6.5.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- එස්.පී. චාර්ල්ස් ශිල්පියාගේ කලා නිර්මාණ නම් කිරීම
- ජාතික කොඩියෙහි හා සෙංකෝලය සඳහා භාවිත කර ඇති සංකේත විස්තර කිරීම
- ජාතික කොඩියෙහි හා සෙංකෝලයෙහි සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීම
- ජාතික කොඩිය හා සෙංකෝලයෙහි කලාත්මක ලක්ෂණවල වැදගත්කම සාකච්ඡා කිරීම

**ඇමුණුම 6.5.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති එස්.පී චාර්ල්ස්ගේ නිර්මාණ නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ගුරුවරයාගේ උපදෙස් මත කණ්ඩායම් දෙකකට බෙදෙන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරත වන්න.

**1 කණ්ඩායම** - එස්. පි. චාර්ල්ස්ගේ කලා නිර්මාණ දායකත්වය ලද ජාතික කොඩිය ඇඳ එහි විවිධ සංකේතවල අර්ථ ලියා දක්වන්න.

**11 කණ්ඩායම** - සෙංකෝලයේ මූලික හැඩය ඇඳ එහි යොදා ඇති සැරසිලි නම් කරන්න.

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

**ඇමුණුම 6.5.1.2**

## කියවීම් පත්‍රිකාව


**එස්. පී. චාර්ල්ස්**

- 1916 මාතර වැලිගම උපත ලත් එස්. පී. චාර්ල්ස් කොක්මාදුවේ නානායක්කාර ශිල්පියා යටතේ මූලික ව චිත්‍ර කලාව ප්‍රගුණ කර ඇත.
- පාරම්පරික බෞද්ධ සිතුවම් පිටපත් කිරීම හා එහි උන්නතිය වෙනුවෙන් විශාල මෙහෙවරක් කළ ශිල්පියෙකි.
- එස්. පී. චාර්ල්ස් 1944 දී කොළඹ කාර්මික විද්‍යාලයේ චිත්‍ර අංශයේ ජේ.ඩී.ඒ. පෙරේරා යටතේ අධ්‍යාපනය ලැබූවෙකි.
- ශ්‍රී ලංකා රජයේ ජාතික කොඩිය හා පාර්ලිමේන්තුවේ සංකේතය වන සෙංකෝලය යන නිර්මාණ සඳහා ඔහුගෙන් ලද දායකත්වය ඉතා විශිෂ්ඨ වේ.

**ජාතික කොඩිය**

- වර්තමාන ජාතික කොඩිය වශයෙන් භාවිත කරන තීරු සහිත කොඩිය 1949 නිර්මාණය කරන ලද්දකි.
- ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය හා අභිමානය පිළිබිඹු කරන ලෙස ජාතික සංකේත භාවිත කරමින් කරන ලද නිර්මාණයකි.
- ජාතික කොඩියේ වර්ණ හා සංකේත මගින් පිළිබිඹු කරන අර්ථ නිරූපණය

| | | |
|---|---|---|
| කඩුව අතින් ගත් සිංහයා | - | තේජස හා උත්තරීතරභාවය |
| අසිපත | - | පරමාධිපත්‍යය |
| බෝකොළ සතර | - | සතර බ්‍රහ්ම විහරණ (මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා) |
| රඹපාට තීරුව | - | ද්‍රවිඩ ජනතාව |
| කොළපාට තීරුව | - | මුස්ලිම් ජනතාව |
| තද රතුපාට පසුබිම | - | සිංහල ජනතාව |




**සෙංකෝලය**

- සෙංකෝලය පාර්ලිමේන්තුව තුළ කතානායකවරයාගේ අධිකාරී බලය සංකේතවත් කරයි.
- එමෙන් ම එය සමස්ථ මන්ත්‍රී මණ්ඩලයේ බලතල පිළිබඳ සංකේතයක් ද වෙයි.
- සෙංකෝලය යන්න බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව 1949 දී මෙරට පාර්ලිමේන්තුවට හඳුන්වා දෙන ලද්දකි.
- මෙම සෙංකෝලයේ සැලසුම නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවනුයේ එස්. පී. චාර්ල්ස් ශූරීන්ට ය.

- 1947 එස්. පී. චාර්ල්ස් විසින් අඳින ලද සැලසුම් අනුව මෙම සෙංකෝලය නිර්මාණය කරන ලද්දේ බ්‍රිතාන්‍ය රාජකීය ආභරණ නිෂ්පාදන සමාගමක් විසිනි.
- සෙංකෝලය සැලසුම් නිර්මාණය කිරීමේ දී දේශීය අනන්‍යතාව මනාව ප්‍රදර්ශනය කරන සාම්ප්‍රදායික සැරසිලි රටා හා ආකෘති භාවිත කර තිබේ.
- සෙංකෝලය දිගින් සෙ.මී 122 ක් වන අතර මෙම නිර්මාණය සඳහා රන් රිදී මැණික් මෙන් ම මිට සාදා ගැනීම සඳහා කළුවර ලී භාවිත කොට ඇති බව දැකිය හැකි ය.
- කළුවර ලීයෙන් තැනූ මිට මධ්‍යයේ බිනර මල හා පලා පෙති රටාවලින් අලංකාර කර ඇත.
- කළුවර මිටට ඉහළින් පොළොන්නරු සම්ප්‍රදාය අනුව රන් හා රිදියෙන් කළ කුළුණු හිසකි.

- එහි මුල මැණික් ඔබ්බවා ඇති මුතු දැල් රටාවකි.
- කුළුණු හිස මත මහනුවර සම්ප්‍රදාය අනුව රිදියෙන් කළ නෙළුම් මල සහිත පේකඩයකි.(එය හිඳගල විහාරයේ පේකඩවල ආභාෂය සහිත වේ.)
- පේකඩයට පසු රිදියෙන් කළ සනකයකි. එහි සිව් පස සදාකාලිකත්වය, සාධාරණත්වය, සෞභාග්‍යය සංකේතවත් කරමින් ඉර, හඳ, ධර්ම චක්‍රය හා පුන්කලස ද කැටයම් කර ඇත.
- සනකය මත සෙංකෝලයේ ප්‍රධාන කොටස වන රිදයෙන් කළ සෙ. මී. 15ක් විශ්කම්භයෙන් යුතු ගෝලයකි.
- එ මතු පිට කඩුවක් අතින් ගත් සිංහරුවක් අල්ප උන්නත ව නිර්මාණය කර ඇත.
- ගෝලයේ ඉහළ හා පහළ රිදියෙන් හා රනින් කළ පලා පෙති (නෙළුම් පෙති) රටාවකි.
- ඊට ඉහළින් කේතුකාකාර අටැස් පළිගුවකි.
- එය චෛත්‍යයක කොත මුදුනේ ඇති චූඩා මාණික්‍ය හැඩය ගනියි. එය නිර්මලත්වය හා උත්තරීතර බව සංකේතවත් කරයි.
- මෙවැනි ස්වරූපයක් සහිත සෙංකෝලය සිංහල රාජ සභාවේ දී භාවිත කළ යෂ්ඨිය, සෝළු ලීය, ලීලා දණ්ඩය යන නම්වලින් හැඳින් වූ නිර්මාණයට සමාන වේ.





**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.6** : **දේශීය මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිත කලාත්මක අංග රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.6.1** : **''පුවත්පත් චිත්‍රකතා ශිල්පීන්ගේ නිර්මාණ අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :
- පුවත්පත් චිත්‍රකතා කලාවට පුරෝගාමී වූ ශිල්පීන් නම් කරයි.
- එම ශිල්පීන්ගේ සිතුවම්, තොරතුරු එක්රැස් කරයි.
- යොදා ගත් තේමා විමසා බලයි.
- නිර්මාණාත්මක ශෛලීය ලක්ෂණ විස්තර කරයි.
- සංරචන ලක්ෂණ සොයා බලයි.
- පුවත් පත් චිත්‍රකතාවල ඇති කලා ප්‍රකාශන ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- චිත්‍රකතා ශිල්පීන්ගේ වර්ණ චිත්‍ර නිර්මාණ
  - බන්දුල හරිස්චන්ද්‍ර
  - දයා රාජපක්ෂ
  - ජනක රත්නායක
- ඇමුණුම 6.6.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.6.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.6.1.1** :
- පුවත්පත් චිත්‍රකතා ශිල්පීන්ගේ නිර්මාණ සිසු අවධානයට යොමු කරවන්න.
- පුවත්පත් චිත්‍රකතා ශිල්පීන්ගේ විවිධ වූ නිර්මාණ කාර්ය භාරය සොයා බැලීමට සිසුන් යොමු කරවන්න.
- ඔවුන්ගේ නිර්මාණවල තේමාව, ශෛලීය ලක්ෂණ ආදී කරුණු සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි )

**පියවර 6.6.1.2** :
- ඇමුණුම 6.6.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.6.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව අධ්‍යයනයට සිසුන්ට යොමු කරවන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට සහාය වන්න.

(මිනිත්තු 60 යි )

**පියවර 6.6.1.3** :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- පුවත්පත් චිත්‍රකතා ශිල්පීන්ගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.6.1.1 හා ඇමුණුම 6.6.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- පුවත්පත් චිත්‍රකතා සඳහා පුරෝගාමී ශිල්පීන් පිළිබඳ සොයා බැලීම
- එම නිර්මාණ ශිල්පීන්ගේ නිර්මාණ, තොරතුරු එක්රැස් කිරීම
- පුවත්පත් චිත්‍රකතා සඳහා පදනම් වූ නිර්මාණ ශෛලීය ලක්ෂණ විස්තර කිරීම
- සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කිරීම
- පුවත්පත් චිත්‍රකතා ශිල්පීන්ගේ නිර්මාණවල ඇගයීමට හා රසාස්වාදයට ලක් කිරීම

**ඇමුණුම 6.6.1.1**

**කාර්ය පත්‍රිකාව**

- ඔබට ඉදිරිපත් කර ඇති පුවත්පත් චිත්‍රකතා නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පුවත්පත් චිත්‍ර කතා නිර්මාණවල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරත වන්න.
    1. පුවත්පත් චිත්‍රකතා කලාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
    2. පුවත්පත් චිත්‍රකතා ශිල්පීන් නම් කරන්න.
    3. පහත සඳහන් කරුණු යටතේ පුවත්පත් චිත්‍රකතා ශිල්පීන්ගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
        i. වස්තු විෂය
        ii. සුවිශේෂ නිර්මාණ ලක්ෂණ
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.6.1.2


## කියවීම් පත්‍රිකාව

- චිත්‍රකතා සම්ප්‍රදායය ලොව බිහි වූයේ ප්‍රවෘත්ති පත්‍ර ඔස්සේ ය.
- චිත්‍රකතා පළමු ව ආරම්භ වන්නේ 19 වැනි සියවසේ ඇමරිකානු ප්‍රවෘත්ති පත්‍රවල ය.
- චිත්‍රකතා ආරම්භයේ දීම ඒවා කාටුන් ස්වරූපයකට හෙවත් හාස්‍යෝත්පාදක ස්වභාවයක් ගත් අතර පසුකාලීන ව ඒවා තාත්විකත්වයට නැඹුරු වෙමින් නිර්මාණය වීම සිදුවේ.
- ශ්‍රී ලංකාවේ ප්‍රථම චිත්‍රකතාව පළ වූයේ 1951 ඔකතෝබර් 28 වැනිදා ඉරිදා ලංකාදීප පත්‍රයේ ය.
- එය "නීලා'' නම් විය. මෙම චිත්‍රකතා ශිල්පයා වූයේ ජී. ඇස්. ප්‍රනාන්දු ය.
- ප්‍රවෘත්ති පත්‍රවල චිත්‍රකතා පළවීමට අමතර ව පසුකාලීන ව චිත්‍ර කතා සඳහා ම වෙන් වූ චිත්‍රකතා පත්තර නිර්මාණය විම සිදුවිය. "සිත්තර" එසේ ආරම්භ වූ පළමු චිත්‍රකතා පත්තරය විය. එසේ ම සතුට, චිත්‍රමිත්‍ර, සත්සර, විශ්ම ආදීය එකල ජනප්‍රිය වූ චිත්‍රකතා පුවත් පත් අතර විය.
- මෙරට බාල මහලු බේදයකින් තොරව ජනප්‍රිය වී තිබු චිත්‍රකතා කලා සම්ප්‍රදායය වර්තමානයේ ජනප්‍රියත්වයෙන් ගිලිහී ගිය කලා සම්ප්‍රදායයක් බවට පත්වී ඇති බව හැඳින් විය හැකි ය.
- චිත්‍ර කතා ක්ෂේත්‍රය මඟින් ශිල්පින් රැසක් බිහි ව ඇති අතර ඔවුන් අතර විවිධාකාර ව ප්‍රවනතා පෙන් වූ පුරෝගාමී ශිල්පීන් ලෙස බන්ධුල හරිශ්චන්ද්‍ර, දයා රාජපක්ෂ හා ජනක රත්නායක යන ශිල්පීන් හඳුනාගත හැකි ය.

**බන්ධුල හරිශ්චන්ද්‍ර (1940 - )**

- කුඩා කල සිට චිත්‍ර කලාවට දක්ෂතා දැක් වූ බන්ධුල හරිශ්චන්ද්‍ර, මූලික අධ්‍යාපනයෙන් පසු ව රජයේ ලලිත කලායතනයේ චිත්‍ර කලාව පිළිබඳ සති අන්ත පාඨමාලාව හදාරන ලදී.
- විවිධ ක්ෂේත්‍ර ඔස්සේ දක්ෂතා දැක්වූ බන්ධුල රෙදි සහ මැටිබඳුන් පින්තාරු කිරීම, මූර්ති ශිල්පය හා තොරණ චිත්‍ර කලාවට ද දායක වෙමින් අභිමත නිදහස් ශෛලියක් ගොඩනගා ගැනීමට යොමු වූවෙකි.
- පුවත්පත් චිත්‍රකතා ජනප්‍රිය වී තිබුණු අවධියේ ඒ පිළිබඳ කැමැත්තෙන් චිත්‍රකතා ඇඳීමට යොමු වූ ඔහු 1962 ලේක්හවුස් ආයතනයේ "දිනමිණ" පුවත්පතට සම්බන්ධ ව ජාතක කතා ඇසුරින් චිත්‍රකතා ඇඳීම ආරම්භ කළේ ය.
- ඔහු විසින් අඳින ලද පළමු ජාතක කතාව වන්නේ "සුලසා" ජාතකය යි.
- ශ්‍රී ලංකාවේ ප්‍රථම වර්ණ චිත්‍රකතාව ලෙස "නල දමයන්ති"නිර්මාණය කරන ලද්දේ ඔහු විසිනි.
- ඔහුගේ නිර්මාණ සඳහා වස්තු විෂය වූයේ ජාතක කතා මෙන් ම බයිබල් කතා, ලංකා ඉතිහාස කතා, මහාභාරත කතා, ග්‍රීක වීර කාතා, අරාබි නිසොල්ලාස කතා හා ජපන් සෙන්කතා ආදිය යි.
- ජීවරූප ඇඳීමේ පෘථුල හැකියාවක් මෙන් ම විවිධ පරිසර පද්ධතී, විවිධ පරිසරවල මිනිසුන්ගේ දේහ ලක්ෂණ, ඇඳුම් පැලඳුම්, ආභරණ ආදිය ඉතා නිවැරදි ව චිත්‍රණය කිරීමේ හැකියාවක් බන්ධුල හරිශ්චන්ද්‍ර තුළ තිබූ බව ඔහුගේ අතිවිශාල චිත්‍රකතා සමූහය නිරීක්ෂණයෙන් පෙනේ.





**දයා රාජපක්ෂ (1941-)**

- දයා රාජපක්ෂ කුඩා කළ සිට ම චිත්‍රකලාවට උනනුවක් දක් වූ අතර ඔහුගේ චිත්‍ර ඇඳීමේ හැකියාව වඩාත් දියුණු කරගැනීමට පාසල් චිත්‍ර කලාව ස්වසහය ඉවහල් විය.
- චිත්‍ර කතා ක්ෂෙත්‍රයට පිවිසි දයා රාජපක්ෂගේ පළමු වැනි චිත්‍ර කතාව වූයේ සිළුමිණ පත්‍රයේ පළ වූ "ඉන්දු" නම් චිත්‍ර කතාව යි. ඒ 1966 වසරේ දී ය.
- "ඉන්දු" චිත්‍රකතාවෙන් ජනප්‍රියත්වයට පත් වූ දයා රාජපක්ෂ දිනමිණ පත්‍රයට ඇඳි "ආදර කොමා" නමැති චිත්‍රකතාව ද පාඨකයන් අතර ඉතාමත් ජනප්‍රිය වූ නිර්මාණයක් විය.
- ඔහු විසින් නිර්මාණය කරන ලද සෙසු ජනප්‍රිය චිත්‍ර කතා අතර ගිනිගත් කිරීටය, හුලවාලි, සාම පුරාණය, අනුපමා, රක්තා, වෙද හාමුදුරුවෝ, තවලම වැනි චිත්‍රකතා රාශියක් විය.
- ඔහුගේ බොහෝ චිත්‍රකතා ස්වතන්ත්‍ර නිර්මාණ විය. ඒවා සමාජය තුළ ජීවත්වන සැබෑ චරිතවලින් යුක්ත ය. එම නිසා ම ඔහුගේ බොහෝ චිත්‍රකතා චිත්‍රපට නිර්මාණයට හා ටෙලිනාට්‍ය නිර්මාණයට ද තෝරා ගන්නා ලදී.
- ජීවරූප ඇඳීමේ පෘථුල හැකියාවක් මෙන් ම නාගරික පරිසරවල මිනිසුන්ගේ දේහ හා චරිත

ලක්ෂණ, ඇඳුම් පැළඳුම් ආදිය ඉතා නිවැරදි ව චිත්‍රණය කිරීමේ හැකියාවක් තිබූ බව ඔහුගේ චිත්‍රකතා සමූහය ඇසුරින් පත්‍යක්ෂ වේ.





**ජනක රත්නායක**

- කොළඹ නාලන්ද විද්‍යාලයේ විද්‍යා විෂයයන් හදෑරූ ජනක රත්නායක චිත්‍ර ශිල්පයට සහජ දක්ෂතාවයක් පෙන් වූ අයෙකි.
- 70 දශකය චිත්‍ර කලා ක්ෂේත්‍රයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්විය හැකි අතර එම වකවානුව තුළ නව නිර්මාණාත්මක ශෛලියකින් ක්ෂේත්‍රයට පිවිසි ශිල්පියෙකි.
- 1971 වසරේ සිට 1979 වසර දක්වා වකවානුව තුළ ජනක රත්නායක විසින් දවස, ලේක්හවුස්, මල්ටි පැක්ස් නම් විවිධ ආයතනවල සේවය කරමින් තම චිත්‍ර කතා රාශියක් නිර්මාණය කිරීමට

දායක විය.

- ඔහුගේ නිර්මාණ අතර සාරංගා, කබළෙන් ලිපට, සුසීමා, අත්තික්කා මල, පාට පාට හීනයක්, යළි පිපුණු මලක්, කළු පරෙවියෝ වැනි නිර්මාණ එකල ජනප්‍රිය වූ චිත්‍රකතා කිහිපයකි.
- සෙසු චිත්‍ර කතාකරුවන්ගෙන් වෙනස් වී පෙනෙන්නට මුල් වූ එක් කරුණක් වූයේ ඔහු සිය කතා හා චරිතවල ක්‍රියාකාරකම් සඳහා සැබෑ ස්වභාවික දර්ශන තල උපයෝගි කර ගැනීමයි. උදාහරණ ලෙස ලෙක්හවුස් ආයතනය, නිදහස් චතුරශ්‍රය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, දේශන ශාලා, ශිෂ්‍ය නේවාසිකාගාර, ආපන ශාලාව ආදිය දැක්විය හැකි ය.
- එකළ නාගරික තරුණ පරපුරේහි විලාසිතා, යානවාහන එමෙන් ම  බටහිර චිත්‍රපටවල දැක්වෙන සොල්දාදුවන්, යුධ වාහන, අවි ආයුධ වැනි දේ නිර්මාණ විෂයට පාදක කරගැනීම ද දැකිය හැකිවේ.
- ස්වාභාවික රූප හා විස්තරාත්මක රේඛාකරණය සමඟ දියසායම් ශිල්පක්‍රමයෙන් වර්ණ ගැන්වුන ඔහුගේ නිර්මාණාත්මක ශෛලියෙන් ජනප්‍රිය වූ චිත්‍රකතා රාශියක් ටෙලිනාට්‍ය කලාවට ද විෂය වී ඇත.





**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.1.** : **ඓතිහාසික ගෘහ නිර්මාණ ආශ්‍රිත කලා අංග අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.1** : **''සඳකඩ පහණ නිර්මාණය අගයමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- සඳකඩ පහණ යනු කුමක් දැ යි හඳුනා ගනියි.
- අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය තෙක් සඳකඩ පහණේ විකාශය විස්තර කරයි.
- සඳකඩ පහණ කැටයම්වල ඇති කලාත්මක ලක්ෂණ ඇගයීමට ලක් කරයි.
- සඳකඩ පහණේ කැටයම්වල විවිධ අදහස් හා මතවාද සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 7.1.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.1.2.ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- විවිධ යුගවල නිර්මාණය වූ සඳකඩ පහණ ඡායාරූප
- විවිධ යුගවල සඳකඩ පහණ දැක්වෙන සී.ඩී පට හා වීඩියෝ
- පරිගණක යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, ටැබ්
- කඩදාසි, ෆෙල්ට් පෑන්, පැන්සල්, අඩිරූල්, කවකටු

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.1.1.1** :
- සඳකඩ පහණ සහිත ඡායාරූප, වීඩියෝ පට, සංයුක්ත තැටි, කදා, පරිගණක යන්ත්‍ර, ටැබ් උපයෝගී කරගෙන පන්තියට පෙන්වන්න.
- පෙන්වන ලද සේයා රූ පිළිබඳ ව සිසු අදහස් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.1.1.2** :
- පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට බෙදීම.
- ඇමුණුම 7.1.1.1.ට අදාළ ගවේෂණ කාර්ය උපදෙස් පත්‍රිකා කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- ඇමුණුම 7.1.1.2.ට ඇතුළත් කියවීම් පත්‍රිකා කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- කණ්ඩායම අදාළ තේමා යටතේ ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායමේ කරුණු ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 7.1.1.3** :
- කණ්ඩායම සොයා ගත් කරුණු ඉදිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- එක් කණ්ඩායමක් ඉදිපත් කරන විට එහි කරුණු අනිත් කණ්ඩායම්වලට සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කර සිසු ඉදිරිපත් කිරීම් ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.1.1 හා ඇමුණුම 7.1.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- සඳකඩ පහණ යනු කුමක් දැ යි හඳුනා ගැනීම.
- අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය තෙක් සඳකඩ පහණේ විකාශය විස්තර කිරීම.
- සඳකඩ පහණේ කැටයම්වල විවිධ අදහස් හා මතවාද සාකච්ඡා කිරීම.

**ඇමුණුම 7.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කරන ලද සඳකඩ පහණ ඡායාරූප නිරීක්ෂණය කරන්න.
- ගුරුවරයාගේ උපදෙස් මත කණ්ඩායම් තුනකට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට අදාළ මාතෘකාව තෝරාගෙන ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

**01 කණ්ඩායම** - අනුරාධපුර යුගයේ සඳකඩ පහණ
**02 කණ්ඩායම** - පොළොන්නරු යුගයේ සඳකඩ පහණ
**03 කණ්ඩායම** - මහනුවර යුගයේ සඳකඩ පහණ

- ඔබ කණ්ඩායමට අයත් සඳකඩ පහණේ රූපයක් ඩිමයි කඩදාසි මත ඇඳ එහි නිරූපිත අංග නම් කරන්න.
- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

**ඇමුණුම 7.1.1.2**

## කියවීම් පත්‍රිකාව

- පූජනීය ස්ථානයකට පිවිසෙන පඩිපෙළ පාමුල පිහිටි අර්ධ කවාකාර කැටයම් පුවරුව සඳකඩ පහණ නමින් හැඳින්වේ.
- ඉරහඳ ගල, අඩ්ඩඡන්න පාෂාණ (අඩසඳ පහණ), පාටිකා යන නම්වලින් ද සඳකඩ පහණ හඳුන්වනු ලබයි.
- ආරම්භයේ දී හතරැස් ගල් පුවරුවක් වූ මෙය අනුරාධපුර, පොළොන්නරු යුගවල අර්ධකවාකාර හැඩය දක්වා වර්ධනය විමත්, මහනුවර යුගයේ දි ත්‍රිකෝණාකාර හැඩයක් දක්වා වෙනස් වීමත් දැකිය හැක.
- මුල් අවස්ථාවේ කැටයම් රහිත වූ සඳකඩ පහණ ක්‍රමික ව විවිධ කැටයම් එකතු වී අගනා නිර්මාණයක් බවට පත් වීම සිදු වේ.
- අර්ධ වෘත්තාකාර හැඩය තීරු පහකින් යුතු වූ කැටයම් නිර්මාණය වීම හා මෙම එක් එක් තීරුවෙන් නිරූපිත කැටයම් මඟින් ප්‍රකාශිත අර්ථ, මහාචාර්ය සෙනරත් පරණවිතානට අනුව පහත වගුවෙන් දැක්වේ.

| තීරුව | නෙළා ඇති කැටයම | සංකේතාත්මක අර්ථය |
|---|---|---|
| පළමු | ගිනිදැල්ල | තෘෂ්ණාව ආශාව රාග ගින්න |
| දෙවන | සත්ත්වාවලිය (ඇත්, අස්, සිංහ, ගව) | ජාති ජරා ව්‍යාධි මරන |
| තෙවන | සංකීර්ණ ලියවැල | තෘෂ්ණාවේ වෙළීම |
| සිවුවන | හංසාවලිය | සත්‍යාවබෝධය කරා යන ගමන |
| පස්වන | සරල ලියවැල් | බැඳීම්වලින් ලිහිල් වීම |
| හයවන | අඩ නෙළුම | නිවන |

## විවිධ අවධි අනුව කලාත්මක අතින් උසස් සඳකඩපහන නිර්මාණ

**අනුරාධපුර යුගය**

- අනුරාධපුර බිසෝ මාළිගයේ (මහසෙන් මාළිගයේ) සඳකඩ පහණ

**පොළොන්නරු යුගය**

- පොළොන්නරු වටදාගෙයි සඳකඩ පහණ

මහනුවර යුගය

- මහනුවර දළදා මාළිගයේ සඳකඩ පහණ



අනුරාධපුර බිසෝ මාළිගයේ සඳකඩපහණ



පොළොන්නරු වටදාගෙයි සඳකඩ පහණ



මහනුවර දළදා මාළිගයේ සඳකඩ පහණ

**නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතාව මට්ටම 7. 1 : ඓතිහාසික ගෘහ නිර්මාණ ආශ්‍රිත කලා අංග අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.2 : ''මුරගල, කොරවක්ගල හා පියගැට පෙළ නිර්මාණ අගයමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි

**ඉගෙනුම් පල :**
- මුරගල, කොරවක්ගල, හා පියගැට පෙළ යනු ස්තූපය ආශ්‍රිත ගෘහ නිර්මාණ අංග බව විස්තර කරයි.
- නිර්මාණවල මාධ්‍ය හා ශිල්පක්‍රම සොයා බලයි.
- මුරගල, කොරවක්ගල හා පියගැට පෙළ යන නිර්මාණ සංසන්දනාත්මක ව අගය කරයි.
- නිර්මාණවල ඇති කලාත්මක අංග නව නිර්මාණ සඳහා භාවිත කරයි.
- තම අත්දැකීම් විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම් :**
- ඇමුණුම 7.1.2.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.2.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- මුරගල, කොරවක් ගල, පියගැට පෙළ සහිත ඡායාරූප
- ඩිමයි කොළ ෆෙල්ට් පෑන්
- පිටු පෙරළනය

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 7.1.2.1 :**
- මුරගල, කොරවක් ගල, පියගැට පෙළ සහිත ඡායාරූප ප්‍රදර්ශනය කරන්න.
- ඡායාරූප පිළිබඳ ව සිසු අදහස් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.1.2.3 :**
- සිසුන් කණ්ඩායම් තුනකට බෙදන්න.
- ඇමුණුම 7.1.2.1ට අදාළ කාර්ය පත්‍රිකාවේ විශාල කරන ලද පිටපතක් ප්‍රදර්ශනය කරන්න.
- ඇමුණුම 7.1.2.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන් අතර බෙදාදෙන්න.
- ඩිමයි කඩදාසි ෆෙල්ට් පෑන් බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාව ඇසුරින් සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 7.1.2.3 :**
- සිසුන් විසින් කරන ලද නිමැවුම් ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- සදොස් තැන් නිදොස් කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
- එකිනෙක නිර්මාණ අතර සබඳතාව විග්‍රහ කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.2.1 හා ඇමුණුම 7.1.2.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ඓතිහාසික වාස්තුවිද්‍යා නිර්මාණ ආශ්‍රිත ව මුරගල, කොරවක්ගල හා පියගැටපෙළ නිර්මාණ අංග අධ්‍යයනය කිරීම
- නිර්මාණවල මාධ්‍ය හා ශිල්පක්‍රම සොයා බැලීම
- මුරගල, කොරවක්ගල, පියගැට පෙළ යන නිර්මාණ සංසන්දනාත්මක ව අගය කිරීම
- නිර්මාණ වල ඇති කලාත්මක අංග නව නිර්මාණ සඳහා භාවිත කිරීම
- තම අත්දැකීම් විස්තර කිරීම

**ඇමුණුම 7.1.2.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ඡායාරූප හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් කරුණු ඇතුළත් වන පරිදි මුරගල කොරවක් ගල පියගැටපෙළ පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් පිළියෙළ කරන්න.

1. මුරගල, කොරවක් ගල, පියගැට නිර්මාණය සඳහා භාවිත කළ මාධ්‍ය
2. යොදාගත් විවිධ කැටයම්
3. නිර්මාණය කර ඇති ස්ථාන
4. කලාත්මත වටිනාකම

- නිර්මාණය කළ ලිපියේ අඩංගු කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- ගුරුතුමා-ගුරුතුමියගේ සහය ලබා ගන්න.

ඇමුණුම 7.1.2.2

# කියවීම් පත්‍රිකාව

## මුරගල

- පූජනීය ස්ථානයකට පිවිසෙන පඩි පෙළ පාමුල සඳකඩ පහණට දෙපසින් ඇති කැටයම් සහිත ගල් පුවරුව මුරගල නමින් හැඳින්වේ.
- කොරවක් ගල සඳහා ආධාරකයක් ලෙසත් පියගැට පෙළෙහි සවි ශක්තිය උදෙසාත් මුරගල යොදාගෙන ඇති බව දැක්වේ.
- කැටයම් රහිත ගල් පුවරුවක් ලෙස ආරම්භ වූ මුරගල ක්‍රමයෙන් විවිධ කැටයමින් අලංකාර වී ඇත.
    1. කැටයම් රහිත පුවරුව
    2. පුන්කලස සහිත මුරගල
    3. බහිරව රුව සහිත මුරගල
    4. නාග රුව සහිත මුරගල
    5. නා රජු සහිත මුරගල

- අනුරාධපුර යුගයේ විවිධ කැටයම් සහිත ව විකාශනය වූ මූරගල පසු ව එම කැටයම් සියල්ල සංකලනය කරමින් නා රජ රූපය සහිත ව ඉතා උසස් කලා ලක්ෂණ සහිත ව නිර්මාණය වීම සිදු වී ඇත.
- විවිධ අවස්ථාවල මුරගල කළුගල්, ගඩොළු හා බදාම යන මාධ්‍ය එක්කර නිර්මාණය කර ඇත.

**විවිධ අවධි අනුව කලාත්මක අතින් උසස් මුරගල් නිර්මාණ**

**අනුරාධපුර යුගය**

රත්නප්‍රාසාදයේ මුරගල

**පොළොන්නරු යුගය**

පොළොන්නරු වටදාගෙයි මරගල



අනුරාධපුරයේ රත්න ප්‍රාසාද මුරගල



පොළොන්නරුවේ වටදාගෙයි මුරගල

## කොරවක් ගල

- පූජනීය ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට පිවිසෙන පඩි පෙළ දෙපස අත්වැලක් සේ යෙදූ සුවිසල් ගල් පුවරු දෙක කොරවක් ගල නමින් හැඳින්වේ.
- කොරවක් ගල, මකර කටකින් විහිදී ගිය ඇත් සොඬක්, දිය රළක්, ගිනිසිළුවක් ආකාරයෙන් නිමවා ඇත.
- මකර කට තුළින් විහිදී යන රිද්මානුකූල දිය රැල්ලක (ඇත් සොඬ - ගිනිසිළුව) සියුම් ව කැටයම් කර ඇති අයුරින් අගනා කලා නිර්මාණයක් බවට පත් ව ඇත.
- කොරවක්ගලේ කැටයම් සඳහා සිංහ රූප, මකර රූප, ගජසිංහ රූප, කාන්තා රූප යනාදිය භාවිත කර ඇත.
- අනුරාධපුර, පොළොන්නරු යුගවල දී කළුගලින් නිර්මිත කොරවක් ගල ගම්පොළ මහනුවර යුගවල දී ගඩොළු බදාම භාවිතයෙන් නිමවා ඇත.
- අනුරාධපුර, පොළොන්නරු යුගවල දී කොරවක් ගලින් මකර සංකල්පය නිරූපණය වූ අතර මහනුවර, ගම්පොළ යුගවල දී ගජසිංහ සංකල්පයට හැරුණු බවක් පෙනේ.
- පඩි පෙළේ පඩි ප්‍රමාණයට ගැළපෙන පරිදි කොරවක් ගලේ දිග පළල තීරණය විය.

### විවිධ අවධි අනුව කලාත්මක අතින් උසස් කොරවක් ගල් නිර්මාණ

**අනුරාධපුර යුගය**

- රත්නප්‍රාසාදයේ කොරවක් ගල

**පොළොන්නරු යුගය**

- පොළොන්නරු වටදා ගේ කොරවක් ගල්

**ගම්පොළ යුගය**

- ගඩලාදෙණිය විහාරයේ කොරවක් ගල



රත්නප්‍රාසාදයේ කොරවක් ගල



පොළොන්නරු වටදා ගේ කොරවක් ගල



ගඩලාදෙණිය විහාරයේ කොරවක් ගල

## පියගැට පෙළ

- පහළ මළුවකින් ඉහළ මළුවකට නැඟීම සඳහා ඇති මාර්ගයක ඇති අවශ්‍ය ම අංගය පඩි පෙළ හෙවත් පියගැට පෙළ යි.
- සඳකඩ පහණ, මුරගල, කොරවක් ගල, යන අංග එකිනෙකින් සම්බන්ධ කරන අංගයක් වශයෙන් පියගැට පෙළ හඳුන්වා දිය හැකි ය.
- මුල්කාලීන ව කැටයම් රහිත ව නිර්මාණය වූ පියගැට පෙළ පසු ව විසිතුරු මෝස්තරවලින් අලංකාර විය.
- පඩි පෙළ නැඟීමට සඳකඩ පහණ වෙත පැමිණෙන්නකුට පියගැටවල ඉදිරිපස මැනවින් දර්ශනය වේ. එම නිසා එම ඉඩකඩ කැටයම් සඳහා භාවිත කොට තිබේ.
- වාමන රූප, වජ්‍ර සංකේත, පළාපෙති, ලියවැල් ආදිය පියගැට පෙළ අලංකාරයට යොදා ගෙන ඇත.
- අනුරාධපුර බිසෝ මාළිගයේ පියගැට පෙළ වජ්‍ර හා වාමන රූපවලින් සරසා තිබේ.
- පොළොන්නරුව වටදාගෙයි පියගැට පෙළ සමීප පෙළට සිටින වාමන රූප රාශියක් දක්නට ලැබේ.
- විෂ්ණු දේවාලයයේ පියගැට පෙළ විවිධ ලියවැල් මල් මෝස්තරවලින් අලංකාර කර තිබේ.
- ශ්‍රී ලංකාවේ තිබෙන මෙම විශිෂ්ට කැටයම් සහිත පියගැට පෙළ සහිත නිර්මාණ කළුගල් මාධයෙන් නිම කර ඇත.



අනුරාධපුර බිසෝ මාළිගයේ පිටගැට පෙළ



පොළොන්නරු වටදාගෙයි පියගැට පෙළ



මහනුවර විෂ්ණු දේවාලයයේ පියගැට පෙළ

**නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතාව මට්ටම 7.1 : ඓතිහාසික ගෘහ නිර්මාණ ආශ්‍රිත කලා අංග අගය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.3 : ''වාහල්කඩ හා වටදාගෙය නිර්මාණ අගයමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- වාහල්කඩ හා වටදාගෙය විස්තර කරයි.
- වාහල්කඩ හා වටදාගෙයි ඇති නිර්මාණ කලා ලක්ෂණ අගය කරයි.
- ස්තූපයේ ආරක්ෂාවට ශක්තියට හා අලංකාරයට ඉදි කර ඇති බව අනාවරණය කර ගනී.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් නිවැරදි තොරතුරු අනාවරණය කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 7.1.3.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- වාහල්කඩ හා වටදාගෙයට අදාළ ඡායාරූප
- විවිධ යුගවල සඳකඩ පහණ දැක්වෙන පට හා වීඩියෝ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.1.3.1** :
- වාහල්කඩ හා වටදාගෙය සහිත ඡායාරූප ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණය පිළිබඳ සිසු අදහස් විමසන්න.
- ලංකාවේ දැනට ඇති වාහල්කඩ හා වටදාගෙවල් පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- වාහල්කඩ හා වටදාගෙයි කැටයම් සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.1.3.2** :
- ඇමුණුම 7.1.1.3ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන් අතර බෙදා දෙන්න.
- ඇමුණුම 7.1.3.2ට අදාළ කාර්ය පත්‍රිකාවේ විශාල කරන ලද පිටපතක් ප්‍රදර්ශනය කරන්න.
- ප්‍රශ්න තම සටහන් පොතෙ සටහන් කරගෙන කියවීම් පත්‍රිකාවලට පිළිතුරු සැපයීමට යොමු කරවන්න.

(මිනිත්තු 40 යි)

**පියවර 7.1.3.3** :
- සුදුසු ක්‍රමවේද භාවිත කර පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සදොස් පිළිතුරු නිදොස් කර සමස්ත ප්‍රශ්නාවලියට නිවැරදි පිළිතුරු සපයා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.3.1 හා ඇමුණුම 7.1.3.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- වාහල්කඩ හා වටදාගෙය යනු කුමක් දැයි හඳුනා ගැනීම
- වාහල්කඩ හා වටදාගෙයි ඇති නිර්මාණ කලා ලක්ෂණ අගය කිරීම
- ස්තූපයේ ආරක්ෂාවට ශක්තියට හා අලංකාරයට ඉදි කර ඇති බව අනාවරණය කර ගැනීම

**ඇමුණුම 7.1.3.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති වටදාගෙවල් හා වාහල්කඩ ඡායාරූප හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. වාහල්කඩ යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
02. වාහල්කඩෙහි නිර්මිත සත්ත්ව රූප මොනවා ද?
03. කලාත්මක අතින් උසස් ම වාහල්කඩ ඇති ස්ථානය නම් කරන්න.
04. දැනට සුරක්ෂිතව ඇති පොළොන්නරු යුගයට අයත් වාහල්කඩක් නම් කරන්න.
05. වාහල්කඩ හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
06. වටදාගෙය යනු කුමක් ද?
07. ශ්‍රී ලංකාවේ ඉදිවූ මුල් ම වටදාගෙය කුමක් ද?
08. වටදාගෙය ඉදි කරනු ලබන්නේ ප්‍රමාණයෙන් විශාල චෛත්‍ය සඳහා ද කුඩා චෛත්‍ය සඳහා ද?
09. දැනට ලංකාවේ දක්නට ලැබෙන වටදාගෙය කිහිපයක් නම් කරන්න.
10. වාහල්කඩ හා වටදාගෙය නිර්මාණය සඳහා යොදාගන්නා මාධ්‍ය නම් කරන්න.

**ඇමුණුම 7.1.3.2**

## කියවීම් පත්‍රිකාව

**වාහල්කඩ**

- දාගැබේ සතර දිසාවේ දාගැබට සම්බන්ධ ව තැනූ සුවිශේෂ ගෘහ නිර්මාණ විශේෂයක් ලෙස හැඳින්විය හැකි ය.
- වාහල්කඩ ආයක, ආයික යන නම්වලින් හඳුන්වා ඇත.
- දාගැබේ ශක්තිමත් බව හා දාගැබ අලංකාරයට එක් කළ නිර්මාණයක් වශයෙන් සැලකේ.
- දාගැබේ සිවු දිශාවෙහි මල් ආසන හා සම්බන්ධ වන ලෙස මෙය නිර්මාණය කර තිබේ.
- වාහල්කඩෙහි පාදම කොටස ගලෙන් නිර්මාණය කොට ඇති අතර ඉහළ කොටසේ ඇති විමාන නිර්මාණය කොට ඇත්තේ ගඩොළිනි.
- ගලින් ඉදිවූ පහළ කොටසෙහි බොරදම් තීරු ගණනාවක් ඇත. මෙම බොරදම් තීරු ඇත්, මකර, වාමන, හංස ආදිය රූපවලින් කැටයම් කර ඇත.
- ඇතැම් වාහල්කඩවල ගඩොළින් ඉදි කළ කොටසෙහි විමාන තුනක් දක්නට ඇති අතර ඒ තුළ බුද්ධ රූප හා දේව රූප තැන්පත් කර තිබූ බව අනුමාන කෙරේ.
- වාහල්කඩ දෙපස විසිතුරු කැටයම් සහිත ගල් ටැම් දක්නට ලැබේ. මේවා කල්පලතා, කල්ප වෘක්ෂ හා නිදහස් සත්ත්ව මෝස්තර ඇසුරින් අලංකාර කර ඇත.
- මෙම ගල් ටැම් මත ඇත්, අස්, ගව, සිංහ යන රූප නිමවා ඇත. මින් සිවු දිසාව සංකේතවත් වන බව අදහස් කෙරේ.


**විවිධ අවධිවලට අයත් උසස් ලක්ෂණ සහිත වාහල්කඩ නිර්මාණ**

**අනුරාධපුර යුගය**

- මිහින්තලයේ කණ්ඨක චේතියේ වාහල්කඩ

**පොළොන්නරු යුගය**

- රන්කොත් වෙහෙරේ වාහල්කඩ



මිහින්තලයේ කණ්ඨක චේතියේ වාහල්කඩ



රන්කොත් වෙහෙරේ වාහල්කඩ

## වටදාගෙය

- දාගැබක ආරක්ෂාව පිණිස දාගැබ වටා ඉදි කරන ලද ගෘහය වටදාගෙය ලෙස හැඳින්වේ.
- ථූපඝරය, චේතියඝර, සෑගෙය යන නම්වලින් ද ව්‍යවහාර කර ඇත.
- ශ්‍රී ලාංකික බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයේ තවත් සුවිශේෂ නිර්මාණයක් වන වටදාගෙය කුඩා දාගැබ් සඳහා ඉදි කර ඇති බවට සාධක හමුවේ.
- දාගැබ වටා නංවන ලද කුලුනු මත වටදාගෙයි වහලය රඳවා තිබූ බව සැලකේ.
- වෘත්තාකාර ගෘහයක් වූ මෙහි වහලය දාගැබට අනුරූප ව එයට ආවරණයක් වන සේ නිර්මාණය කර තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය.
- වහලය දරා සිටින ගල් කණු ඉතා සියුම් කැටයමින් අලංකාර කර තිබේ.
- ශ්‍රී ලංකාවේ ඉදි වූ මුල් ම වටදාගෙය ථූපාරාම වටදාගෙය යි.

**විවිධ අවධිවලට අයත් උසස් කලාත්මක ලක්ෂණ සහිත වටදාගෙය නිර්මාණ**

**අනුරාධපුර යුගය**

- තිරියාය වටදාගෙය

**පොළොන්නරු යුගය**

- මැදිරිගිරියේ වටදාගෙය
- පොළොන්නරුවේ වටදාගෙය



ථූපාරාමයේ වටදාගෙය



තිරියාය වටදාගෙය



මැදිරිගිරියේ වටදාගෙය



පොළොන්නරුවේ වටදාගෙය

**නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2 : දේශීය සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර භාවිත කරමින් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.1 : ''කාන්තා රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ අගයමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- කාන්තා රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ නම් කරයි.
- කාන්තා රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි යම්කිසි බාහිර හැඩයකට අනුව නිර්මාණය වී ඇති බව හඳුනා ගනියි.
- එවැනි නිර්මාණ දැකිය හැකි ස්ථාන හා කලා නිර්මාණ විස්තර කරයි.
- එම නිර්මාණවල ඇති කලාත්මක ලක්ෂණ අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්
- ජ්‍යාමිතික උපකරණ
- ඇමුණුම 7.2.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.1.1** :
- කාන්තා රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි ඒකක සහිත පින්තූර ප්‍රදර්ශනය කරන්න.
- එම පින්තූර නැරඹීමට සිසුන් යොමු කරවන්න.
- එක් එක් රූපවල ඇති විශේෂ ලක්ෂණ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- මෙම නිර්මාණ ලී කැටයම්, ඇත් දත් කැටයම්, හා සාම්ප්‍රදායික සිතුවම් ආදියේ දැකිය හැකි බව පෙන්වා දෙන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.2.1.2** :
- ඇමුණුම 7.2.1.1.ට අදාළ කාර්ය පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- ඇමුණුම 7.2.1.2.ට ඇතුළත් කියවීම් පත්‍රිකා පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- කියවීම් පත්‍රිකා ඇසුරු කර ගනිමින් වගුව පිරවීමට සිසුන්ට උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 40 යි)

**පියවර 7.2.1.3** :
- තමා පිරවූ වගුව ඉදිරිපත් කිරීමට අහඹු ලෙස තෝරා ගත් සිසුන් කිහිප දෙනෙකුට අවස්ථාව ලබා දෙන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ ව සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.1.1 හා ඇමුණුම 7.2.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- කාන්තා රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ නම් කිරීම.
- කාන්තා රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි යම්කිසි බාහිර හැඩයකට අනුව නිර්මාණය වී ඇති බව හඳුනා ගැනීම.
- එවැනි නිර්මාණ දැකිය හැකි ස්ථාන හා කලා නිර්මාණ විස්තර කිරීම.
- එම නිර්මාණවල ඇති කලාත්මක ලක්ෂණ අගය කිරීම.

**ඇමුණුම 7.2.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ඡායාරූප හොඳින් අධ්‍යයනය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරු කර ගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සැරසිලි මෝස්තරය | නිරූපිත හැඩය | යොදාගෙන ඇති කාන්තා රූප ගණන | දක්නට ලැබෙන ස්ථාන |
|---|---|---|---|
| | | | |

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.2.1.2

# කියවීම් පත්‍රිකාව

- කාන්තා රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ පිළිබඳ ව මෙහිදී අවධානය යොමු කෙරේ.
- සොබාදහමේ සිටින සතෙකු හෝ යම්කිසි භාණ්ඩයක හෝ හැඩය කාන්තා රූප ඇසුරින් සම්පිණ්ඩනය කර ඇත.
- මේවා පාරම්පරික බිතුසිතුවම් හා කැටයම් අතර දක්නට ලැබේ.

## චතුර්නාරි පල්ලැක්කිය




- කාන්තාවන් හතර දෙනෙකුගේ රූ පල්ලැක්කියක (දෝලාවක) හැඩයට සම්පිණ්ඩනය කොට කරන ලද නිර්මාණය චතුර්නාරි පල්ලැක්කිය නම් වේ.
- දළදා මාළිගයේ උඩුමහලේ වියනේ දකුණු පස ඇති සෘජුකෝණාස්‍රාකාර තීරයක චතුර්නාරි පල්ලැක්කියක් නිර්මාණය කර තිබේ.
- ස්ත්‍රී රූප දෙකක් කකුල් පටලවා දැත් දිගුකොට සිටින ආකාරයක් නිරූපිත ය. පල්ලැක්කිය ඇතුළේ එහි ගමන් කරන නෙළුම් මලක් අතින් ගත් දෙවි කෙනෙකු හෝ බෝසත් කෙනෙකු දැකිය හැකි ය.

## සප්තනාරී පල්ලැක්කිය



- කාන්තාවන් හත් දෙනෙකුගේ රූප පල්ලැක්කියක ආකාරයෙන් සම්පිණ්ඩනය කොට නිර්මාණය කරන ලද සැරසිලි මෝස්තරය සප්තනාරී පල්ලැක්කිය නම් වේ.
- දළදා මාලිගයෙහි මෙම සිතුවම දක්නට ලැබේ.

## පංචනාරී ඝටය



- කාන්තාවන් පස් දෙනෙකුගේ රූප කළයක හැඩයට සම්පිණ්ඩනය කොට කරන ලද නිර්මාණයකි.
- පාරම්පරික කලා කර්මාන්ත අතර බහුල ව දක්නට ලැබෙන මෙම මෝස්තරය ඇත්දත් කැටයම් අතර සුලබ ව දැකිය හැකි ය.
- පංචනාරී ඝටය නම් මෝස්තරය සශ්‍රීකත්වයේ සංකේතයක් වශයෙන් ව්‍යවහාර වන්නට ඇති බව මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා පෙන්වා දෙයි.
- රිදී විහාරයේ දොරට සවි කොට තිබූ ඇත් දතින් කැටයම් කළ පංචනාරී ඝටය ඉතා විශිෂ්ට නිර්මාණයකි.
- මහනුවර දළදා මාළිගය ඇතුළු පෞරාණික වෙහෙර විහාර රැසක පංචනාරී ඝටය සිතුවමට හා කැටයමට නඟා තිබේ.


## සප්තනාරී රථය



- කාන්තාවන් හත් දෙනෙකුගේ රූප යොදාගෙන නිර්මාණය කර ඇති රථය සප්තනාරී රථය නමින් හැඳින්වේ.

• පිටුපසට කරකැවී දෑතින් දෙපය අල්ලාගෙන සිටින සේ නිර්මාණය කරන ලද කාන්තා රූප දෙකකින් රෝද නිර්මාණය කර ඇත.
• රථය මුදුනේ ඔටුන්නක් පැලැඳි කාන්තාවක් දෑතින් දෙපසට විහිදෙන සීන මල් දෙකක් දරා සිටී. රථය මැද පත්තිනි දේවිය වැඩ හිඳී.
• මහනුවර දළදා මාළිගයේ චිත්‍ර අතර සප්තනාරී රථය දැකිය හැකි ය.

## නවනාරී කුඤ්ජරය




පවර රුසිරු නුවණෙහි මහිම ඇන්දේ
නොහැර මල් මදා රති යුග පබැන්දේ
රුසිරු ලියෝ නවදෙන ගජතු මැද්දේ
සිහි කර නව නාරි කුඤ්ජරය ඇන්දේ

• නවනාරි කුඤ්ජරය දක්වෙන සිතුවමක් දළදා මාලිගාවේ පිටමාලයේ සිවිලිම මත දක්නට ඇත.

## නාරිලතා මල

• සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර අතර නාරිලතා මල ලියවැලක් වශයෙන් යෙදේ .
• නාරිලතා මල සුකොමළ නාරිදේහය සිත්කලු උඩුකය පිපුණු මලක් ලෙස උඩට නෙරා සිටින සේ යොදා ඇත.
• ආරණ්‍යගත තාපසයන්ගේ ශීලය පවා බිඳීමේ අයස්කාන්ත බලයක් මෙම පුෂ්පය සතු ව ඇති බව පැවසේ.
• නාරිලතා මලෙහි කාන්තා රුවට විචිත්‍ර ලෙස ආභරණ පවා පළඳවා ඇත.
• නාරිලතා මල් සහිත චිත්‍ර රසක් පුරාණ විහාර දේවාලය ආශ්‍රිත ව හමු වේ.
• ඇම්බැක්ක දේවාලයයේ ලී කැටයම් අතර නාරිලතා මලක කැටයමක් දැකිය හැකි ය.
• දළදා මාළිගයේ ඇඳ ඇති නාරිලතා මල් එකිනෙකට වෙනස් වූ නිර්මාණ සම්පිණ්ඩනයක් වීම විශේෂත්වයකි.



නාරිලතා මල

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **දේශීය සම්ප්‍රදායික සැරසිලි මෝස්තර භාවිත කරමින් නිර්මාණකරණයේ යෙදෙයි.**

**ක්‍රියාකාරකම 7.2.2** : **''සත්ත්ව රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි අධ්‍යයනය කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- සත්ත්ව රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ නම් කරයි.
- ඒවායේ ඇති කලාත්මක ලක්ෂණ අගය කරයි.
- එම නිර්මාණවල ඇති සුවිශේෂතාව පැහැදිලි කරයි.
- එම නිර්මාණ ඇති ස්ථාන නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්
- ජ්‍යාමිතික උපකරණ
- පැන්සල්
- ඇමුණුම 7.2.2.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.2.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.2.1** :
- වෘෂභ කුඤ්ජරය, කිහිඹි මුහුණ, මකර රුව, යාලි රුව සහිත පින්තූර ප්‍රදර්ශනය කිරීම.
- මීට පෙර එවැනි නිර්මාණ දැක ඇති ස්ථාන පිළිබඳ ව සිසු අදහස් විමසීම.
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදීම.

(මිනිත්තු 10 යි)

**පියවර 7.2.2.2.** :
- ඇමුණුම 7.2.2.1ට අදාළ කාර්ය පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- ඇමුණුම 7.2.2.2ට ඇතුළත් කියවීම් පත්‍රිකා පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- ප්‍රශ්න සහිත ඩිමයි කඩදාසිය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- කියවීම් පත්‍රිකා ඇසුරු කර ගනිමින් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 40 යි)

**පියවර 7.2.2.3** :
- සිසුන් විසින් සපයන ලද පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.3.1 හා ඇමුණුම 7.2.3.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- සත්ත්ව රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ නම් කිරීම.
- ඒවායේ ඇති කලාත්මක ලක්ෂණ අගය කිරීම.
- එම නිර්මාණවල ඇති සුවිශේෂතාව පැහැදිලි කිරීම.
- එම නිර්මාණ ඇති ස්ථාන නම් කිරීම.
- මෙම නිර්මාණ මඟින් පැරණි නිර්මාණ ශිල්පියාගේ රූප සම්පිණ්ඩනය අධ්‍යයනය කිරීම.

**ඇමුණුම 7.2.3.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ඡායාරූප හොඳින් අධ්‍යයනය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරු කර ගනිමින් හා පහත කරුණු ඔස්සේ එක් එක් සත්ත්ව රූප පිළිබඳ විස්තරයක් ලියා දක්වන්න.
    - නිරූපිත සත්ත්ව සැරසිල්ලි සඳහා භාවිත සත්ත්ව රූප/හැඩ
    - සමස්ථ හැඩය සංකලනය කර ඇති අකාරය
    - එම සත්ත්ව සැරසිලි භාවිත කර ඇති ස්ථාන/අවස්ථා
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.2.3.2

## කියවීම් පත්‍රිකාව

- වෘෂභ කුඤ්ජරය, කිහිඹි මුහුණ, මකර රූව හා යාලි රූව යනාදී සුවිශේෂී සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කෙරේ.
- මෙම සැරසිලි නිර්මාණ බොහොමයක් සත්ත්ව රූප ඇසුරින් නිර්මාණය කර ඇත.
- පැරණි බිතුසිතුවම් ,කැටයම් අතර මෙම සුවිශේෂ නිර්මාණ දක්නට ලැබේ.
- දකුණු ඉන්දීය දේවාලය ආශ්‍රිත ව හමුවන යාලි රූව ශ්‍රී ලංකාවේ මකර රූවට බෙහෙවින් සමානත්වයක් දරයි.
- මෙම නිර්මාණ මඟින් පැරණි නිර්මාණ ශිල්පියාගේ රූප සම්පිණ්ඩනය පිළිබඳ ඥානය හෙළිවේ.


වෘෂභ කුඤ්ජරය



ඇතුට පොරට ගොනු අර ඇද සිටින්නා
මුඛය පත් විදා මොල්ලිය අඳින්නා
ඇතුගෙ දත් දෙකයි ගොනු අඟට වන්නා
වෘෂභ කුඤ්ජරය අඳු ලකුණු දන්නා

- මුහුණට මුහුණ ලා සිටි ඇතකුගේ ත් ගොනකුගේ ත් හිස් එකට සම්පිණ්ඩනය වන සේ වෘෂභ කුඤ්ජරය නිර්මාණය කර ඇත.
- ගොනාගේ අං දෙක ම ඇතාගේ දළ දෙක වශයෙන් යොදා ඇත. ඇතාගේ හොඬවැල ගොනාගේ මොල්ලිය ලෙස පෙනේ. සතුන් දෙදෙනාගේ ම ඇස් එක ය.
- මෙම නිර්මාණයෙන් එකල ශිල්පියාගේ නිර්මාණාත්මක හැකියාව මනාව පෙනේ.
- කුරුණෑගල රිදී විහාරය, මහනුවර දළදා මාළිගය, ඇම්බැක්ක දේවාලය ආදී ස්ථානවල වෘෂභ කුඤ්ජර චිත්‍ර හා කැටයම් දක්නට ලැබේ.
- දෝව රජමහා විහාරයේ වෘෂභ කුඤ්ජරය දක්වා ඇත්තේ බිහිසුණ ලෙස සටන් වැදී සිටින ඇතකු හා ගවයකු ලෙස ය.

## කිහිඹි මුහුණ




•කීර්ති මුඛ යනුවෙන් ද හැඳින්වෙන්නේ කිහිඹි මුහුණ යි.
•මකර තොරණෙහි දෙපස ඇති මකර රූප දෙක මැදින් කිහිඹි මුහුණ පිහිටයි.
•කිහිඹි මුහුණෙහි කට විශාල ය. රතු තොල් සහිත ය.
•දෙපස දළ දෙක සමඟ දෙපසට විහිදී කරකැවී ගිය අලංකාර ලියපත් නිර්මාණයකි. විශාල දෙනෙත් පහතට නැඹුරුව විශාල ව ඇත.
•කිහිඹි මුහුණ පිළිබඳ ව විවිධ මිථ්‍යා ප්‍රබන්ධ රාශියක් ඇත.

## මකර රුව



ඇත් සොඬ සිහ පා යුග කන් ඌරා
දත් පෙළ කිඹුලු ය යුග නෙත් වඳුරා
වෙත් මසු ඇඟ ගුරුළුගෙ පිය පතරා
යුක්ත ය මේ හැමගෙන් රුව මකරා

- ඇතකුගේ සොඬවැල ය. සිංහයකුගේ පාද ය. කිඹුලකුගේ දත් ය. වඳුරකුගේ ඇස් ය. ඌරාගේ කන් ය. මත්ස්‍ය ශරීරය ය. ගුරුලාගේ පියාපත් ය. මේ මකරාගේ ස්වභාවය යි.
- ඇතාගේ බලය පෙන්වන්නේ හොඬවැලෙනි. සිංහයා ඉදිරිපස ගාත්‍රාවලිනි. කිඹුලා දත්වලිනි. ගුරුලා සිය පියාපත්වලිනි. ඌරාගේ කන් වඳුරාගේ ඇස් ඉතා තියුණු ය. මේ අනුව මකර රුවෙන් සතුන් හත් දෙනෙකුගේ බලයේ එකතුවක් නිර්මාණය වෙයි.
- මකර සංකල්පය ග්‍රීසිය, චීනය, භාරතය යන ආදි ම ශිෂ්ටාචාරවල පවා ප්‍රචලිත ව පැවත තිබේ.
- මකර කැටයම් බහුල ව හමු වන්නේ කොරවක් ගල් හා දොර උළුවහුවල ඇති මකර තොරණවල ය.



කිහඹි මුහුණ සහ මකර රූ සහිත තොරණ

# යාලි රුව





- යාලි යනු පුරාණෝක්තිගත නිර්මාණාත්මක සත්ත්වයෙකි.
- බොහෝ හින්දු කෝවිල්වල මෙය දැකිය හැකි ය.
- බොහෝ විට මෙය ස්තම්භ හෝ කුලුනු මත ආධාරක මූර්තියක් ලෙස නිර්මාණය කර තිබේ.
- යාලි රූපය නිර්මාණය කිරීම සඳහා හස්තියා, සිංහයා, අශ්වයා යනාදි සතුන්ගේ කොටස් භාවිත කර ඇත.
- විවිධ ස්ථානයන්හි සතුන් දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ වශයෙන් විවිධ සත්ත්ව කොටස් එකතු කර කල්පිත රූපයයක් ලෙස යාලි නිර්මාණය කර ඇත.
- යාලි රුව යෙදීම මඟින් කෝවිලක ආරක්ෂාව සංකේතවත් විය. එම සතුන්ගේ ශක්තිවන්ත බලසම්පන්න ස්වභාවය මඟින් එය තව දුරටත් තහවුරු වී ඇත.
- කෝවිල් ආශ්‍රිත කලා නිර්මාණයක් වන මණ්ඩපම්හි අලංකාර යාලි රූප දැකිය හැකි ය.
- යාලි බොහෝ පෞරාණික නිර්මාණයක් වුවත් කලා නිර්මාණයක් ලෙස වැඩි වශයෙන් යොදාගෙන ඇත්තේ දකුණු ඉන්දීය මූර්ති කලාව තුළ යි.

**11 ශ්‍රේණි ගුරු මාර්ගෝපදේශයේ නිවැරදි කිරීම්**

| පිටු අංකය | පෙළ | වැරදි | නිවැරදි |
|---|---|---|---|
| 93 | 12 | රැළි රහිත | රැළි රහිත යන වචනය ඉවත් කරන්න. |
| 150 | 15 | නෙළුම | බිනර මල තීරුව ඉවත් විය යුතුය.<br>10 පොතෙහි නෙළුම නිවැරදිය. |